# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,885 — 1969 දෙසැම්බර් 19 වැනි සිකුරාද — 1969.12.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාගයකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු | 1995 | කොටුපල් ටෙන්ඩර් හා වෙනත් ටෙන්ඩර් විකිණීම | 2039 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය | 2008 | ආණ්ඩුවේ නොවන දැන්වීම් | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම | 2010 | රට නීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම | — |
| බඩු බාහිරාදිය විකිණීම | 2038 | විවිධ දැන්වීම | — |


සැලකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ V වැනි කොටසේ කුලී මෝටර් රථ සේවාවන් සඳහා මගීන් ගෙනයාමේ අවසර පත් ඉල්ලීමේ අයදුම්පත් ලැයිස්තුවක් ද පළවේ.

## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිසන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය ආංශික සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දමිත් පැ ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා සේ දෙකෙන් කවරක් ගෙවීමත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නිර්ණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවයෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද හැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත් නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 38 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

(iii) (අ) ඔවුන් ස්වකීය රාජකාරි කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අත්‍යවශ්‍යක නොවන්නාවූ අති විශේෂ අවස්ථාවන් හිදී හැර

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් භාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. පූර්වෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය.
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

(ආ) ගිවිසුමේ කොන්දේසි සපුරාලීමට නොහැකි වුවහොත් පාඨමාලාව සම්බන්ධව වැය වූ මුළු මුදල, එනම්, ලංකා ආණ්ඩුව සහ/හෝ වෙන යම් ප්‍රදානය කරන සංස්ථාවක් විසින් වැය කරන ලද මුළු වියදම් (එනම් වැටුප්, දීමනාවන්, නැව් ගාස්තු, ගාස්තු ගෙවීම් ආදිය) ආපසු ගෙවීමට බැඳී සිටීම.

(iv) සහකාර විදුලි සංදේශ ඉංජිනේරු තනතුරේ සේවය ස්ථිර කිරීමට අනිකුත් දේ අතර පුහුණුවීමේ පාඨමාලාව සාර්ථක ලෙස අවසන් කිරීම (එම පුහුණුව, පත්වීමේ දින සිට තුන් අවුරුදු කාලය තුළ සලසා එම කාලය තුළදී අවසන් කර ඇති විටදී) මත රඳා පවතියි.

(v) ආධුනික කාලය තුළ ඕනෑම අවස්ථාවකදී නිලධාරියෙකුගේ හොඳ කල්ක්‍රියාව සම්බන්ධයෙන් හෝ රාජකාරියෙහි ව්‍යාවෘතවීම සම්බන්ධයෙන් හෝ සේවයෙහි ස්ථිර කිරීම සඳහා නියමිත කොන්දේසි සපුරාලීමට අපොහොසත් වීම නිසා හෝ පෝස්ට්මාස්ටර් ජනරාල්වරයාට සෑහීමකට පත් කළ නොහැකි වුවහොත්, සේවය නතර කළ හැක.

3. **වැටුප් ක්‍රමය.**—මේ තනතුරට අදාල වැටුප් ක්‍රමය නම්: රු. 9,600 සහ රු. 13,920 යන වාර්ෂික වැටුප් වලට පළමු කාර්යක්ෂමතා කඩඉම් ද සහිත රු. 7,800—3 × 360—8,880/9,600—4 × 360—11 × 480—රු. 16,320 යන වාර්ෂික වැටුප් ක්‍රමයයි. රු. 13,440 ක වාර්ෂික වැටුප් ඉක්මවා වැටුප් ලැබීමට සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් අවශ්‍ය වේ. සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් ඇති නිලධාරියෙක් රු. 9,960 ක වාර්ෂික වැටුප් පියවර ලැබීමට සුදුසු වෙයි.

රුපියල් 9,600 දරණ වාර්ෂික වැටුප් පියවරට පෙර ඇති කාර්යක්ෂමතා කඩඉමෙන් උසස් කිරීම නියමිත පරීක්ෂණයකින් සමත්වීම මත රඳා පවතී.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින්ම තමාට පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කල යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශරීර සෞඛ්‍යයකින් යුක්ත බව.
(ආ) 1970.1.16 දිනට වයස අවුරුදු 20 නොඅඩු හා අවු. 30 ට නොවැඩි විය යුතුය. සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් ලත් ඉංජිනේරුවන්ගේ උපරිම වයස් සීමාව ලිහිල් කරනු ලැබේ. (රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට ඉහත සඳහන් වයස් සීමාව බලපාන්නේ නැත.)
(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයක විදුලිය ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිධරයෙක් බවට, හෝ
(ඈ) පිළිගත් විශ්ව විද්‍යාලයක විදුලිය ඉංජිනේරු උපාධියට සමාන යයි සලකනු ලබන පිළිගත් ඉංජිනේරු විද්‍යාලයක හෝ ආයතනයක ඩිප්ලෝමා උපාධිය දරන්නෙක් බවට, හෝ
(ඉ) ලන්ඩන් විදුලිය ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ හෝ බ්‍රිතාන්‍ය විද්‍යුත් හා රේඩියෝ ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ හෝ උපාධිධරයෙකු වීම.

**සංලක්ෂ්‍යය.**—විදුලිය ඉංජිනේරු විෂයයන් දෙකකින් සාමාර්ථය ලැබුවාවූද, එම විෂයයන් දෙකෙන් එකක් ඉංජිනේරු උපාධි හෝ ඩිප්ලෝමා උපාධි අවසාන පරීක්ෂණයට ගනු ලැබුවා වූද, ඉංජිනේරු උපාධිය හෝ ඩිප්ලෝමා උපාධිය දරන්නට වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂයෙකුම සූදානම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ.යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතිකය හෝ බව්තීස්ම සහතිකය භාරගනු නොලැබේ.)

(ආ) උපාධිය හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්.

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඉ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ.යු.—(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ පිටපත් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම් පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින්ම තමතමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත් තම ඉල්ලුම්පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙනසේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුයි. ඉල්ලුම්පත්‍ර පෝර්මය සමඟ තමන්ට එවන ලද ("ආ" සලකුණ දරණ). මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝර්මය සමඟ තමතමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල්පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණකොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම්පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූද, අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරිය හොත් අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
තැ. පෙ. 500.

12–752/1—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

අංක ඒබී. 108/එක්ස්. 2169/69.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම නිලධාරිනි (ග්‍රාමීය ගෘහ අර්ථ සංරක්ෂණ ව්‍යාප්ති) තනතුර

අංක 14,888 හා 1969 නොවැම්බර් මස 14 වැනි දිනැති රජයේ ගැසට් පත්‍රයේ පළවූ 1969 ඔක්තෝබර් මස 31 වැනි දින දරන නිවේදනය සම්බන්ධයි.

2. යටකී තනතුර සඳහා මෙරට සහ විදේශීය ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනය 1970 ජනවාරි මස 2 වැනි දින දක්වා දීර්ඝ කර ඇති බව මෙයින් දන්වමි.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර,
මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍යසේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය,
තැ. පෙ. අංක 500.

12–752/2—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

අංකය : ඒ. 87/එක්ස්. 2171/69.

## අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

### මහරගම රජයේ ගුරු විද්‍යාලයේ උප විද්‍යාලයාධිපති තනතුර

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ මහරගම රජයේ ගුරු විද්‍යාලයේ උප විද්‍යාලයාධිපති තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මඟින් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම්පත්‍ර පහත සඳහන් දිනවලට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1970 ජනවාරි මස 16 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1970 ජනවාරි මස 23 වැනිදා.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරි යෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9" × 4" ප්‍රමාණයට කුඩා නොවූද, තම ලිපිනය ලියන ලද්දාවූ ද මුද්දර නොගැසුවාවූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයින්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලාංකික නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළත දී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනීසිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුවෙයි.

2. **සේවයෙහි නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. පත් කරනු ලබන්නා, තෝරා ගැනීමට ප්‍රථම විශ්‍රාම වැටුප් වාර්තාව යටතේ ගුරුවරයෙකු වශයෙන් විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නේ නම් ඔහු මෙම නව තනතුර දරණතාක් කල් එම තනතුර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් බව ප්‍රකාශයට පත් කරනු ලැබේ.

3. **වැටුප් සහ දීමනා.**—මේ තනතුර සඳහා රු. 11,040—7 × 480—රු. 14,400 වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් නියමිතය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින්ම ඔහු පිළිබඳ පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(ඒ) විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බවක්.

(බී) 1970.1.16 වැනි දිනට වයස අවුරුදු 35 ට නොඅඩු බවට හා අවුරුදු 50 නොවැඩි බවට (රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

(සී) උපාධිය ලැබීමෙන් පසු අඩු වශයෙන් අවුරුදු 8 ක ඉගැන්වීමේ පළපුරුද්දක් සහිතව පශ්චාත් උපාධි හෝ එසේ නොවූ ශික්ෂණ විද්‍යාව පිළිබඳ පූර්ණ කාල පුහුණුවක් ලබා ඇති උපාධිධාරීන් විය යුතුය. ගුරුවරුන් පුහුණු කිරීම සහ පරිපාලන කටයුතු සම්බන්ධව පළපුරුද්ද ඇති අපේක්ෂකයන් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. අයදුම්කරුවන්ට සිංහලෙන් වැඩ කිරීම පිළිබඳ ඉතා හොඳ දැනුමක් තිබිය යුතුය. එහෙත් තමා විසින් නිශ්චය කරනු ලබන වර්ෂ ගණනක් ඇතුළත සිංහල පිළිබඳ වැඩිදුර සුදුසුකම් ලබා ගන්නා ලෙස ඕනෑම අයෙකුට නියම කිරීමට අධ්‍යක්ෂවරයාට පුළුවන් වේ. පිළිගත් අධ්‍යාපන ආයතනයක විදුහල්පති හෝ උප විදුහල්පති වශයෙන් හෝ දිස්ත්‍රික් පරීක්ෂකවරයෙකු වශයෙන් ලත් පරිපාලන පළපුරුද්ද අතිරේක සුදුසුකමක් වශයෙන් සලකනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලිවලින් එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතිස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධිය හෝ උසස්ම අධ්‍යාපනික සහතික.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්ට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමග තමන්ට එවන "බී" සලකුණ දරණ මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර ෆෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම් කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණ බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණ බවට දැන්වීමක් නොලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 දෙසැම්බර් මස 12 වැනි දින,
තැ. පෙ. 500,
කොළඹ, ගාලු මුවදොර මහා ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.

12–752/3—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

අංකය : ඒ ඒ. 94/එක්ස්. 2172/69.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### වාරිමාර්ග ඉංජිනේරු තනතුරු (තාවකාලික)

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාරිමාර්ග ඉංජිනේරු (තාවකාලික) තනතුරු සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1970 ජනවාරි මස 16 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1970 ජනවාරි මස 23 වැනිදා.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9" × 4" ප්‍රමාණයට කුඩා නොවූද, තම ලිපිනය ලියන ලද්දාවූ ද මුද්දර නොගැසූවාවූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළත දී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනීසිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුවෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මේ තනතුරු තාවකාලිකය. විශ්‍රාම වැටුප් රහිතය. නිලධාරීන්ගේ වැටුපෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය. මෙම පත්වීම් නිත්‍ය වශයෙන්ම තාවකාලික පදනමක් උඩ වන අතර රජයෙන් හෝ නිලධාරීන් විසින් හෝ එක් මසක දැන්වීමකින් පසු සේවය නතර කළ හැකිය.

3. **වැටුප්.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් පරිමාණය මෙසේ ය :—

(අ) රු. 9,600 හා 13,920 පෙර කාර්යක්ෂමතා කඩඉම්ද සහිතව වර්ෂයකට රු. 7,800—360 × 3—8,880/9,600—360 × 4, 480 × 11—රු. 16,320 දක්වා. (1969.10.1 දිනට පෙර පැවති අනුරූප මූලික වැටුප් ක්‍රමය නම් වර්ෂයකට රු. 5,160—360 × 3—6,240/6,960—360 × 4, 480 × 10—රු. 13,200).

(ආ) සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් (එනම්, එම්.අයි.සී.ඊ.) සහිතව සේවයට බැඳෙන ඉංජිනේරුවන් ඉහත කී වැටුප් පරිමාණයේ වසකට රු. 9,960 ක වැටුප් පියවර මත තබනු ලැබේ.

(ඉ) වර්ෂයකට රු. 9,600 දරණ වැටුප් පියවර ඉක්මවා යාමට පෙර වාරිමාර්ග ඉංජිනේරුවන් විසින් දෙපාර්තමේන්තුවේ කාර්ය සංවිධානය, ගිණුම්, දෙමළ (වාචික) යනාදිය පිළිබඳ නියමිත පරීක්ෂණයකින් සමත් විය යුතුය.

සටහන.—සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් සහිතව (එනම්, එම්.අයි.සී.ඊ.) සේවයට බැඳෙන ඉංජිනේරුවන් පත්වීමේ දින සිට අවුරුදු දෙකක් ඇතුළත මෙම පරීක්ෂණය සමත් විය යුතුය.

(ඊ) ඉහත කී වැටුප් පරිමානයේ රු. 13,440 ක වැටුප් පියවර ඉක්මවා යාමට නම් වාරිමාර්ග ඉංජිනේරුවන් විසින් සම්පූර්ණ වෘත්තීය සුදුසුකම්, එනම් එම්.අයි.සී.ඊ. ලබා ගත යුතුය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(ඒ) විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුතු බව.

(බී) 1970.1.16 වැනි දිනට වයස අවුරුදු 21 ට නොඅඩු එමෙන්ම අවුරුදු 35 ට නොවැඩි බව (උපරිම වයස් සීමාව දැනටමත් රජයේ සේවයේ නියුක්ත වූවන් කෙරෙහි බල නොපානු ඇත.)

(සී) සිවිල් ඉංජිනේරු විෂයයන් සහිතව (ජලශක්ති විද්‍යාව සමග නම් වඩා යෝග්‍යයි) ලංකා විශ්ව විද්‍යාලයෙන් ලබාගත් ඉංජිනේරු උපාධියක් හෝ ඒ සමාන පිළිගත් උපාධියක් දරන්නකු බව නැතහොත් ලංඩනයේ සිවිල් ඉංජිනේරුවන්ගේ ආයතනයෙහි පරීක්ෂණයේ I සහ II කොටස් වලින් හෝ ලංකා ඉංජිනේරු ආයතනයේ සිවිල් ඉංජිනේරු විභාගයේ I වැනි, Iබී වැනි සහ II වැනි කොටස් හෝ ඒ සමාන විභාගයකින් සාමාර්ථයක් ලබා ඇති බව.

**සංලක්ෂ්‍යය.**—නිලධාරියකු විසින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ස්වකීය සේවා කාලය තුළදී ලබා ගත් පළපුරුද්ද සිවිල් ඉංජිනේරු ආයතනයේ සහචර සාමාජිකත්වය සඳහා වූ පරීක්ෂණයේ තුන්වැනි කොටස සඳහා පිළිගැනේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (**සැ. යු.**—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතිස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතික.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂතැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සළකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම නමින්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුනට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සළකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.

12–752/4—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

යොමු අංකය : සාප 30/206

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කාර්මික සහකාර තනතුරු (ගොඩනැංවීම්/ප්‍රමාණ සමීක්ෂණ)

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කාර්මික සහකාර තනතුරු (ගොඩනැංවීම් හා ප්‍රමාණ සමීක්ෂණ) සඳහා පහත දක්වෙන සුදුසුකම් ඇති අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ පෝරමය අනුව ඉල්ලුම් පත් සකස් කොට, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, (සාමාන්‍ය පරිපාලන ශාඛාවේ) සහිර ලේකම් තුමා වෙත 1969 දෙසැම්බර් මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන්ට සැලැස්විය යුතුය. ඉල්ලුම්පත් අමාත්‍යාංශයේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික ලිපිනයට නො එවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රු. 2,580 න් පටන් ගෙන රු. 120 බැගින් වන වාර්ෂික වැටුප් වැඩිවීම් 11 කින්, රු. 180 බැගින් වන වාර්ෂික වැටුප් වැඩිවීම් 4 කින් වර්ෂයකට රු. 4,620 දක්වා නැග, රු. 4,620 වාර්ෂික වැටුපේ දී දැවුරුද්දක නැවතීමකින් පසුව වර්ෂයකට රු. 4,800 න් පටන්ගෙන රු. 180 බැගින් වන වැටුප් වැඩිවීම් 3 කින් සහ රු. 240 බැගින් වන වාර්ෂික වැටුප් වැඩිවීම් 5 කින් වර්ෂයකට රු. 6,540 දක්වා නගින්නකි.

3. **සේවයට යෙදවීමේ වගන්තිය.**—තනතුරු සහිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනාත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

4. **වයස් සීමාව.**—අවුරුදු 40 ට වැඩි නොවිය යුතුය. රජයේ සේවයේ දැනටමත් යෙදී සිටින නිලධාරීන්ට මෙම වයස් සීමාව බලපාන්නේ නැත.

5. **අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්.**—

(i) දෙවාරයකට නොවැඩි වාර ගණනකදී ගණිතය (ශුද්ධ හෝ ව්‍යවහාරික) සහ භෞතික විද්‍යාව ඇතුළු විෂයයන් 6 කින් පොදු අධ්‍යයන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ගණිතය (ශුද්ධ හෝ ව්‍යවහාරික) සහ භෞතික විද්‍යාව සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට උසස් විභාගයකින් සමත් වී සිටීම.

(ii) ලංකාවේ කාර්මික විද්‍යාලය මගින් පවත්වනු ලබන ගොඩනැගිලි නිර්මාණය පිළිබඳ විභාගයේ I වන සහ II අවස්ථාව සමත්වී ඇති බව ඊට අතිරේකව ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩ නැංවීම් පිළිබඳ ඉංජිනේරු විද්‍යාව සඳහා ඇති තුන් අවුරුදු අර්ධකාල පාඨමාලාවක් සම්පූර්ණ කර ඇති බව හෝ ඊට උසස් සුදුසුකමක් ඇති බව, සහ

(iii) කාර්මික සහකාර (ගොඩනැංවීම්) තනතුරු සඳහා ඉහත (5 වැනි ඡේදයේ) I, II යටතේ ඇති සුදුසුකම්වලට අමතරව මෙහි පහත දක්වා ඇති (අ) යටතේ ඇති සුදුසුකම්ද, කාර්මික සහකාර (ප්‍රමාණ සමීක්ෂණ) තනතුරු සඳහා ඉහත (5 වැනි ඡේදයේ) I, II යටතේ ඇති සුදුසුකම්වලට අමතරව මෙහි පහත දක්වා ඇති (ආ) යටතේ ඇති සුදුසුකම්ද අනිවාර්ය යෙන්ම තිබිය යුතුය :—

(අ) පිළිගත් සිවිල් ඉංජිනේරු ආයතනයක අඩු ගණනේ අවුරුදු 3 ක් ඇඳීම් කාර්යාලයක ලත් අත්දැකීමක් සහිතව, යටත් පිරිසෙයින් අවුරුදු 10 ක පළපුරුද්දක් ඇති බව,

(ආ) පිළිගත් සිවිල් ඉංජිනේරු ආයතනයක ප්‍රමාණ වෙන් කිරීම් හා ඇස්තමේන්තු පිළියෙල කිරීම පිළිබඳව අවුරුදු 3 ක අත්දැකීමක් සහිතව, යටත් පිරිසෙයින් අවුරුදු 10 ක පළපුරුද්දක් ඇති බව.

6. ඉහත 5 වැනි ඡේදයේ ප්‍රකාර සුදුසුකම් ඇති රජයේ සේවක සින්ගේ ඉල්ලුම්පත්‍ර ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ග යෙන් ඉදිරිපත් කළ යුතුය.

7. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවන ඡේදයේ ආරම්භයේ ඇති රාජ්‍ය සේවා තනතුරුවලට කෙරෙන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලට විශෙෂ සැලකිල්ල යොමු කරනු ලැබේ.

8. ඉල්ලුම්කරුවන් විසින් සිය ඉල්ලුම්පත්‍රවලට පහත සඳහන් වන සහතික පත්‍රවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතික පත්‍රය (බව්තිස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා මාලාවේ කටයුතු සඳහා දෙන සහතිකපත්‍ර හෝ පිළිගනු නොලැබේ.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා/හෝ වෘත්තීය සහතික පත්‍ර

(ඇ) ඉල්ලුම්කරුගේ සුදුසුකම්, චරිතය සහ මෙම තනතුරට පත් කිරීමට ඇති යෝග්‍යතා සම්බන්ධයෙන් මෑතදී ලබාගත් සහතික පත්‍ර තුනක් (දැනටමත් රජයේ සේවයෙහි යෙදී සිටින අයදුම්කරුවන් මෙම අතුරු ඡේදය යටතේ සහතික එවීම අවශ්‍ය නොවේ.)

සංලක්ෂ්‍යය :—මෙම සහතිකපත්‍ර පිටපත් ආපසු එවනු නොලැබේ.

9. සියළුම ඉල්ලුම්පත්‍ර ලැබුණු බව දන්වා එවනු ඇත. අයදුම්පත් භාර ගැනීම අවසන් කොට දෙසතියක් ඇතුලත එසේ දන්වා එවනු නොලැබූ අයදුම්කරුවන් ඒ බව වහාම සහිර ලේකම්, සාමාන්‍ය පරිපාලන ශාඛාව, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය, කොළඹ 2, යන ලිපිනයට දැනුම් දිය යුතුය.

10. ඉල්ලුම්පත්‍ර කාර්මික සහකාර (ගොඩනැංවීම්) තනතුරු සඳහා නම් කා.ස.ගො. යන්නද ඉල්ලුම් පත්‍ර කාර්මික සහකාර (ප්‍රමාණ සමීක්ෂණ) තනතුර සඳහා නම් කා.ස.ප්‍ර. යන්නද පැහැදිලිව, ලොකු අකුරෙන් ඉල්ලුම් පත්‍රයේ ඉහළ වම් කෙළවර ලිවිය යුතුය.

සහිර ලේකම්,<br>
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය.

1969 දෙසැම්බර් මස 10 වැනි දින,<br>
කොළඹ 2, මැලේ වීදියේ,<br>
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේදී.

යොමුව : සාප/30/206

## ආදර්ශ ආකෘති පත්‍රය

### කාර්මික සහකාර (ගොඩනැංවීම්/ප්‍රමාණ සමීක්ෂක) තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :———.

2. ලිපිනය (පැහැදිලි අකුරෙන්) :———.

3. අයදුම්පත් බාරගන්නා අවසාන දිනට නියම වයස :—
   අවුරුදු :——, මාස :——, දින :——.
   උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය) :———.

4. ඔබ පුරවැසියෙක් ද ? එසේ නම් උත්පත්තියෙන් ද නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? :———

   පහත සඳහන් අයගේ උපන් ස්ථාන :—
   (i) අයදුම්කරුගේ :———.
   (ii) අයදුම්කරුගේ පියාගේ :———.
   (iii) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තාගේ :———.
   (iv) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :———.

5. අයදුම්කරු විවාහකද, අවිවාහකද නැතහොත් වැන්දඹු ද යන වග (විවාහක නම් විවාහ වූ දිනය සහ දරුවන් ගණන සඳහන් කරන්න) :———.

6. ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් (සහතික පිටපත් අමුණන්න) :———.

   පහත සඳහන් භාෂාවන් පිළිබඳ දැනීම :—
   (i) සිංහල :———.
   (ii) දෙමළ :———.
   (iii) ඉංග්‍රීසි :———.

7. වෘත්තීය හා කාර්මික සුදුසුකම් තිබේ නම් විස්තර (සහතික පත්‍ර ඇතොත් පිටපත් අමුණන්න) :———.

8. විශේෂ සුදුසුකම්, පුහුණුවීම් හෝ පළපුරුදුකම් තිබේ නම් විස්තර :———.

9. පාසැල හැර යාමෙන් පසුව කළ රක්ෂා දින සහිතව :———.

10. චරිත සහතික ඉදිරිපත් කර ඇති සම්භාවනීය පුද්ගලයින් තිදෙනාගේ නම් සහ පදවි නාමයන් (සහතික පත්‍රවල පිටපත් ඇමිණිය යුතුය) :———.

11. ඔබ ණය ගැති කමින් නිදහස් ද ? නො එසේ නම් කොතෙක් දුරට ණය ගැතිද ? :———.

මෙම අයදුම්පතෙහි ම විසින් සපයා ඇති කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. තවද, මෙහි අන්තර්ගත කරුණු අසත්‍ය බව මා තෝරාගැනීමට කලින් දැනගතහොත් මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු කිරීමට හැකි බවත් පත් කරනු ලැබුවායින් පසුව සොයා ගතහොත් කිසිම වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකර දැමිය හැකි බවත් මම දනිමි.

———,<br>
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

12–765—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

**සිංහල භාෂා පරිවර්තක තනතුරු—ස්ථිර/තාවකාලික**

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ සිංහල භාෂා පරිවර්තක තනතුරු (ස්ථිර සහ තාවකාලික) සඳහා මෙයින් අයදුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘතියේ ප්‍රකාර පිළියෙල කරනු ලබන අයදුම් පත් වර්ෂ 1970 ජනවාරි 21 වැනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එව්ය යුතුය.

2. වැටුප.—මේ තනතුරුවලට නියමිත වැටුප් ක්‍රමය: රු. 6,600—රුපියල් 180 හා රුපියල් 240—රුපියල් 9,240 කි. වසරකට රුපියල් 8,040 දක්වා වැඩිවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

**3. සේවා කොන්දේසි :—**

**(අ) ස්ථිර තනතුරු :**

(i) මේ තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගනු ලැබූ අයදුම්කරු වැන්දඹු හා අනාථ දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුයි.

(ii) සුළු කාලයක් ඇතුළත දී තනතුරේ වැඩ බාරගන්නා ලෙස තෝරාගත් අපේක්ෂකයාට නියම කරනු ලැබේ.

(iii) තනතුරට අයත් කාර්ය නම්, ලිපි ලේඛනාදිය ඉංග්‍රීසියෙන් සිංහලට පරිවර්තනය කිරීම, සිංහලෙන් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම, අනෙක් දෙපාර්තමේන්තුවලින් එවන සිංහල පරිවර්තනයන් ප්‍රතිශෝධනය කිරීම සහ දෙපාර්තමේන්තුවෙන් නියම කෙරෙන වෙනත් කටයුතු කිරීම ද වේ. භාෂා පිළිබඳ විශේෂ ප්‍රවීණත්වයක් ඔවුන්ගෙන් බලාපොරොත්තු වනු ලැබේ.

**(ආ) තාවකාලික තනතුරු :**

(i) මෙම තනතුරු තාවකාලිකය. විශ්‍රාම වැටුප් රහිතය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. මසක් කල්දීමෙන් පසු ඕනෑම අවස්ථාවක සේවයෙන් අස් කිරීමට යටත් වේ.

(ii) සුළු කාලයක් ඇතුළත දී තනතුරේ වැඩ බාර ගන්නා ලෙස තෝරාගත් අපේක්ෂකයාට නියම කරනු ලැබේ.

(iii) තනතුරට අයත් කාර්ය නම්, ලිපි ලේඛනාදිය ඉංග්‍රීසියෙන් සිංහලට පරිවර්තනය කිරීම, සිංහලෙන් ඉංග්‍රීසියට පරිවර්තනයකිරීම, අනෙක් දෙපාර්තමේන්තුවලින් එවන සිංහල පරිවර්තනයන් ප්‍රතිශෝධනය කිරීම සහ දෙපාර්තමේන්තුවෙන් නියම කෙරෙන වෙනත් කටයුතු කිරීම ද වේ. භාෂා පිළිබඳ විශේෂ ප්‍රවීණත්වයක් ඔවුන්ගෙන් බලාපොරොත්තු වනු ලැබේ.

**4. අවශ්‍ය සුදුසුකම් :** හැම අයදුම්කරුවෙකුම—

(අ) (i) සිංහල භාෂාව විෂයයක් වශයෙන් ඇති උපාධියක් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලැබූ අයකු, නැතහොත්,

(ii) සිංහල භාෂා පරිවර්තකයකු වශයෙන් දහ අවුරුද්දක පළපුරුද්දකම් ඇත්තාවූ අයකු හෝ තමා යටත් පිරිසෙයින් උපාධිධරයන්ට සමාන ප්‍රවීණතාවක් ඇති උගතකු බව තේරීම් සභාවට ඒත්තු යන සේ කරුණු ඉදිරිපත් කළ හැකි වූ ද, ඉංග්‍රීසිය පිළිබඳ ඉතා හොඳ දැනුමක් ඇත්තා වූ ද, ලේඛකයකු නොහොත් ග්‍රන්ථ කර්තෘවරයකු බවටත් ;

(ආ) 1970 ජනවාරි මස 21 වැනි දට තමාගේ වයස අවුරුදු 25 ට නො අඩු බවට හා 50 ට නො වැඩි බවටත් (දැනට ආණ්ඩුවේ සේවයේ යෙදී සිටින අයට මේ වයස් සීමාවන් අදාළ නොවේ.)

(ඇ) විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බවටත්,

**සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.**

5. හැම අයදුම්කරුවකුම විසින්ම පහත පෙනෙන සහතිකවල පිටපත් (මුල් ලිපි නොවේ) තම අයදුම් පතට අමුණා එව්ය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය හෝ (උප්පැන්න සහතිකය ලියාපදිංචි කර නැති අපේක්ෂකයන් සම්බන්ධයෙන් නම්) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකය. (බෞතීස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කටයුතු සඳහා දෙන සහතික පත්‍ර භාරගනු නො ලැබේ) ;

(ආ) උසස්ම අධ්‍යාපනික සුදුසුකම්, සහ/හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ ලැබූ සහතික පත්‍ර ;

(ඇ) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය, මේ තනතුරට ඇති යෝග්‍යතාව, යන මේවා සම්බන්ධයෙන් මෑතදී ලබාගන්නා ලද සහතික තුනක් (රාජ්‍ය සේවාවෙහි සිටින අයදුම්කරුවන්ගෙන් මේවා බලාපොරොත්තු නොවේ.)

**සැළකිය යුතුයි :—**සහතික පත්‍රවල හා චරිත සහතික පත්‍රවල පිටපත් **ආපසු එවනු නොලැබේ.**

6. ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දින කීපය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි යම් අවාසියක් වේනොත් එය අයදුම්කරුවන් විසින් විඳ දරා ගත යුතු වේ. ආණ්ඩුවේ සේවයෙහි නියුක්ත නිලධාරීන් එවන අයදුම් පත් නියමිත දිනයෙන් පසුව මෙහි ලැබුණොත්, ඒ අයදුම් පත් බාරගනු ලබන්නේ ඒවා නියමිත දිනයට කලින් දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාට ලැබී තිබුණහොත් ද, ඒවා ප්‍රමාදවීමට සෑහෙන හේතු දක්වමින් එය අයදුම් පත් භාරගන්නා ලෙස දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා නිර්දේශ කළ හොත් ද පමණකි.

7. අයදුම් පත් හා ඒ පිළිබඳ සෙසු ලියුම් කියුම් එව්ය යුත්තේ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ යම්කිසි නිලධාරියකු ගේ පෞද්ගලික නමට නොව, රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්, තැ. පෙ. 598, 22, පීඩ් මාවත, කොළඹ 7 යන ලිපිනයටය.

8. ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි (II) වැනි ඡේදයෙහි පළවූ, රාජ්‍ය සේවාවේ තනතුරුවලට කෙරෙන පත් කිරීම් පිළිබඳ වූ පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. එවන හැම අයදුම්පතක්ම ලැබුණු බව දන්වා එවනු ලැබේ. අයදුම් පත් බාර ගන්නා අවසාන දිනයේ සිට තුන් දවසක් ඇතුළත එවැනි දැන්වීමක් යම් අයදුම්කරුවකුට නොලැබුණහොත් ඔහු විසින් ඒ බව රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්හට වහාම දන්වා එව්ය යුතුය. එසේ නොකරන අයගේ හිමිකම් ගැන සලකා බලනු නො ලැබේ.

පීටර් පී. අබේසේකර,
රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්.

1969. 12. 12 වෙනිදා,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 598,
22, පීඩ් මාවත, කොළඹ 7.

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

**සිංහල භාෂා පරිවර්තක තනතුරු—ස්ථිර/තාවකාලික පිළිබඳ ඉල්ලුම් පත්‍රය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
   (අ) අගට යෙදෙන නම :————.
   (ආ) අනිත් නම් :————.

2. ලිපිනය :————.

3. (අ) වර්ෂ 1970 ජනවාරි මස 21 වැනි දිනට සම්පූර්ණ වයස :— අවුරුදු :———. මාස :———. දවස් :———.
   (ආ) උපන් දිනය හා ස්ථානය (උප්පැන්න සහතිකයේ හෝ වයස පිළිබඳ විශේෂ සහතිකයේ පිටපතක් අමුණා එව්ය යුතුයි) :————.

4. රටවැසි භාවය සහ එය කෙසේ හිමිවීද යන බව :————.

5. (අ) පියාගේ සම්පූර්ණ නම :————.
   (ආ) පියා උපන් දිනය සහ ස්ථානය :————.
   (ඉ) ඔහුගේ රටවැසි භාවය :————.

6. අයදුම්කරු විවාහකද, අවිවාහකද, කනවැන්දුම් ද යන බව (විවාහක නම් විවාහ වූ දිනයත් දරුවන් ගණනත් සඳහන් කළ යුතුයි) :————.

7. මූලික අධ්‍යාපනය ලත් පාඨශාලා සහ විද්‍යාල (ඒවාට ඇතුළත් වූ සහ අස් වූ දින සඳහන් කළ යුතුයි) :————.

8. (අ) ශාස්ත්‍රාලයීය සහ වෘත්තීය සුදුසුකම් (ඒවා ලත් දිනත්, සාමාර්ථ්‍යය ලැබූ පෙළත් සඳහන් කළ යුතුයි. සහතික පිටපත් ද අමුණා එව්ය යුතුයි) :————.
   (ආ) දෙමළ සහ/හෝ ඉංග්‍රීසි භාෂා විෂයයන් වශයෙන් ඇතිව සාමාර්ථ්‍යය ලත් උසස්ම විභාගය :————.
   දෙමළ :————.
   ඉංග්‍රීසි :————.

9. (අ) පරිවර්තක වැඩ සම්බන්ධයෙන් පළපුරුදුකම් තිබේ නම්, විස්තර සඳහන් කරන්න :————.
   (ආ) සාහිත්‍ය කෘතීන් කර පළපුරුදුකම් තිබේ නම්, ඒවාද සඳහන් කරන්න :————.

10. (අ) පාඨශාලාවෙන් හෝ විද්‍යාලයෙන් හෝ අස්වූ පසු නියුක්තව සිටි රක්ෂාවල් ද, ඒ කාලසීමාවන්ද, ලැබූ වැටුප් ද සඳහන් කරන්න :————.
   (ආ) රජයේ සේවයේ යෙදී සිටී නම්, දැනට දරන තනතුරුද වාර්ෂික වැටුප ද සඳහන් කරන්න :————.

11. විශේෂ පළපුරුදුකම්, පුහුණුවීම්, සුදුසුකම් හෝ හිමිකම් :——.

12. පෞද්ගලික ලෙස ආශ්‍රය කරන තිදෙනකුගේ නම් (තත්ත්වය සහ ලිපිනය සඳහන් කරන්න. මේ අය ඔබේ ඥාතීන් නොවිය යුතුයි)

(i) ..........................................

(ii) ..........................................

(iii) ..........................................

13. චරිත සහතික දී ඇති අයගේ නම් සහ තත්ත්ව (ඥාතීන් නොවිය යුතුයි. මෑතක දී ලබාගත් චරිත සහතිකවල පිටපත් පමණක් අමුණා, එවිය යුතුයි) :————.

14. මුදල් කරදර නැති වූවෙක් ද යන වග; නැතිනම් ණය ප්‍රමාණය (ගණන් විස්තර කරන්න) :————.

15. ස්ථිර තනතුරට පත් කර ගනු නොලැබුවහොත් තාවකාලික පත්වීමක් සඳහා සලකා බලනු ලැබීමට කැමැත්තේ ද යන්න සඳහන් කරන්න :————.

මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි හෝ අසත්‍ය හෝ බව පත්වීම් දෙන්නට පෙර හෙළිවුවහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ද, පත්වීම් ලැබුවාට පසු හෙළි වුවහොත් කිසිම වන්දි ගෙවීමක් නැතිව මා තනතුරෙන් අස් කිරීමට ද යටත් වන බව මම දන සිටිමි. මේ අයදුම් පතෙහි දක්වෙන සියලු විස්තර සත්‍ය හා නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12–745/1—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### තාවකාලික දෙමළ භාෂා පරිවර්තක තනතුර

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ තාවකාලික දෙමළ භාෂා පරිවර්තක තනතුරක් සඳහා මෙයින් අයදුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වෙන ආදර්ශ ආකෘතියේ ප්‍රකාර පිළියෙල කරනු ලබන අයදුම් පත් වර්ෂ 1970 ජනවාරි මස 21 වැනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. වැටුප.—මේ තනතුරට නියමිත වැටුප් ක්‍රමය : රුපියල් 6,600—රුපියල් 180 හා රුපියල් 240—රුපියල් 9,240 කි. වසරකට රුපියල් 8,040 දක්වා වැඩිවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

3. සේවා කොන්දේසි :

(i) මෙම තනතුර තාවකාලිකය. විශ්‍රාම වැටුප් රහිතය. තෝරාගනු ලබන අයදුම්කරුවන් අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. මසක් කල් දීමෙන් පසු ඕනෑම අවස්ථාවක සේවයෙන් අස් කිරීමට යටත් වේ.

(ii) සුළු කාලයක් ඇතුළතදී තනතුරේ වැඩ බාර ගන්නා ලෙස තෝරා ගත් අපේක්ෂකයාට නියම කරනු ලැබේ.

(iii) තනතුරට අයත් කාර්ය නම්, ලිපි ලේඛනාදිය ඉංග්‍රීසියෙන් දෙමළට පරිවර්තනය කිරීම, දෙමළෙන් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම, අනෙක් දෙපාර්තමේන්තුවලින් එවන දෙමළ පරිවර්තනයන් ප්‍රතිශෝධනය කිරීම සහ දෙපාර්තමේන්තුවෙන් නියම කෙරෙන වෙනත් කටයුතු කිරීමද වේ. භාෂා පිළිබඳ විශේෂ ප්‍රවීණත්වයක් ඔවුන්ගෙන් බලාපොරොත්තු වනු ලැබේ.

4. අවශ්‍ය සුදුසුකම් :

හැම අයදුම්කරුවකුම—

(අ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයක දෙමළ විෂයයක් වශයෙන් ගෙන සාමර්ථ්‍යය ලැබූ උපාධිධරයකු බවට, නැතහොත් දෙමළ භාෂා පරිවර්තකයකු වශයෙන් දහ අවුරුද්දක පළපුරුදුකම් ඇත්තාවූ අයකු බව; හෝ

(ii) ඉංග්‍රීසි පිළිබඳ ඉතා හොඳ දැනුමක් ඇත්තාවූ ද උපාධිධරයකු තරම් ප්‍රවීණවූ ද දෙමළ ලේඛකයකු හෝ ග්‍රන්ථ කර්තෘවරයකු බවටත් (සැ. යු.—සිංහල හෝ සංස්කෘත හෝ පාලි පිළිබඳ දැනුමක් ඇතොත් එය අතිරේක සුදුසුකමක් වනවා ඇත);

(ආ) 1970 ජනවාරි මස 21 වැනි දිනට තමාගේ වයස අවුරුදු 25ට නොඅඩු අවුරුදු 50ට නොවැඩි බවටත් (රාජ්‍ය සේවාවේ සිටින අයදුම්කරුවන්ට මෙහි සඳහන් වැඩි වයස් සීමාව බල නොපවත්වයි).

(ඇ) තමා විශිෂ්ට චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත වූ බවටත්;

සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

5. හැම අයදුම්කරුවකු විසින්ම පහත පෙනෙන සහතිකවල පිටපත් (මුල් ලිපි නොවේ.) තම අයදුම් පතට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය හෝ (උප්පැන්න සහතිකය ලියාපදිංචි කර ඇති අපේක්ෂකයන් සම්බන්ධයෙන් නම්) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකය. (බෞතීස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කටයුතු සඳහා දෙන සහතික පත්‍ර භාරගනු නොලැබේ);

(ආ) උසස්ම අධ්‍යාපනික සුදුසුකම්, සහ/හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ ලැබූ සහතික පත්‍ර;

(ඇ) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය, මේ තනතුරට ඇති යෝග්‍යතාව, යන මේවා සම්බන්ධයෙන් මෑතදී ලබාගන්නා ලද සහතික තුනක් (රාජ්‍ය සේවාවෙහි සිටින අයදුම්කරුවන්ගෙන් මේවා බලාපොරොත්තු නොවේ.)

සැළකිය යුතුයි.—සහතික පත්‍රවල හා චරිත සහතික පත්‍රවල පිටපත් ආපසු එවනු නොලැබේ.

6. ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දින කීපය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි යම් අවාසියක් වේතොත් එය අයදුම්කරුවන් විසින් විඳ දරා ගත යුතු වේ. ආණ්ඩුවේ සේවයෙහි නියුක්ත නිලධාරීන් එවන අයදුම් පත් නියමිත දිනයෙන් පසුව මෙහි ලැබුණොත් ඒ අයදුම් පත් බාරගනු ලබන්නේ ඒවා නියමිත දිනයට කලින් දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාට ලැබී තිබුණහොත් ද, ඒවා ප්‍රමාද වීමට සෑහෙන හේතු දක්වමින් එම අයදුම් පත් භාරගන්නා ලෙස දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා නිර්දේශ කළහොත් ද පමණකි.

7. අයදුම්පත් හා ඒ පිළිබඳ සෙසු ලියුම් කියුම් එවිය යුත්තේ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ යම්කිසි නිලධාරියකුගේ පෞද්ගලික නමට නොව, රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්, තැ. පෙ. 598, 22, රීඩ් මාවත, කොළඹ 7 යන ලිපිනයටය.

8. ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයෙහි පළවූ රාජ්‍ය සේවාවේ තනතුරුවලට කෙරෙන පත් කිරීම් පිළිබඳ වූ පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. එවන හැම අයදුම්පතක්ම ලැබුණු බව දන්වා එවනු ලැබේ. අයදුම් පත් බාර ගන්නා අවසාන දිනයේ සිට තුන් දවසක් ඇතුළත එවැනි දැන්වීමක් යම් අයදුම්කරුවකුට නොලැබුණහොත් ඔහු විසින් ඒ බව රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්ට වහාම දන්වා එවිය යුතුය. එසේ නොකරන අයගේ හිමිකම් ගැන සලකා බලනු නොලැබේ.

පීටර් පී. අබේසේකර,
රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්.

1969.12.12 වෙනිදා,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 598,
22, රීඩ් මාවත, කොළඹ 7.

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### තාවකාලික දෙමළ භාෂා පරිවර්තක තනතුර පිළිබඳ ඉල්ලුම් පත්‍රය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
   (අ) අගට යෙදෙන නම :————.
   (ආ) අනිත් නම් :————.

2. ලිපිනය :————.

3. (අ) වර්ෂ 1970 ජනවාරි මස 21 වැනි දිනට සම්පූර්ණ වයස :——, අවුරුදු :——, මාස :——, දවස් :————.
   (ආ) උපන් දිනය හා ස්ථානය (උප්පැන්න සහතිකයේ හෝ වයස පිළිබඳ විශේෂ සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුයි) :————.

4. රටවැසි භාවය සහ එය කෙසේ හිමිවීද යන බව :————.

5. (අ) පියාගේ සම්පූර්ණ නම :————.
   (ආ) පියා උපන් දිනය සහ ස්ථානය :————.
   (ඉ) ඔහුගේ රටවැසි භාවය :————.

6. අයදුම්කරු විවාහකද, අවිවාහකද, කනවැන්දුම් ද යන බව (විවාහක නම් විවාහ වූ දිනයත් දරුවන් ගණනත් සඳහන් කළ යුතුයි) ————.

7. මූලික අධ්‍යාපනය ලත් පාඨශාලා සහ විද්‍යාල (ඒවාට ඇතුළත් වූ සහ අස් වූ දින සඳහන් කළ යුතුයි) :————.

8. (අ) ශාස්ත්‍රාලයීය සහ වෘත්තීය සුදුසුකම් (ඒවා ලත් දිනත්, සාමර්ථ්‍යය ලැබූ පෙළත් සඳහන් කළ යුතුයි.) සහතික පිටපත් ද අමුණා එවිය යුතුයි) :————.

(ආ) සිංහල සහ/හෝ ඉංග්‍රීසි භාෂා විෂයයන් වශයෙන් ඇතිව සාමර්ථ්‍යය ලත් උසස්ම විභාගය :————.

සිංහල :————.

ඉංග්‍රීසි :————.

9. (අ) පරිවර්තක වැඩ සම්බන්ධයෙන් පළපුරුදුකම් තිබේ නම්, දින සමඟ විස්තර සඳහන් කරන්න :————.

(ආ) සාහිත්‍ය කෘතීන් කර පළපුරුදුකම් තිබේ නම්, දින සමඟ ඒවාද සඳහන් කරන්න :————.

10. (අ) පාඨශාලාවෙන් හෝ විද්‍යාලයෙන් හෝ අස්වූ පසු නියුක්තව සිටි රක්ෂාවල් ද, ඒ පිළිබඳ වකවානු ද, ලැබූ වැටුප් ද සඳහන් කරන්න :————.

(ආ) රජයේ සේවයේ යෙදී සිටි නම්, දැනට දරන තනතුරුද වාර්ෂික වැටුප ද සඳහන් කරන්න :————.

11. විශේෂ පළපුරුදුකම්, පුහුණුවීම්, සුදුසුකම් හෝ හිමිකම් :————.

12. පෞද්ගලික ලෙස ආශ්‍රය කරන තිදෙනකුගේ නම් (තත්ත්වය සහ ලිපිනය සඳහන් කරන්න. මේ අය ඔබේ ඥාතීන් නොවිය යුතුයි) :————.

(i) ......................

(ii) ......................

(iii) ......................

13. චරිත සහතික දී ඇති අයගේ නම් සහ තත්ත්වය (ඥාතීන් නොවිය යුතුයි. මෑතක දී ලබාගත් චරිත සහතිකවල පිටපත් පමණක් අමුණා එවිය යුතුයි) :————.

14. මුදල් කරදර නැති වූවෙක් ද යන වග ; නැතිනම් ණය ප්‍රමාණය : (ගණන් විස්තර කරන්න) :————.

15. වෙනත් කරුණු :————.

මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි හෝ අසත්‍ය හෝ බව පත්වීම් දෙන්නට පෙර හෙළිවුවහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ද, පත්වීම් ලැබුවාට පසු හෙළි වූවහොත් කිසිම වන්දි ගෙවීමක් නැතිව මා නිලයෙන් අස් කිරීමට ද යටත් වන බව මම දැන සිටිමි. මේ අයදුම්පතෙහි දක්වෙන සියලු විස්තර සත්‍ය හා නිවැරදි බවද මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12-754/2 — 69.12.19 දින අංක 4,885 දරන ගැසට් පත්‍රය

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### තාවකාලික පර්යේෂණ සහකාර (දෙමළ) තනතුර

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ තාවකාලික පර්යේෂණ සහකාර (දෙමළ) තනතුරක් සඳහා මෙයින් අයදුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වෙන ආදර්ශ ආකෘතියේ ප්‍රකාර පිළියෙල කරනු ලබන අයදුම් පත් වර්ෂ 1970 ජනවාරි මස 21 වැනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. **වැටුප.**—මේ තනතුරට නියමිත වැටුප් ක්‍රමය : රුපියල් 6,600—රුපියල් 180 හා රුපියල් 240—රුපියල් 9,240 කි. වසරකට රුපියල් 8,040 දක්වා වැඩිවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

3. **සේවා කොන්දේසි :**

(i) මෙම තනතුර තාවකාලිකය. විශ්‍රාම වැටුප් රහිතය. තෝරාගනු ලබන අයදුම්කරුවන් අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. මසක් කල් දීමෙන් පසු ඕනෑම අවස්ථාවක සේවයෙන් අස් කිරීමට යටත් වේ.

(ii) සුළු කාලයක් ඇතුළතදී තනතුරේ වැඩ බාර ගන්නා ලෙස තෝරා ගත් අපේක්ෂකයාට නියම කරනු ලැබේ.

(iii) මේ නිලධාරියාගේ ප්‍රධාන කාර්ය වනුයේ දැනට භාවිත වන කාර්යාලයීය ඉංග්‍රීසි වචන හා පාඨවලට සුදුසු දෙමළ වචන හා පාඨයන් ක්‍රමානුකූලව රැස්කිරීමත්, අවශ්‍ය වූ විට අලුත් වචන සැපයීමත්, ඒ සියලුම වචන හා පාඨයන් යථා පරිද්දෙන් සම්මත කර පිළිගත් වචන සංග්‍රහයක් සම්පාදනය කිරීම සඳහා කටයුතු කිරීමත්ය. සෙසු කටයුතු වලදීද රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව ඔහුගෙන් සහාය බලාපොරොත්තු වනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම් :**

**හැම අයදුම්කරුවකුම—**

(අ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයක දෙමළ විෂයයක් වශයෙන් ගෙන සාමාර්ථ්‍යය ලැබූ උපාධිධරයකු, නැතහොත්

(ii) ඉංග්‍රීසි පිළිබඳ ඉතා හොඳ දැනුමක් ඇත්තාවූ ද උපාධිධරයකු තරම් ප්‍රවීණවූ ද දෙමළ ලේඛකයකු හෝ ග්‍රන්ථ කර්තෘවරයකු බවටත් (**සැ. යු.**—සිංහල හෝ සංස්කෘත හෝ පාලි පිළිබඳ දැනුමක් ඇතොත් එය අතිරේක සුදුසුකමක් වනවා ඇත.)

(ආ) 1970 ජනවාරි 21 වැනිදට වයස අවුරුදු 25ට නොඅඩු අවුරුදු 50ට නොවැඩි බවටත් (රාජ්‍ය සේවාවේ සිටින අයදුම්කරුවන්ට මෙහි සඳහන් වැඩි වයස් සීමාව බල නොපවත්වයි.)

(ඇ) නමා විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත වූ බවටත්,

සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

5. හැම අයදුම්කරුවකු විසින්ම පහත පෙනෙන සහතිකවල පිටපත් (මුල් ලිපි නොවේ.) තම අයදුම් පතට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය හෝ (උප්පැන්න සහතිකය ලියාපදිංචි කර ඇති අපේක්ෂකයන් සම්බන්ධයෙන් නම්) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකය. (බෞතීස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කටයුතු සඳහා දෙන සහතික පත්‍ර භාරගනු නොලැබේ) ;

(ආ) උසස්ම අධ්‍යාපනික සුදුසුකම්, සහ/හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ ලැබූ සහතික පත්‍ර ;

(ඇ) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය, මේ තනතුරට ඇති යෝග්‍යතාව, යන මේවා සම්බන්ධයෙන් මෑතදී ලබාගන්නා ලද සහතික තුනක් (රාජ්‍ය සේවාවෙහි සිටින අයදුම්කරුවන්ගෙන් මේවා බලාපොරොත්තු නොවේ.)

**සැලකිය යුතුයි.**—සහතික පත්‍රවල හා චරිත සහතික පත්‍රවල පිටපත් ආපසු එවනු නොලැබේ.

6. ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දින කීපය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි යම් අවාසියක් වෙතොත් එය අයදුම්කරුවන් විසින් විඳ දරා ගත යුතු වේ. ආණ්ඩුවේ සේවයෙහි නියුක්ත නිලධාරීන් එවන අයදුම් පත් නියමිත දිනයෙන් පසුව මෙහි ලැබුණොත් ඒ අයදුම් පත් බාරගනු ලබන්නේ ඒවා නියමිත දිනයට කලින් දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාට ලැබී තිබුණහොත් ද, ඒවා ප්‍රමාද වීමට සෑහෙන හේතු දක්වමින් එම අයදුම් පත් භාරගන්නා ලෙස දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා නිර්දේශ කළහොත් ද පමණකි.

7. අයදුම්පත් හා ඒ පිළිබඳ සෙසු ලියුම් කියුම් එවිය යුත්තේ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ යම්කිසි නිලධාරියකුගේ පෞද්ගලික නමට නොව, රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්, තැ. පෙ. 598, 22, ඊඩ් මාවත, කොළඹ 7 යන ලිපිනයටය.

8. ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයෙහි පළවූ රාජ්‍ය සේවාවේ තනතුරුවලට කෙරෙන පත් කිරීම් පිළිබඳ වූ පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. එවන හැම අයදුම්පතක්ම ලැබුණු බව දන්වා එවනු ලැබේ. අයදුම් පත් බාර ගන්නා අවසාන දිනයේ සිට තුන් දවසක් ඇතුළත එවැනි දැන්වීමක් යම් අයදුම්කරුවකුට නොලැබුණහොත් ඔහු විසින් ඒ බව රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්ට වහාම දන්වා එවිය යුතුය. එසේ නොකරන අයගේ හිමිකම් ගැන සලකා බලනු නොලැබේ.

පීටර් පී. අබේසේකර,
රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්.

1969.12.12 වෙනිදා,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 598,
22, ඊඩ් මාවත, කොළඹ 7.

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### තාවකාලික පර්යේෂණ සහකාර (දෙමළ) තනතුර සම්බන්ධ ඉල්ලුම් පත්‍රය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
   (අ) අගට යෙදෙන නම :————.
   (ආ) අනිත් නම් :————.

2. ලිපිනය :————.

3. (අ) වර්ෂ 1970 ජනවාරි මස 21 වැනි දිනට සම්පූර්ණ වයස :——, අවුරුදු :——, මාස :——, දවස් :————.

(ආ) උපන් දිනය හා ස්ථානය (උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුයි) :————.

4. රටවැසි භාවය සහ එය කෙසේ හිමිවීද යන බව :————.

5. (අ) පියාගේ සම්පූර්ණ නාම :————.

(ආ) පියා උපන් දිනය සහ ස්ථානය :————.

(ඉ) ඔහුගේ රටවැසි භාවය :————.

6. අයදුම්කරු විවාහකද, අවිවාහකද, කනවැන්දුම් ද යන බව (විවාහක නම් විවාහ වූ දිනයත් දරුවන් ගණනත් සඳහන් කළ යුතුයි) ————.

7. මූලික අධ්‍යාපනය ලත් පාඨශාලා සහ විද්‍යාල (ඒවාට ඇතුළත් වූ සහ අස් වූ දින සඳහන් කළ යුතුයි) :————.

8. (අ) ශාස්ත්‍රාලයීය සහ වෘත්තීය සුදුසුකම් (ඒවා ලත් දිනත්, සාමර්ථ්‍යය ලැබූ පෙළත් සඳහන් කළ යුතුයි.) සහතික පිටපත් ද අමුණා එවිය යුතුයි) :————.

(ආ) දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් සහ සිංහල, පාලි හෝ සංස්කෘත භාෂාවන්ගෙන් සාමර්ථ්‍යය ලත් උසස් ම විභාගය :

දෙමළ :————.

ඉංග්‍රීසි :————.

සිංහල :————.

පාළි :————.

සංස්කෘත :————.

(ඇ) සුදුස්සකු වනුයේ ගැසට් නිවේදනයේ 4(අ) ඡේදය හෝ 4(ආ) ඡේදය හෝ යටතේ ද යන බව :————.

9. සාහිත්‍ය කෘතීන් කර පළපුරුදුකම තිබේ නම් විස්තර සඳහන් කරන්න :————.

10. (අ) පාඨශාලාවෙන් හෝ විද්‍යාලයෙන් හෝ අස් වූ පසු නියුක්තව සිටි රක්ෂාවල් ද, ඒ පිළිබඳ වකවානු ද, ලැබූ වැටුප් ද සඳහන් කරන්න :————.

(ආ) රජයේ සේවයේ යෙදී සිටි නම්, දැනට දරන තනතුරුද වාර්ෂික වැටුප ද සඳහන් කරන්න :————.

11. විශේෂ පළපුරුදුකම්, පුහුණුවීම්, සුදුසුකම් සහ හිමිකම් :————.

12. පෞද්ගලික ලෙස ආශ්‍රය කරන තිදෙනකුගේ නම් (තත්ත්වය සහ ලිපිනය සඳහන් කරන්න. මේ අය ඔබේ ඥාතීන් නොවිය යුතුයි) :————.

(1) ........................
(2) ........................
(3) ........................

13. චරිත සහතික දී ඇති අයගේ නම් සහ තත්ත්වය (ඥාතීන් නොවිය යුතුයි. මෑතක දී ලබාගත් චරිත සහතිකවල පිටපත් පමණක් අමුණා එවිය යුතුයි) :————.

14. මුදල් කරදර නැති වූවෙක් ද යන වග ; නැතිනම් ණය ප්‍රමාණය : (ගණන් විස්තර කරන්න) :————.

15. වෙනත් කරුණු :————.

මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි හෝ අසත්‍ය හෝ බව පත්වීම් දෙන්නට පෙර හෙළිවුවහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ද, පත්වීම් ලැබුවාට පසු හෙළි වුවහොත් කිසිම වන්දි ගෙවීමක් නැතිව මා නිලයෙන් අස් කිරීමට ද යටත් වන බව මම දැන සිටිමි. මේ අයදුම්පතෙහි දක්වෙන සියලු විස්තර සත්‍ය හා නිවැරදි බවද මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12–745/3—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### ඇබෑර්තු

### II වෙනි ශ්‍රේණියේ ෆෝර්මන් (සිවිල්) තනතුරු

**සුදුසුකම් හා පළපුරුද්ද.**—එක් වරකදී විෂයයන් තුනකින් සම්මාන සහිතව විෂයයන් හයකින් යුත් අධ්‍යයන පොදු සහතිකය හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය සමඟ 5 වසරක ආධුනිකත්වයක්.

හෝ ඒ ඒ ශිල්පයන් හා අදාලව පුහුණු ශ්‍රේණියක 10 වසරක පළපුරුද්ද.

**වයස.**—අවුරුදු 30 සිට 40 දක්වා.

**වැටුප් පරිමාණය.**—රු. 360—450 මාසික (සියලු දීමනා අඩංගු)
6 × 15

රජයේ දෙපාර්තමේන්තු, අර්ධ රජයේ දෙපාර්තමේන්තු හා රජයේ සංස්ථාවන්හි අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්, ඒ ඒ දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය.

තෝරාගනු ලබන අයදුම්කරුවන් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්වන අතර, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සහ විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා විධිවිධාන පනත ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පනවා ඇති හෝ මතු පනවනු ලබන නියෝගයන් අනුව කටයුතු කළ යුතුය.

තෝරාගනු ලබන අයදුම්කරුවන් වාලච්චේනෙහි හෝ දිවයිනේ පිහිටි සංයුක්ත මණ්ඩලයේ ඕනෑම ආයතනයක සේවය කළ යුතුවනු ඇත.

පත්කිරීම සඳහා තෝරාගනු ලබන්නන් ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව වැටුප් පරිමාණයෙහි සුදුසු පියවරක තබනු ඇත.

මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල අයදුම්කරුවන්ගේ අත් අකුරින් සම්පූර්ණ කරන ලද අයදුම් 1970.1.16 දිනට හෝ ඊට පෙර සාමාන්‍යාධිකාරි වෙතට ලැබෙන සේ පහත ඇති ලිපිනයට එවිය යුතුය.

අයදුම් පත් තැපෑලෙන් ඉල්ලුම් කරන විට තමන්ගේ ලිපිනය සහිත මුද්දර ගැසූ දිග කවරයක් එවිය යුතුය.

මේ සඳහා ඉල්ලුම් කළ යුත්තේ අවශ්‍ය සුදුසුකම් ඇති අය පමණකි.

ති. බ. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරි,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

තැ. පෙ. 1367,
356, යූනියන් පෙදෙස,
කොළඹ 2.
1969.11.27,

12–858/1—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## රත්නපුර දිස්ත්‍රික්කයේ දෙඩම්පෙ කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ කුරුවිටි කෝරළේ කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය සහ උඩරට) රෙජිස්ට්‍රාර් ධුරය

දෙඩම්පෙ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිවීම හේතු කොටගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසි එකට නො අඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත්වන අයට තිබිය යුතු අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳව සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කායර්ාලය, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන සහ කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳපොළවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම්වල ඇතුලත් වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කායර්ාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස්විය යුතු අතර, ඒවා 1970 ජනවාරි 16 වැනි දින හෝ එදිනට ප්‍රථම මාවෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

සී. ජී. ටී. පොන්සේකා,
අතිරේක දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් වෙනුවට.

1969 දෙසැම්බර් 10 වැනි දින,
රත්නපුරේ,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කායර්ාලයේදීය.

12–834—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### ඇබෑර්තු

මෙම සංස්ථාවෙහි පහත සඳහන් තනතුරු සඳහා ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

2. මෙහි අවසානයෙහි දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම් පත් 1969 දෙසැම්බර් මස 31 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ, සේවක මණ්ඩල කළමනාකාරතැන, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, අංක 113, ගාලුපාර, කොළඹ 3, යන ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය.

3. තෝරාගනු ලබන අයදුම්කරුවන්, ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව සුදුසු වැටුප් ලක්ෂ්‍යයන් මත පත් කිරීමට ඉඩ ඇත.

4. මෙහි දක්වා ඇති වැටුප් පරිමාණයන් ඒකාබද්ධ වැටුප් ක්‍රමයන් වේ.

5. රජයේ දෙපාර්තමේන්තුවල හෝ රජයේ සංස්ථාවන්හි හෝ සේවකයින් විසින් එවනු ලබන අයදුම් පත් සලකා බලනුයේ ඔවුන් විසින් ඒවා අදාල දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ හොත් පමණි. භාණ්ඩාගාරයේ අංක 666 හා 1965.8.20 වෙනි දින දරණ චක්‍රලේඛයෙහි දක්වෙන වගන්තිවලට අනුව අදාල නිලධාරියා සිය සේවයෙන් නිදහස් කළහැකිදැයි යන්න දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ ප්‍රධානියා විසින් සඳහන් කළ යුතුයි.

6. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු නොලැබේ. මෙම දැන්වීමෙහි සඳහන් අවශ්‍යතාවයනට අනුකූලව පිළියෙල නොවුනු ඉල්ලුම් පත් කිසිදු දැන්වීමක් නොකර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සේවා කොන්දේසි :—(1) තෝරාගනු ලබන අයදුම්කරුවන්—**

(අ) පත්වීමට පෙර ශාරීරික යෝග්‍යතාව දක්වීම සඳහා වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුය.

(ආ) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම් වස් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරනු ලබන ප්‍රමාණයක සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් ලබාගත යුතුය.

(ඉ) සේවක අර්ථසාධක අරමුදලට සිය වැටුපෙන් 10%ක් දායක විය යුතුය. (ඊට සංස්ථාවෙන් 15%ක් දායක වනු ඇත.)

(ඊ) සංස්ථාවේ ඕනෑම කාර්යාංශයක් යටතේ දිවයිනේ ඕනෑම පලාතක සේවය කිරීම අවශ්‍යය.

(ii) මෙම තනතුරු සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් තුන් අවුරුදු ආධුනික කාල සීමාවකට යටත්ව පත්කරනු ලැබේ.

| තනතුර හා වැටුප් ක්‍රමය | අවශ්‍ය සුදුසුකම් |
|---|---|
| 1. පිටපත්කිරිමේ සැලසුම් කරු<br>බී-4 ශ්‍රේණිය<br>රු. 190—360<br>17 × 10 | (අ) යාන්ත්‍රික ඇඳීමේ විෂයය ඇතුලුව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගය හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය (විෂයයන් 6 කින්) සමත් වී සිටිය යුතුය.<br>(ආ) පිටපත් කිරීමේ සැලසුම්කරුවෙකු වශයෙන් යටත්පිරිසෙයින් අවුරුදු 2 ක පළපුරුද්දක් තිබිය යුතු අතර, වඩාත් පළපුරුදුකම් තිබෙන අය අදාල වැටුප් ක්‍රමයේ සුදුසු වැටුප් ලක්ෂ්‍යයක් මත පත් කිරීමට ඉඩ ඇත. |
| 2. විධායක සහකාර ...<br>ඒ-7 ශ්‍රේණිය<br>රු. 600—1000<br>10 × 40 | (අ) අයදුම්කරුවන් 1969 දෙසැම්බර් මස 1 වෙනි දිනට වයස අවුරුදු 45 කට වැඩි නොවිය යුතුය.<br>(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරීන් (කලා හෝ විද්‍යා) විය යුතුය. ගෞරව උපාධිධරයන් කෙරෙහි හා පරිපාලන කටයුතු පිළිබඳව යටත්පිරිසෙයින් වර්ෂ දෙකක පළපුරුද්දක් ඇති අය කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ. |
| 3. ඉංජිනේරු සහකාර/සහකාර ඉංජිනේරු<br>ඒ-7 ශ්‍රේණිය<br>රු. 600—1000<br>10 × 40 | (අ) අයදුම්කරුවන් 1969 දෙසැම්බර් මස 1 වෙනි දිනට වයස අවුරුදු 45 කට වැඩි නොවිය යුතුය.<br>(ආ) ඉංජිනේරු උපාධිධාරීන් හෝ ඒ හා සමාන වෙනත් සුදුසුකම් ඇති අය විය යුතුය. |

සේවක මණ්ඩල කළමනාකාරතැන.

113, ගාලුපාර, කොළඹ 3.

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|

1. ඉල්ලුම් කරන ලද තනතුර :————.

2. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පෙලපත් නාමය ප්‍රථමයෙන්)

3. මුල් අකුරු සමග නම :————.

4. ලිපිනය :————.

5. උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)

6. ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනට වයස :
අවුරුදු————. මාස————. දින————.

7. පුරවැසි භාවය :————.
(උත්පත්තියෙන්ද, ලියාපදිංචි වීමෙන්ද යන වග)

8. විවාහක/අවිවාහක බව : අවිවාහක බව :————. විවාහක බව ————. දික්කසාද බව :————.

9. අධ්‍යාපනික පසුබිම :

| ඉගෙනීම ලැබූ පාඨශාලාවල් | සාමාර්ථය ලැබූ උසස්ම විභාගයන් සහ වර්ෂයන් | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
|---|---|---|---|---|
| .................. | .................... | ......... | ......... | ......... |
| .................. | .................... | ......... | ......... | ......... |
| .................. | .................... | ......... | ......... | ......... |

10. වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් තිබෙනම් :————.

11. මීට ප්‍රථම කරන ලද රැකියාවන් පිළිබඳ විස්තර :

| ආයතනයේ නම | තත්වය | සිට | දක්වා | අස්වීමට හේතු |
|---|---|---|---|---|
| .................. | ................ | ...... | ...... | .................... |
| .................. | ................ | ...... | ...... | .................... |
| .................. | ................ | ...... | ...... | .................... |
| .................. | ................ | ...... | ...... | .................... |

12. දැනට ලබන වැටුප :————.

13. විශේෂ සුදුසුකම් ඇත්නම් :————.
(ඔබ විසින් හදාරා ඇති ඉගෙනීම/පුහුණුව පිළිබඳ විස්තර සඳහන් කරන්න)

14. වෙනත් කරුණු :————.

15. මෙම දැන්වීමේ තනතුරු සඳහා " අවශ්‍ය සුදුසුකම් " යටතේ සඳහන් සුදුසුකම්/පළපුරුදුකම් එකිනෙක ඔබට ඇති බව දක්වෙන සටහනක් හා එය ඔප්පු කිරීම සඳහා අදාල සහතිකවල පිටපත් ද අමුණා එවිය යුතුයි.

ඉහත සඳහන් විස්තර සියල්ල නිවැරදි බවත්, සත්‍ය බවත්, සඳහන් කළයුතු කිසිවක් වසන් නොකළ බවත් මෙයින් සහතික කරමි. ඉහත සඳහන් විස්තර අසත්‍ය බව හෝ සැපයිය යුතුව තිබූ විස්තර වසන් කර ඇති බව හෝ තෝරා පත්කර ගැනීමට පෙර ඔප්පු වුනිනම් මගේ ඉල්ලුම් පත්‍රය අවලංගු වන බවද තෝරා ගැනීමෙන් පසුව ඔප්පු වුනිනම් කිසිම වන්දියක් නොමැතිව රැකියාවෙන් පහකරනු ලබන බවද මම දනිමි.

දිනය :————.

————
ඉල්ලුම්කරුගේ අත්සන.

12–859—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

## පොළොන්නරුව සුළු නගර සහා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක තනතුර

පොළොන්නරුවේ සුළු නගර සභා ප්‍රදේශය තුළ හදිසි මරණ පරීක්ෂක තනතුර සඳහා අයදුම්පත් පහත දැක්වෙන ආදර්ශ අයදුම් පත්‍රය අනුව පිළියෙළ කර 1970 ජනවාරි මස 15 වැනි දින පෙරවරු 10ට හෝ ඊට ප්‍රථම මා වෙත ලැබෙන සේ එවිය යුතුයි. මේ දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

2. මෙම තනතුර සඳහා සවිර වැටුපක් ගෙවනු නොලැබේ. මරණ පරීක්ෂණය සඳහා එකකට රු. 7.50 බැගින් ගෙවනු ලැබේ.

3. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක් ම—

(අ) ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 30ට නොඅඩු බවට හෝ අවුරුදු 60ට නොවැඩි බවට ;

(ආ) විශිෂ්ට චරිතයෙන් හා මනා සෞඛ්‍යයෙන් යුක්ත බවට ;

(ඇ) ඒ කොට්ඨාශය තුළ සවිර පදිංචිකරුවන් බවට ;

(ඈ) 1925 සහ 1944 අතර කාලයෙහි ස්වභාෂා පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත ඉංග්‍රීසි පාඨශාලා හැර යාමේ සහතික පත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඒ හා සමාන හෝ ඊට උසස් විභාගයකින් සමර්ථවී ඇති බවටත් පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ඉල්ලුම්පත්‍ර සමග පහත සඳහන් සහතිකවල පිටපත් එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය ;

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය ;

(ඇ) චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික දෙකක්. ඉන් එකක් ග්‍රාමසේවකගෙන් විය යුතුයි ;

(ඈ) සවිර පදිංචිය සම්බන්ධයෙන් ග්‍රාමසේවකගේ සහතිකය.

5. ඉල්ලුම්පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ.

කේ. එච්. ජේ. විජයදාස,
පොළොන්නරුවේ දිසාපති.

1969 දෙසැම්බර් මස 6 වැනි දින,
පොළොන්නරුවේ දිසාපති කාර්යාලයේ දීය.

### ආදර්ශ අයදුම්පත

#### පොළොන්නරුවේ සුළු නගර සභා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක තනතුර

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
   (අ) අගට යෙදෙන නම :————.
   (ආ) අනිකුත් නම් :————.
   (ඇ) ලිපිනය :————.

2. සවිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.

3. (අ) 1970 ජනවාරි මස 15 වැනි දිනට වයස : අවු :————. මාස :————, දවස් :————.
   (ආ) උපන් දිනය හා ස්ථානය :————.

4. විවාහකද, අවිවාහකද යන වග :————.

5. අධ්‍යාපන සුදුසුකම් :————.

6. දැනට කරන රක්ෂාව :————.

7. ණයගැතිවී තිබේද ? එසේ නම් විස්තර :————.

8. තමා සතු දේපලවල ප්‍රමාණය හා වටිනාකම :————.

9. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද ? එසේ නම් විස්තර :————.

10. මෙම තනතුර සඳහා ලබා ඇති විශේෂ සුදුසුකම් ඇත්නම් ඒවා :————.

මෙහි සඳහන් කර ඇති යම් කිසි කරුණක් වැරදි හෝ අසත්‍ය බව හෝ පත්වීම ලැබීමට පෙර අනාවරණය වුවහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමටද, පත්වීම ලැබුවාට පසුව අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොගෙවා මා නිලයෙන් පහකරනු ලැබීමටද යටත් විය යුතු බව දනිමි. මෙම අයදුම් පතෙහි දැක්වෙන සියළුම තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

12–805—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිරියාල හත්පත්තුවේ හැටහයේ කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධූරය

අංක 14,876 හා 1969.10.17 වැනි දින දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද ඉහත සඳහන් තනතුර සඳහා ඉල්ලුම් පත් කැඳවීමේ අවසාන දිනය 1970.1.17 වැනි දින දක්වා දීර්ඝ කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

හී. බ. දිසානායක,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිසාපති.

1969.12.6 දා,
කුරුණෑගල දිසාපති කාර්යාලයේදීය.

12–797—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවිලච්චිය කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ නුවරගම්පලාත කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය සහ උඩරට) රෙජිස්ට්‍රාර් ධූරය

මහවිලච්චිය උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ සවිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොටගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසි එකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධූරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධූරය සඳහා ඉදිරිපත්වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳව සියළුම විස්තර මෙම කායඹාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කායඹාල, ග්‍රාමසේවක කායඹාල, පළාත් පාලන ආයතන කායඹාල, ග්‍රාමීය උසාවි, තැපැල් කායඹාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොළවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කායඹාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුලත් වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කායඹාලයෙන් ලබාගතහැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1970 ජනවාරි මස 23 වෙනි දින හෝ එදිනට ප්‍රථම මාවෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

4. අංක 14,872 හා 1969.9.19 දින දරණ ගැසට් පත්‍රයේ පලවූ ඉහත සඳහන් කරුණට අදාල 1969.9.8 දින දරන මගේ නිවේදනය අවලංගු කළ බව සලකන්න.

අසිවත් සමරවික්‍රම,
දිස්ත්‍රික් ලේකම්.

1969 දෙසැම්බර් මස 9 වෙනි දින,
අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කායඹාලයේදීය.

12–825—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගුවන් විදුලි සංස්ථාව

### ප්‍රවාහන නිලධාරි තනතුර

1969. 11. 7 වැනි දින අංක 14,879 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) ඡේදයේ ඉහත සඳහන් පුරප්පාඩුව සඳහා පළකරන ලද නිවේදනය බලන්න.

එම නිවේදනයෙහි සුදුසුකම් යටතේ දැක්වෙන (ඇ) ඡේදය අවලංගු කරන ලද බවත්, අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 1969. 12. 31 දින දක්වා දීර්ඝ කරන ලද බවත් මෙයින් දන්වමි.

නෙවිල් ජයවීර,
අධ්‍යක්ෂ ජනරාල්.

1969 දෙසැම්බර් මස 19 වැනි දින,
කොළඹ 7,
ලංකා ගුවන් විදුලි සංස්ථාවේ දීය.

12–857—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ (මහජන සෞඛ්‍ය සේවා) සෞඛ්‍ය නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අතුරින් අයදුම් පත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් කැඳවනු ලැබේ.

1970 ජනවාරි මස 6 වන දින අයැදුම් පත් භාර ගැනීම අවසන් කෙරේ.

වැඩිදුර විස්තර අවශ්‍ය නම් මෙහි පහත අත්සන් කරන අයගෙන් ලියා විමසන්න. කිසිම ලියවිල්ලක් පහත අත්සන් කරන අයගේ පුද්ගලික නමට නො එවිය යුතු වේ.

ඩී. බී. ගුණසේකර,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

1969 දෙසැම්බර් මස 10 වනදා,
කොළඹ, ගාලු මුවදොර,
තැ. පෙ. අංක 500 හිමි,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ දී ය.

12–791—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

අංක ඊ. 4/69.

## ලංකා පරිපාලන සේවයේ IV වැනි පන්තියට උසස් කිරීමේ විභාගය—1969

1969 සැප්තැම්බර් මස 12 වැනි දිනැති අංක 14,871 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 1969 සැප්තැම්බර් මස 5 වැනි දිනැති නිවේදනය මගින් ප්‍රසිද්ධ කරනු ලැබූ, 1969 දෙසැම්බර් මස පැවැත්වීමට නියමිත ඉහත සඳහන් විභාගය කල්දමා ඇති බව පොදු දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

විභාගය පවත්වනු ලබන දින යථා කාලයේදී දන්වනු ලැබේ.

ඩී. ආර්. ඇල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 දෙසැම්බර් මස 19 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
කොළඹ 1.

12–1055—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ප්‍රායෝගික ගොවි පාසැල්—පුහුණුවීමේ වර්ෂය 1970–71

පහත සඳහන් ගොවි පාසැල්හි 1970–71 පුහුණුවීමේ වර්ෂය 1970 අප්‍රේල් මස 25 වැනි දිනයෙන් ආරම්භ වේ. ගොවි පාසැල්වල ලැයිස්තුවක් සහ එක් එක් පාසැලට බඳවා ගන්නේ කුමන දිස්ත්‍රික්කයේ පදිංචි ඉල්ලුම්කරුවන් ද යන වගත් පහත සඳහන් වේ. ඉල්ලුම්කරුවන් විසින් තම තමන් පදිංචි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි වෙත 1970 ජනවාරි මස 15 වන දිනට ප්‍රථම ඉල්ලුම් පත් එවිය යුතුය.

ගොවි පාසැල්වල පුහුණුවීමේ පාඨමාලාව වෘත්තියක් වශයෙන් ගොවි තැනට බැසීමට තීරණය කර ඇති තරුණ තරුණියන් උදෙසා අදහස් කරනු ලබන්නෙකි. පුහුණුව සමාප්ත කළ පසු ඔවුන්ට රැකියා සැපයීමට ලංකාණ්ඩුව බැඳී නොමැති බවත්, රැකියා බලාපොරොත්තුවෙන් මෙම පාඨමාලාවට ඇතුලත් නොවිය යුතු බවත් අපේක්ෂකයින් විසින් මැනවින් තේරුම් ගත යුතුය.

ඉල්ලුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුවේ :—

(1) 1970 අප්‍රේල් මස 25 වන දිනට ඔවුන්ගේ වයස අවුරුදු 17 ටත් 24 ටත් අතර විය යුතුය.

(2) ඔවුන් පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගයේදී සිංහල/දෙමළ භාෂාව, අංක ගණිතය/ගණිතය සහ අඩු වශයෙන් වෙනත් විෂයයන් හතරකින් (4) සමත්වී සිටිය යුතු වේ.

(3) ඉල්ලුම්කරුවන් අවිවාහක විය යුතුයි.

පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගයේදී කෘෂිකර්මයෙන් සහ වෙනත් විද්‍යා විෂයයන්ගෙන් සමත් වූ අයට, තරුණ ගොවි සමාජවල ක්‍රියාකාරී සාමාජික/සාමාජිකාවන්ට සහ පුහුණුව අවසන් කළ විගස ගොවිතැනෙහි යෙදීමට හැකියාවක් ඇති අයට වැඩි කැමැත්තක් දක්වනු ලැබේ. තරුණ ගොවි සාමාජිකයින් විසින් තම පළාතේ කෘෂිකර්ම උපදේශක සහතික කළ ප්‍රක්ෂෙප සටහන් පොත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

මෙම නිවේදනය අන්තයේ දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සකස් කර ගත් ඉල්ලුම් පත්‍ර ඉල්ලුම්කරුවන් පදිංචි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි වෙත 1970 ජනවාරි මස 15 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුය.

| පාසැල පිහිටි ස්ථානය | | ඉගැන්වීමේ මාධ්‍යය | | කුමන දිස්ත්‍රික්කයන් සඳහාද යන්න |
|---|---|---|---|---|
| **පිරිමි පාසැල් :** | | | | |
| 1. අනුරාධපුරය | ... | සිංහල | ... | අනුරාධපුරය, පොළොන්නරුව, වවුනියා, ත්‍රිකුණාමලය, යාපනය, මන්නාරම |
| 2. අඹේපුස්ස | ... | සිංහල | ... | කෑගල්ල, කොළඹ, කළුතර, රත්නපුරය, ගාල්ල |
| 3. පැල්වෙහෙර | ... | සිංහල | ... | මාතලේ, මහනුවර, නුවරඑළිය |
| 4. බිබිල | ... | සිංහල | ... | මඩකලපුව, මාතර, බදුල්ල, අම්පාරේ, හම්බන්තොට, මොණරාගල |
| 5. වාරියපොල | ... | සිංහල | ... | කුරුණෑගල, පුත්තලම/හලාවත හා කෑගල්ල |
| 6. කිලිනොච්චි | ... | දෙමළ | ... | යාපනය, මන්නාරම, ත්‍රිකුණාමලය |
| 7. වවුනියා | ... | දෙමළ | ... | ඉහත සඳහන් දිස්ත්‍රික්ක හැර ඉතිරි දිස්ත්‍රික්කවල |
| **ගැහැණු පාසැල් :** | | | | |
| 1. වල්පිට | ... | සිංහල | ... | ලංකාවේ සෑම දිස්ත්‍රික්කයක්ම |
| 2. තින්නවැලි | ... | දෙමළ | ... | එම |

පී. ටී. ජිනේන්ද්‍රදාස,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල්).

1969 දෙසැම්බර් 19,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදීය.

### ආකෘති ඉල්ලුම් පත්‍රය

**1970/71 වර්ෂය සඳහා————පිරිමි/ගැහැණු ප්‍රායෝගික ගොවි පාසැලට ඇතුලත් වීම සඳහා ඉල්ලුම් පත්‍රයයි**

1. (i) අයදුම්කරුගේ නම සහ ලිපිනය :————.
   (ii) අයදුම්කරුගේ ස්ථිර පදිංචිය ඇති දිස්ත්‍රික්කය :————.
2. (i) උපන් දිනය :————.
   (ii) 69.4.25 වන දිනට වයස : අවුරුදු :——. මාස : ——.
3. (i) පියාගේ හෝ භාරකරුගේ හෝ නම සහ ලිපිනය :————.
   (ii) පියාගේ හෝ භාරකරුගේ රක්ෂාව :————.
4. අයදුම්කරුගේ පියාට හෝ භාරකරුට හෝ අයිති ඉඩම් පිළිබඳ විස්තරය :

| | ප්‍රමාණය | වගාකර ඇති බෝග |
|---|---|---|
| (i) ගොඩ ඉඩම් | | |
| (ii) වාරිමාර්ග යටතේ වගාකළ හැකි ඉඩම් | | |

(ඉඩම අයිතිය ගැන ග්‍රාම සේවකගේ සහතිකයක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.)

5. අයදුම්කරුගේ සහෝදරියන් හෝ සහෝදරයින් ගණන :————.
6. අවසාන වරට සාමාර්ථය ලැබූ විභාගය :————.
7. විභාගයෙන් සාමාර්ථය ලත් විෂයයන් :—

| | |
|---|---|
| (i) ————. | (v) ————. |
| (ii) ————. | (vi) ————. |
| (iii) ————. | (vii) ————. |
| (iv) ————. | (viii) ————. |

8. අවසන් වරට ඉගෙනුම ලැබූ පාසැල :———.

9. පාසැලේදී ඔබ සහභාගි වූ ක්‍රීඩා යනාදිය :

(අවසානයට ඉගෙනුම ලැබූ පාඨශාලාවේ ප්‍රධානාචාර්‍ය්‍යතුමාගෙන් ලත් චරිත සහ වෙනත් සහතික දෙකක පිටපත් අමුණන්න.)

10. ඔබ තරුණ ගොවි සමාජයක සාමාජිකයෙක්/සාමාජිකාවක් ද ? එසේ නම් සමිතියේ නම, ලියා පදිංචි අංකය සහ ලිපිනය සඳහන් කරන්න :———.

11. තරුණ ගොවි සමාජ කටයුතුවලට ඔබ සහභාගි වූනි නම් එහි විස්තර :———.

12. ගොවිතැන් පිළිබඳ ඔබට පළපුරුද්දක් තිබේද ? :———.

13. කෘෂිකර්මය පිළිබඳ පාඨමාලාවක් හැදෑරීමට ඔබට ඇති වෙනත් සුදුසුකම් :———.

ඉහතින් සඳහන් කර ඇති කරුණු මා දන්නා තරමට නිවැරදි බවත් සත්‍ය බවත් මම සහතික කරමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

12-756—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### ගම්බද උසාවි සභාපතිවරුන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

ගම්බද උසාවි සභාපතිවරුන් සඳහා දනට පවතින වැටුප් ක්‍රමය රු. 7,680 ට සහ රු. 8,880 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිත රු. 6,780 — 7 × 180, 2 × 240 සහ 7 × 360 — රු. 11,040 ක් වේ.

ගම්බද උසාවි සභාපතිවරුන්—

(අ) ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම ඉක්මවීම පිණිස සිය මව් භාෂාවෙන් හෝ ඔවුන්ගේ උසාවිවල නඩු විභාග කරනු ලබන ප්‍රධාන භාෂාවෙන් හෝ යන භාෂා මාධ්‍යයකින් නියමිත පරීක්ෂණයකින්ද ;

(ආ) දෙවන කාර්යක්ෂමතා කඩඉම ඉක්මවීම පිණිස දෙවන භාෂා මාධ්‍යයෙන් ලිහිල් පරීක්ෂණයකින්ද සමත් විය යුතුය.

ඉහත සඳහන් (අ) සහ (ආ) යටතේ භාෂා පරීක්ෂණය පිළිබඳ නිර්දේශය පහත දක්වෙන පරිදි වේ :—

| වාචික පරීක්ෂණය | සමත්වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය (අ) ප්‍රධාන හෝ මව් භාෂාව සියයට ගණන | (ආ) දෙවන භාෂාව සියයට ගණන |
|---|---|---|
| (1) සාකච්ඡා කිරීම සහ අර්ථ නිරූපනය ... ... ... | 75 ... | 50 |
| (2) ඉංග්‍රීසි ලියවිල්ලක්, වාර්තාවක් හෝ වෙනත් නිල ලේඛනයක් සිංහලට හෝ දෙමළට පරිවර්තනය කිරීම ... ... ... ... | 75 ... | 50 |
| (3) සිංහල හෝ දෙමළ ලිපියකින්, පොත්සමකින් හෝ ප්‍රවෘත්ති පත්‍රයකින් උපුටාගත් කොටස් ඉංග්‍රීසියට පෙරළා කියවීම ... ... ... | 60 ... | — |
| **ලිඛිත පරීක්ෂණය** | | |
| (1) සිංහල හෝ දෙමළ භාෂාව— මෙම ප්‍රශ්න පත්‍රය වාග් මාලාව, වාක්‍ය තැනීම, වාක් සම්ප්‍රදය, සාරාංශ ලිවීම සහ වෙනත් ආකාරයෙන් යුත් ගද්‍ය රචනයට අදල වන ප්‍රශ්න වලින් සමන්විත වනු ඇත. සිරිත් පරිදි කෙරෙන පරීක්ෂණවලට වඩා අයදුම්කරුගේ සාමාන්‍ය වාග්මාලාව පැතිර පවත්නා ප්‍රමාණය සහ එහි නියතාර්ථ ලක්ෂණයද වචනාර්ථ නිරූපනයට හා රචනාවලට ව්‍යාකරණ ඥණය යොදු ගැනීමෙහිලා ඔහුගේ සමත්කමද අනුව ව්‍යාකරණ පිළිබඳව ඔහුගේ නිපුණත්වය ද තීරණය කරනු ලැබේ. ... ... ... ... | 60 ... | ප්‍රශ්න පත්‍රයක් නැත. |
| **පරිවර්තනය** | | |
| (2) විවිධ අත් අකුරෙන් ලියන ලද පෙත්සම් හෝ ගම්මුලාදෑනියෙකුගේ කෙටි වාර්තා තුනකින් දෙකක් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම ... ... ... ... | 60 ... | 33 |
| (3) නිල වාර්තාවකින් හෝ ලේඛනයකින් කෙටි පාඨයක් සිංහලට හෝ දෙමළට පරිවර්තනය කිරීම | 60 ... | ප්‍රශ්න පත්‍රයක් නැත. |

මෙම විභාගය සෑම වර්ෂයකම මාර්තු සහ අගෝස්තු මාසයන් හි කොළඹ දී පවත්වනු ලබන අතර, ඒ සඳහා අයදුම් පත්‍ර අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මාර්තු මස විභාගය සඳහා ජනවාරි 15 වැනි දිනට පෙර ද අගෝස්තු මස විභාගය සඳහා ජූනි මස 15 වැනි දිනට පෙරද ලැබෙන සේ එවිය යුතුයි.

සෑහෙන තරම් කල් ඇතුව විභාගය පවත්වනු ලබන දිනය සහ ස්ථානය සඳහන් කාල සටහනක් සෑම අයදුම්කරුවෙකුටම ලැබෙනු ඇත.

මෙම විභාගයට පෙනී සිටීම සඳහා පැමිණෙන සියළුම ගම්බද උසාවි සභාපතිවරුන්ගේ ගමන් වියදම් අපේක්ෂකයා විභාගයට පෙනී සිටීම යුක්ති සහගත යයි විභාගයේ දී ඔහුගේ දක්ෂතාවෙන් පෙනීගිය බැව් පරීක්ෂකයන් සහතික කරන අවස්ථාවලදී රජයේ මුදල් රෙගුලාසිවලට අනුකූල ගාස්තු අනුව රජය විසින් දරනු ලැබේ.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

සිරිමෙවන් අමරසිංහ,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 දෙසැම්බර් 4 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 573,
කොළඹ 12.

12-809—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## යුද්ධහමුදා මූලස්ථානය

**ටොන් 6 යේ ඩීසල් හයිඩ්‍රොලික් ට්‍රක්මවුන්ටඩ් ක්‍රේන් එකක් සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම**

ඩීසල් හයිඩ්‍රොලික් ට්‍රක්මවුන්ටඩ් ක්‍රේන් එකක්—ටොන් 6 යේ, සැපයීම සඳහා වූ ටෙන්ඩර් කොළඹ, බාලදක්ෂ මාවතේ, යුද්ධහමුදා මූලස්ථානයේ, ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින්, 1970 පෙබරවාරි මස 2 වැනි දින පෙරවරු 11 තෙක් භාරගනු ලැබේ.

2. හෝමාගම, පනාගොඩ, යුද්ධහමුදා විජිතයේ, යුද්ධෝපකරණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්වල පිටපත් දෙක බැගින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ, බාලදක්ෂ මාවතේ, යුද්ධහමුදා මූලස්ථානයේ, යුද්ධහමුදා සිවිල් පාලක හා ගණකාධිකාරී කාර්යාලයයේ, සිවිල් පාලක හා ගණකාධිකාරී වෙත, ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 100 ක් තැන්පත් කොට ලබාගත් රිසිට්පත් ඉදිරිපත් කිරීමෙන්, 1970 පෙබරවාරි මස 1 වැනි දින දවල් 12 වනතෙක්, ටෙන්ඩර් ආකෘතිපත් ලබාගත හැකිය.

3. හෝමාගම, පනාගොඩ යුද්ධහමුදා විජිතයේ, යුද්ධෝපකරණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් විමසා, සාමාන්‍ය කාර්යාල වේලාවන් තුල දී මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැනගත හැකිය.

එම්. එල්. ඩී. ඒ. පෙරේරා,
කර්නල්,
යුද්ධහමුදාපති වෙනුවට.

1969 දෙසැම්බර් මස 9 දින,
හෝමාගම, පනාගොඩ,
යුද්ධහමුදා විජිතයේ
යුද්ධෝපකරණ අධ්‍යක්ෂ මණ්ඩලයේ දීය.

12–760/1—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## යුද්ධහමුදා මූලස්ථානය

**"පෝටබල් කොම්ප්‍රෙෂර් යූනිට්" එකක් සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම**

"පෝටබල් කොම්ප්‍රෙෂර් යූනිට්" එකක් සැපයීම සඳහා වූ ටෙන්ඩර් පත්, 1970 පෙබරවාරි 2 වැනි දින පෙරවරු 10 තෙක්, කොළඹ, බාල දක්ෂ මාවතේ, යුද්ධහමුදා මූලස්ථානයේ, ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් භාරගනු ලැබේ.

2. හෝමාගම, පනාගොඩ, යුද්ධහමුදා විජිතයේ, යුද්ධෝපකරණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්වල පිටපත් 2 බැගින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ, බාලදක්ෂ මාවතේ, යුද්ධහමුදා මූලස්ථානයේ, යුද්ධහමුදා සිවිල් පාලක හා ගණකාධිකාරී කායර්ාලයයේ, සිවිල් පාලක හා ගණකාධිකාරී වෙත, ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 100 ක් තැන්පත් කොට ලබාගත් රිසිට්පත් ඉදිරිපත් කිරීමෙන්, 1970 පෙබරවාරි මස 1 වැනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ආකෘතිපත් ලබාගත හැකිය.

3. මේ සම්බන්ධ වැඩිදුර විස්තර හෝමාගම, පනාගොඩ, යුද්ධහමුදා විජිතයේ යුද්ධෝපකරණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් සාමාන්‍ය කායර්ාල වේලාවන් හි දී ලබාගත හැකිය.

එම්. එල්. ඩී. ඒ. පෙරේරා,
කර්නල්,
යුද්ධහමුදාපති වෙනුවට.

1969 දෙසැම්බර් මස 9 දින,
හෝමාගම, පනාගොඩ,
යුද්ධහමුදා විජිතයේ
යුද්ධෝපකරණ අධ්‍යක්ෂ මණ්ඩලයේ දීය.

12–760/2—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

1969-70 මුදල් වර්ෂය තුල මන්නාරම උප කොට්ඨාශයේ ගබඩා ප්‍රවාහණය කිරීම සඳහා උතුරු කොට්ඨාශය භාර වවුනියාවේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1970 ජනවාරි මස 2 වැනි සිකුරාදා පෙරවරු 10 දක්වා ටෙන්ඩර් අයදුම් පත් භාරගනු ලැබේ.

2. මන්නාරම, වවුනියාව, මුලතිව් සහ යාපනය යන වාරිමාර්ග ඉංජිනේරු කායර්ාල වලින් ලබාගත හැකි පෝරමවල දෙපිටපතකින් ටෙන්ඩර ඉදිරිපත් කළ යුතුය. වැඩි විස්තර මන්නාරම උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයෙන් කාර්යාල වේලාවන් තුලදී ලබාගත හැක.

3. ටෙන්ඩර අයදුම්පත් 1969.12.20 වෙනි දින සිට 1969.12.28 වෙනි දින දක්වා නිකුත්කරනු ලැබේ. තමන්ට අයත් වාහනයක් ඇත්තා වූද, රුපියල් 15,000 කට හෝ ඊට වැඩි මුදලකට වාරිමාර්ග දෙපාර්ත මේන්තුවේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ටෙන්ඩර පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන් විසින් ඉහත සඳහන් වාරිමාර්ග උප කොට්ඨාශයක හෝ ඕනෑම කච්චේරියක රුපියල් 25 ක් තැන්පත් කර ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතු අතර ඔවුන්ගේ ලියාපදිංචි පොත් හා දැනට ඔවුන් දෙපාර්තමේන්තුවේ කරන වැඩ සහ ඒවායේ වටිනාකම් දැක්වෙන ප්‍රකාශ යක්, ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරුතැන වෙත ඉදිරිපත් කළ යුතුය.

කේ. සිවසුබ්‍රමනියම්,
වාරිමාර්ග ඉංජිනේරු,
මන්නාරම උප කොට්ඨාශය.

මුරුන්තන්,
5.12.69.

12–764—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මහනුවර උප කොටස

පල්ලෙකැලේ නව නගරයෙහි යෝජිත ප්‍රවේශ මාර්ග ඉදිකිරීම සඳහා, පහත උපලේඛනයේ සඳහන් අයුරු, ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර, කුන්ඩසාලේ වාසී, මධ්‍යම කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1970 ජනවාරි මස 9 වැනි දින පෙ.ව. 10 දක්වා භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම සිදු කරනු ලැබේ.

| පාරේ සලකුණ | දිග | ලියාපදිංචිය | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|---|
| (1) ඊ.එෆ්. ... ... ... ... | දම්වැල් 45 යි ... | රු. 1,50,000 හෝ ඊට වැඩි ... | රු. 200 |
| (2) කේ.ඊ. (කේ.ඇල්. සහ එල්.ඊ.) ... ... | දම්වැල් 38 යි ... | එම ... | එම |
| (3) එල්.ජී. ... ... ... ... | දම්වැල් 38 යි ... | එම ... | එම |
| (4) සී.අයි. ... ... ... ... | දම්වැල් 38 යි ... | එම ... | එම |
| (5) සී.ඩී. ... ... ... ... | දම්වැල් 60 යි ... | එම ... | එම |
| (6) එච්.ඩී. හා ඩී.ඊ. ... ... ... | දම්වැල් 55 යි ... | එම ... | එම |
| (7) එක්ස්.වයි.ඉසෙඩ්. ... ... ... | දම්වැල් 53 යි ... | එම ... | එම |
| (8) ඩබලිව්.වයි. ... ... ... | දම්වැල් 37 යි ... | එම ... | එම |

2. ඉහත සඳහන් පරිදි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, ප්‍රසිඩ වැඩ දෙපාර්තමේන්තුවේ හා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන් වේ ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන්ට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට මේ සඳහා ඉල්ලුම් කිරීමට ඉඩදෙනු ලැබේ.

3. මහනුවර/මාතලේ/හසලක/නුවරඑළිය යන වාරිමාර්ග කාර්යාලයකින් දෙපිටපතකින් ලබාගත් අයදුම්පත්වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මෙම අයදුම් පත් නිකුත් කරනු ලබන්නේ 1970 ජනවාරි මස 7 වැනි දින ප.ව. 4.30 දක්වා පමණකි. නියමිත තැන්පත් මුදල ඕනෑම කච්චේරියක හෝ ඉහත සඳහන් කළ වාරිමාර්ග කාර්යාලයක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් එකී වාරිමාර්ග කාර්යාලයකින් ටැන්ඩර් පත් ලබාගත හැක. මෙසේ ටෙන්ඩර් පත් ලබාගැනීමට බලාපොරොත්තු වන ඉල්ලුම්කරුවන් තම තමන්ගේ ලියාපදිංචි පොත් ටෙන්ඩර් පත් ලබා ගන්නා කාර්යාලයට ඉදිරිපත් කළ යුතු වන්නේය. ටෙන්ඩර් පත් දෙපිටපතකින් ඉදිරිපත් කළ යුතුවා මෙන්ම ලියාපදිංචි කළ සීල් තබන ලද කවරයක විය යුතුය.

4. මෙම වැඩ සඳහා අවශ්‍ය බඩු බාහිරාදිය කිසිවක් දෙපාර්තමේන්තුවෙන් නිකුත් නොකරන බවද දැනගත යුතුය.

5. යෝජිත මාර්ග දැක්වෙන සැලැස්මක් මහනුවර උප කොටසේ වාරිමාර්ග ඉංජිනේරු භාරයේ ඇති අතර රාජකාරි වේලාවන් තුලදී පරීක්ෂාකර බැලීමට ඉඩදෙනු ලබන බවද දන්වමි.

ඒ. ටී. ජේ. ද පින්ටෝ,
මහනුවර වාරිමාර්ග ඉංජිනේරු තැන,
මහනුවර උප කොටය.

1969 දෙසැම්බර් මස 5 වැනි දින,
කුන්ඩසාලේ දී ය.

12–771—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—නිකවැරටිය උප කොටස

නිකවැරටිය උප කොට්ඨාශයේ පහත සඳහන් වැව් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ටෙන්ඩර් පත් 1970 ජනවාරි 13 වෙනි අඟහරුවාද පෙ. ව. 10 දක්වා කුරුණෑගල වයඹ කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදුකෙරේ.

| | වැඩ විස්තරය | ටෙන්ඩර් කරුගේ ලියාපදිංචි මුදල රු. | ශ. | | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ශ. |
|---|---|---|---|---|---|---|
| (1) | පාලුදිවුල් වැව ප්‍රතිසංස්කරණය කිරීම | 96,000 | 0 | ... | 200 | 0 |
| (2) | අලුත්ගම නැබඩාව වැව ප්‍රතිසංස්කරණය කිරීම ... ... | 35,000 | 0 | ... | 50 | 0 |
| (3) | වන්නිකුඩා වැව වැඩිදියුණු කිරීම ... | 25,000 | 0 | ... | 25 | 0 |

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහතින් දැක්වෙන ප්‍රමාණයට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති වලට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැකිය.

3. 1970 ජනවාරි මස 10 වෙනි සිකුරාද (එදිනද ඇතුළුව) කාර්යාල වේලාව තුලදී කුරුණෑගල/නිකවැරටිය/පුහුණු කිරිමේ මධ්‍යස්ථානය, ගල්ගමුව යන වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘතිපත් වල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් ආකෘති පත් සඳහා ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශනයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතු ද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත් නිකුත් කිරීමට ප්‍රථම ඉහත දැක්වෙන පිළිවෙළට ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායඹාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මෙම ටෙන්ඩරය ගැන සියළුම විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැළසුම, විශේෂ විස්තර යනාදිය කාර්යාල වේලාවන් තුලදී නිකවැරටිය උප කොටසේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

කේ. එස්. සිතම්පරපිල්ලෙයි,
වාරිමාර්ග ඉංජිනේරු,
නිකවැරටිය උප කොට්ඨාශය.

1969 නොවැම්බර් මස 29 වෙනි දින,
නිකවැරටිය වාරිමාර්ග කායඹාලයේ දීය.

12–772—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය

### පරණ පුවත් පත්, කාර් ටයරයන් හා ටියුබයන් විකිණීම

පහත සඳහන් භාණ්ඩයන් විකිණීම සඳහා 1969 දෙසැම්බර් 28 වැනි දින පෙ. ව. 10 දක්වා කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් මිළ ගණන් බාරගනු ලැබේ :—

| අංක | | භාණ්ඩ විස්තරය | | දළ ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1 | ... | පරණ පුවත්පත් ... | ... | හොණ්ඩර 5 යි |
| 2 | ... | පරණ හැන්සාඩ් වාර්තා | ... | හොණ්ඩර 2 යි |
| 3 | ... | පරණ ගැසට් පත්‍ර ... | ... | හොණ්ඩර 5 යි |
| 4 | ... | මිචැලින් X ටයරයන් 165 × 15 යේ | ... | 38 යි |
| 5 | ... | මිචැලින් X ටියුබයන් 165 × 15 යේ | ... | 22 යි |

2. මෙම භාණ්ඩයන් 69.12.19 වැනි දින සිට 69.12.27 වැනි දින දක්වා සාමාන්‍ය කාර්යාල වේලාවන් තුළදී කොළඹ 2, යූනියන් පෙදෙස, අංක 330, දරණ ස්ථානයේ පිහිටි මෙම අමාත්‍යාංශ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇත.

3. ලිඛිත මිළ ගණන් කොළඹ 2, යූනියන් පෙදෙස, අංක 330 දරණ ස්ථානයේ පිහිටි කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති අමතා '' පරණ පුවත්පත් යනාදිය මිළයට ගැනීම සඳහා මිළ ගණන් '' යනුවෙන් කවරයේ සඳහන් කර, මුද්‍රා තබා ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි. එසේ නැතහොත් ඒවා කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශ කාර්යාලයයේ ඒ සඳහා තබා ඇති ටැන්ඩර් පෙට්ටියෙහි බහාලිය යුතුයි.

4. තමන් මිළයට ගැනීමට කැමැති භාණ්ඩයන් සඳහා ටැන්ඩර්කරුවන් විසින් මිළ ගණන් සඳහන් කිරිම මැනැවි. අංක 1–3 දක්වා වූ භාණ්ඩයන් සම්බන්ධයෙන් නම්, හොණ්ඩරයක් බැගින් මිළ ගණන් දැක්විය යුතු අතර, අංක 4 සහ 5 සම්බන්ධයෙන් නම් මුළු තොගයම සඳහා මිළ ගණන් දැක්විය යුතුයි.

5. මිළ ගණන් 69.12.28 වැනි දින පෙ.ව. 10 ට විවෘත කරනු ලැබේ. මිළ ගණන් විවෘත කරන අවස්ථාවේ දී පැමිණ සිටීමට ටැන්ඩර්කරුවන් කැමැති නම්, ඔවුන්ට එසේ කළ හැක.

6. සාර්ථක ටැන්ඩර්කරු විසින් සිය මිළ ගණන් පිළිගත් බවට දැනුම් දීමක් ලැබී දින 7 ක් ඇතුළත තමන් විසින් ටැන්ඩර් කරනු ලැබූ මුළු මුදල් ප්‍රමාණයම ගෙවිය යුතු අතර, එම භාණ්ඩයන් එම ගෙවීම කර දින 2 ක් ඇතුළත දී ඉවත් කර ගෙන යා යුතුයි.

ඩී. සී. ඊ. ඇස්. සිරිමාන්න,
ස්ථිර ලේකම් වෙනුවට.

කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය,
330, යූනියන් පෙදෙස,
කොළඹ 2,
1969.12.12 දින.

12–762—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### බතලගොඩ සහ වාරියපොල රජයේ ගොවිපලවල ලෙලි පොල් විකිණීම

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කායඹාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, බතලගොඩ රජයේ ගොවිපලේ ලෙලි පොල් 30,000ක් පමණ හා වාරියපොල රජයේ ගොවිපලේ ලෙලි පොල් 25,000ක් පමණ විකිණීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පහත සඳහන් කොන්දේසි අනුව 1970 ජනවාරි මස 9 වන දින පස්වරු 2.30 වන තෙක් භාරගනු ලැබේ.

(i) පොල් විකිණීම සඳහා තෝරාගනු ලබන ටෙන්ඩර්කරුට ඒ බව දන්වා සති දෙකක් ඇතුළත සම්පූර්ණ පොල් තොගය ගොවිපලේ කළමනාකරුට එකවර මුදල් ගෙවා භාරගෙන එකී ගොවිපලෙන් බැහැර කරගත යුතුයි.

(ii) පොල් තොගය භාරගැනීමේදී කිසිම පිළිවෙලක වර්ග කිරීමකට ඉඩ නැත. එමෙන්ම කුණුවූ හෝ කුඩාවූ හෝ වශයෙන් වර්ග කිරීමටද ඉඩ නැත.

2. පේරාදෙණියේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කායඹාලයෙන් ලබා ගන්නා ලද ෆෝර්මවල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

සෑම ටෙන්ඩර්පත්‍රයක්ම දෙපිටපතකින් යුක්ත විය යුතු අතර, නිසි ලෙස අත්සන් කොට මුද්‍රා තැබූ කවරවල බහා "පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කායඹාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති" නමට ඉදිරිපත් කළ යුතුයි. කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි බතලගොඩ/වාරියපොල ගොවිපලේ ලෙලි පොල් මිළට ගැනීම සඳහා ටෙන්ඩර් කියා සඳහන් කළ යුතුයි.

3. එක් එක් ටෙන්ඩර්පත්‍රයක් වෙනුවෙන් රුපියල් 25ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැක. 1970 ජනවාරි මස 9 වන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ මෙම ටෙන්ඩර් ගාස්තු තැන්පත් කළ හැක. ගිවිසුම් පත්‍ර අත්සන් කළ පසු මෙම මුදල් ආපසු ගෙවනු ලැබේ. තෝරාගත් ටෙන්ඩර්කරු වෙත ටෙන්ඩරය භාරගත් බව දන්වා දින 10 ක් ඇතුළත අවශ්‍ය ඇප

මුදල තැන්පත් කිරීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකිවිණි නම්, ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් ගාස්තුව රාජසන්තක කරනවාත් හැර, ඔහුගේ නම රජයේ කොන්ත්‍රාත්තු පැහැර හැරියවුන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනු ලැබේ. එහෙත් මේ නිසා ඔහුගෙන් රජයට අයවිය යුතු යම් මුදලක් වෙතොත් එය අයකර ගැනීමට බාධාවක් නොවේ.

4. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුයි. නැතහොත් මුද්‍රා තැබූ කවරවල බහාලන ලද ටෙන්ඩර්පත්‍ර "බතල ගොඩ සහ වාරියපොල ගොවිපලවල ලෙලි පොල් මිළට ගැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් ද, 'ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද කවරයේ සඳහන් කොට "පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන" වෙත ටෙන්ඩර්කරු විසින්ම හෝ ඔහුගේ නියෝජිතයින් විසින් පුද්ගලිකව භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන දිනම, ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුණි නම්, ඒ බව පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ඔහු විසින්ම වහාම දැන්විය යුතුයි.

5. කැමති නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර ඇත. ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන අවසාන දින එකී වේලාවට පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්‍යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

6. නියමිත ෆෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර්පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුවේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කොට සති තුනක් ගතවනතුරු ටෙන්ඩර් පත්‍රිකා පිළිගැනීම සඳහා ඉඩ ඇති බව ටෙන්ඩර්කරුවන් විසින් සැලකිය යුතුයි.

9. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද, පිළිගනු ලැබුවාවූද, දේවල මුළු ගණනින් සියයට පහක (5%) ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමා නාමින් තැන්පත් කිරීමටත්, ගිවිසුම් පත්‍රයක් අත්සන් කිරීමටත්, පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකර නිමවූ විට පමණකි. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා මෙම කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

10. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

11. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන ඒවා විය යුතුයි.

12. කිසියම් ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේත් කිසියම් ටෙන්ඩරයක කොටසක් පමණක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා සතුය.

13. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින්, මෙම කොන්ත්‍රාත්තුව යටතේවූ වැඩ කරවා ගැනීමට, පුහුණු හා නුපුහුණු හා දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු අතර, ඔව්හු පමණක් එසේ නියුක්ත කළ යුතුයි. ඒ කම්කරුවන් හැකිතරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එලැඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වරයාගේ එකගත්වය ඇතිව, නිශ්චිතව ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක. එවැනි ලිඛිත බලයක් හා එකගත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සළකනු ලැබේ.

මෙම කොන්ත්‍රාත්තුව අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූද, කම්කරුවනට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බල පවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියලුම රෙගුලාසිවලට අනුකූලවූද වේතනයන් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චැක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. පෞද්ගලිකව ටෙන්ඩර්කරුවෙත භාරදෙන ලද හෝ ටෙන්ඩර් පත්‍රයේ සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් යවන ලද හෝ ටෙන්ඩරයට අදාල සෑම දැන්වීමක්ම ටෙන්ඩර්කරු අතට පත් කළා සේ සළකනු ලැබේ.

15. 1934 වර්ෂයේ අංක 19 දරණ කම්කරු ආඥාපනතේ (117 වන අධිකාරිය) යටතේ සේවයෙහි යොදන ලද කම්කරුවෙකු විසින් හෝ කම්කරුවෙකු වෙනුවෙන් ඉල්වනු ලබන වන්දියකින් කොන්ත්‍රාත්කරු විසින් රජය නිදහස් කළ යුතුයි.

16. ටෙන්ඩර්කරු විසින් වැඩට ගන්නා යම් සේවකයෙකු සේවයේ යෙදවීමට අහිතකර දෙයක් ලෙස සළකා ඊට විරෝධය දැක්වීමේත්, යම් සේවකයෙකු සේවයේ යෙදවීමට කලින් විරුද්ධවීමේත් බලය රජය සතු වන්නේය.

17. වැඩ පැහැර හරින කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ රජය මගින් තබා ඇති ලේඛනයේ තනි තනිව හෝ ලේඛනයේ නම් සඳහන් වෙනත් අයෙකුගේ නම සමඟ හෝ ඇතුළු වී සිටින යම් පුද්ගලයකු සමඟ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාට හැඟී යන හේතු නිසා හෝ කොන්ත්‍රාත්තුව භාරදීමට නුසුදුස්සෙකු ලෙස සලකා ඔහු විසින් විරෝධය දක්වන කිසිවෙකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

18. මේ ගැන වැඩි විස්තර බතලගොඩ හා වාරියපොල ගොවිපලවල කළමනාකරුවන්ගෙන් දැනගත හැකිය.

පී. වී. ජිනේන්ද්‍රදාස,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ
(කෘෂිකර්ම, අධ්‍යාපන හා ගොවිපලවල්).

1969 දෙසැම්බර් මස 2 වන දින,
පේරාදෙනියේ,
ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්‍යාලයේ දීය.

12-754—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ—නිවාස ඉදි කිරීම

මෙහි පහත සඳහන් ගණයන් යටතේ ඇති ගොඩනැගිලි ඉදි කිරීම සඳහා පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970. 1. 24 දින අ. භා. 2.30 දක්වා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ. එක් එක් ගණයන් යටතේ ඇති ගොඩනැගිලි සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතු අතර එක් එක් ගණයේ ගොඩනැගිලි වෙනුවෙන් හෝ ගණයන් කිහිපයක් වෙනුවෙන් හෝ ටෙන්ඩර් කිරීමට අවකාශ ඇත.

(අ) 3 බී වර්ගයේ නිවාස 2 ක්—අම්පාර.

(ආ) 3 ඒ වර්ගයේ නිවාස 2 ක්—සීතා එළිය ගොවිපල, නුවර එළිය.

(ඉ) 3 බී වර්ගයේ නිවාස 1 ක්—බෝඹුවෙල ගොවිපල—(කළුතර දිස්ත්‍රික්කය).

(ඊ) 3 බී වර්ගයේ නිවාස 1 ක්—මහඔය (මොනරාගල දිස්ත්‍රික්කය).

(උ) 3 බී වර්ගයේ නිවාස 1 ක්—ගන්නෝරුව, පේරාදෙණිය.

කොළඹ 5, නාරාහේන්පිට පලතුරු කම්හල පාරේ, සිවිල් ඉංජිනේරු අංශයේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උපදේශක ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැකි ෆෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරුද ලබා ගත හැකිය.

සෑම ටෙන්ඩර් ඉල්ලුම් කරුවෙකුම (අ) සිට (ආ) දක්වා ගණයන් යටතේ ඇති ගොඩනැගිලි සඳහා රු. 75,000 කටද, (ඉ) සිට (උ) දක්ව ගණයන් වෙනුවෙන් රු. 35,000 කට නොඅඩු කොන්ත්‍රාත්

භාර ගැනීමට ටෙන්ඩර්කරුවන් වශයෙන් රජයේ දෙපාර්තමේන්තුවක ලියාපදිංචි වූ අය විය යුතුය.

පහත සඳහන් ලිය කියවිලි ඉදිරිපත් කළ විට 1970. 1. 10 දින ප. ව. 4 දක්වා ටෙන්ඩර් පත් ලබා ගත හැකිය :—

(අ) 3 ඡේදයේ සඳහන් අයුරු ලියාපදිංචි වී ඇති බව ඔප්පු කිරීම.

(ආ) (අ) සිට (ආ) දක්වා ගොඩනැගිලි සඳහා එක් ගණයකට රු. 100 බැගින් ද, (ඉ) සිට (උ) දක්වා එක් ගණයකට රු. 50 බැගින් ද, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සියක්.

ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙණියේ, කෘෂිකම් දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකම් අධ්‍යක්‍ෂවරයාගේ අංක 37 දරණ ගිණුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකම් අධ්‍යක්‍ෂක වෙනුවට.

කෘෂිකම් දෙපාර්තමේන්තුව,
සිවිල් ඉංජිනේරු කාර්යාලය,
පලතුරු කම්හල පාර,
නාරාහේන්පිට,
කොළඹ 5,
1969. 12. 12.

12–831—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### අළුත් ගෝනි සැපයීම සඳහා ටෙන්ඩර්

ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය 1970 ජනවාරි මස 17 වැනි දින දක්වා දීර්ඝකර ඇත. වැඩි විස්තර සඳහා 1969 නොවැම්බර් මස 28 වැනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය බලන්න.

ඊ. එල්. එෆ්. අබේරත්න,
කෘෂිකර්ම අධ්‍යක්‍ෂ වෙනුවට.

12–1029/1—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### අළුත් ගෝනි සැපයීම සඳහා ටෙන්ඩර්

අංක 14,882 හා 1969.11.28 වැනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පළවූ දැන්වීම සම්බන්ධයෙන් ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය 1970.1.17 දින දක්වා දීර්ඝ කරනු ලැබ ඇත. ටෙන්ඩර් පත් 1970.1.17 වැනි දින පස්වරු 2.30ට විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් ෆෝර්ම 1970.1.16 වැනි දින දහවල් 12 දක්වා ලබාගත හැක. කොළඹ 2, වොක්ෂෝල් වීදියේ අංක 315 හි පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් 1970.1.2 වැනි දිනට පසු ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැක.

ඊ. එල්. එෆ්. අබේරත්න,
කෘෂිකර්ම අධ්‍යක්‍ෂ වෙනුවට.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 536,
ගෝටන් පෙදෙස, කොළඹ 7,
1969.12. දින.

12–1029/2—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකම් දෙපාතීමේන්තුව

මිල ගණන් කැඳවීමේ පත් අංකය : එල්.කිව්./ඕ.ඊ.වී/905/1.

පහත දක්වා ඇති විස්තර අයුරු කැන්වස් කූඩාරම් 30 ක් සැපයීම සඳහා පේරාදෙනිය, කෘෂිකම් දෙපාතීමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970 ජනවාරි 25 වෙනි දින පෙරවරු 10.30 තෙක් මිල ගණන් භාරගනු ලැබේ.

**අංකය :**

1. පැති ආවරණයෙන් යුක්ත, ඇතුලත ප්‍රමාණය වර්ග අඩි 100 ක් පමණ ඇති වටේ බිම සිට උස අඩි 5 කට නොඅඩු කැන්වස් කූඩාරම් ඊට අවශ්‍ය අනෙකුත් සියළුම ආම්පන්න සහිතව සැපයීමට (විශේෂ විස්තර සඳහා මෙහි ඉංග්‍රීසි අනුවාදය බලන්න).

2. මිල ගණන් බහාලූ ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ "කැන්වස් කූඩාරම් 30 ක් සැපයීම සඳහා මිල ගණන් පත් අංක එල්.කිව්/ඕ.ඊවී. 905/1" යන්න සඳහන් කර පේරාදෙනියේ කෘෂිකම් දෙපාතීමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත මිල ගණන් වැසීමට නියමිත වේලාවට පෙර ලැබෙන්නට සැලැස්විය යුතුය.

3. මිල දැක්විය යුත්තේ—

අංක : 1 ගබඩාවෙන් ලබාගැනීමටය.

4. පිළිගත් ටෙන්ඩර්කරු තමාගේ මිල ගණන් භාරගෙන ඇති බවට දන්වා එවන ලිපියේ දින සිට සති තුනක් (3) ඇතුලත එම ද්‍රව්‍ය භාර දීම කළ යුතුයි.

5. කිසිම වග විභාගයක් නොමැතිව එවන ලද ඕනෑම් මිල කැඳවීමක් ප්‍රතික්‍ෂෙප කිරීම හෝ එම මිල කැඳවීමකින් කොටසක් පිළිගැනීමේ හෝ බලය කෘෂිකම් අධ්‍යක්‍ෂ සතුය.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
කෘෂිකම් අධ්‍යක්‍ෂ වෙනුවට.

කෘෂිකම් දෙපාතීමේන්තුව,
ඉංජිනේරු අංශය,
පේරාදෙණිය,
1969. 12. 7.

12–753/1—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකම් දෙපාතීමේන්තුව

මිල ගණන් කැඳවීම් පත් අංකය : එල්.කිව්./ඕ.ඊ.වී 905/2.

පහත දක්වා ඇති විස්තර අයුරු ඉන්-බෝර්ඩ් මෝටෝර්ස් සැපයීම සඳහා පේරාදෙනිය, කෘෂිකම් දෙපාතීමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970 ජනවාරි 25 වෙනි දින පෙරවරු 10.30 තෙක් මිල ගණන් භාරගනු ලැබේ.

**අංකය :**

2. පැට්‍රොල් හෝ භූමිතෙල්වලින් ක්‍රියා කරන, අශ්ව බල 10 කට නොඅඩු, අවර රෝද, තෙල් ටැංකිය, විදුලි බලයෙන් පටන් ගන්නා ක්‍රමය ඇති ඉන්-බෝර්ඩ් මොටෝර්ස් 6 ක් සැපයීම සඳහා (විශේෂ විස්තර සඳහා මෙහි ඉංග්‍රීසි අනුවාදය බලන්න).

2. මිල ගණන් බහාලූ ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ "ඉන්-බෝර්ඩ් මොටෝර්ස් හයක් සැපයීම සඳහා මිල ගණන් පත් අංක එල්කිව්/ඕඊවී. 905/2" යන්න සඳහන් කර පේරාදෙනියේ කෘෂිකම් දෙපාතීමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත මිල ගණන් වැසීමට නියමිත වේලාවට පෙර ලැබෙන්නට සැලැස්විය යුතුය.

3. මිල දැක්විය යුත්තේ—

අංක 2 ගබඩාවෙන් ලබා ගැනීමටය.

4. පිළිගත් ටෙන්ඩර්කරු තමාගේ මිල ගණන් භාරගෙන ඇති බවට දන්වා එවන ලිපියේ දින සිට සති තුනක් (3) ඇතුලත එම ද්‍රව්‍ය භාර දීම කළ යුතුයි.

5. කිසිම වග විභාගයක් නොමැතිව එවන ලද ඕනෑම මිල කැඳවීමක් ප්‍රතික්‍ෂෙප කිරීම හෝ එම මිල කැඳවීමකින් කොටසක් පිළිගැනීමේ හෝ බලය කෘෂිකම් අධ්‍යක්‍ෂ සතුය.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
කෘෂිකම් අධ්‍යක්‍ෂ වෙනුවට.

කෘෂිකම් දෙපාතීමේන්තුව,
ඉංජිනේරු අංශය,
පේරාදෙනිය,
1969. 12. 7.

12–753/2—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පහත දක්වා ඇති විස්තර අයුරු ගොඩනැගිලි උපකරණ නාරාහේන්පිට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩපල හා යන්ත්‍රාගාරයට ගෙනැවිත් භාරදීම සඳහා පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 ජනවාරි 4 වැනි දින දවල් 12 දක්වා මිළ ගණන් කැඳවනු ලැබේ.

| අංකය | විස්තර | | ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | අඟල් 6 × අඟල් 9 සක්ක ගල් | කියුබ් | 400 යි |
| 2 | අඟල් 2 කළුගල් කැලි | ,, | 50 යි |
| 3 | අඟල් ¾ කළුගල් | ,, | 10 යි |
| 4 | ගල් කුඩු | ,, | 10 යි |
| 5 | ග්‍රැවල් | ,, | 100 යි |
| 6 | පස් | ,, | 200 යි |
| 7 | ගංගා වැලි | ,, | 100 යි |
| 8 | දිය හුණු | බුසල් | 400 යි |

අංක 1, 2 සහ 3 කියුබ් අනුව, ගොනුකර භාරදිය යුතුයි.

2. මිළ ගණන් බහාලූ ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ "ගොඩනැගිලි උපකරණ සඳහා" යන්න සඳහන් කර පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත මිළ ගණන් වැසීමට නියමිත වේලාවට පෙර ලැබෙන්නට සැලැස්විය යුතුයි.

3. පිළිගත් ටෙන්ඩර්කරුට ගිවිසුමකට එළඹීමට සිදුවන අතරම ටෙන්ඩර් කරන ලදුව පිළිගනු ලැබුවාවූ වැඩ කොටස්වල මුළු වටිනාකමින් සියයට 5ක මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ නමින් තැන්පත් කිරීමට සිදු වේ. මෙම මුදල ආපසු ගෙවනු ලබන්නේ කොන්ත්‍රාත්තු සාර්ථක ලෙස ඉටු කළ පසුය. පිළිගත් ටෙන්ඩර්කරුට කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට නොහැකි වුවහොත් ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක කර, රජය මගින් තබා ඇති වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නම් ලේඛනයෙහි එම ටෙන්ඩර් කරුගේ නමද ඇතුළත් කරනවා ඇත.

4. පිළිගත් ටෙන්ඩර්කරු තමාගේ මිළ ගණන් භාරගෙන ඇති බවට දන්වා එවන ලිපියේ දින සිට මසක් ඇතුළත ඉල්වා ඇති බඩුවලින් එක් එක් වර්ගයෙන් සියයට විසිපහක් (25%) භාර දිය යුතුයි. ඉතිරි බඩු සියල්ලම තුන් මසක් ඇතුළත භාර දිය යුතුයි.

5. කිසිම වග විභාගයක් නොමැතිව එවන ලද ඕනෑම මිළ කැඳවීමක් ප්‍රතික්ෂෙප කිරිම හෝ එම කැඳවීමකින් කොටසක් පිළිගැනීමේ හෝ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ සතුය.

එන්. සබානාදන්,
කෘෂිකර්ම ඉංජිනේරු (සැපයීම),
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
වැඩපල හා යන්ත්‍රාගාරය,
නාවල පාර, නාරාහේන්පිට,
1969 දෙසැම්බර් මස 19 වැනි දින.

12–747—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, වැලිසර ආම්පන්න කම්හලට පහත සඳහන් අයුරු දැව (එළය රහිත පදම් කළ) "සැපයීම් හා ගෙනැවිත් භාරදීම" සඳහා පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 ජනවාරි 4 වෙනි දින දවල් 12 දක්වා මිළ ගණන් කැඳවනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| 1. | 14′ × 10″ × 1″ ගිනිසපු ලැලි | ... | 1,000 යි |
| 2. | 12′ × 10″ × 1″ ගිනිසපු ලැලි | ... | 1,500 යි |
| 3. | 11′ × 8″ × 1″ ගිනිසපු ලැලි | ... | 1,300 යි |
| 4. | 7′ × 10″ × 1″ ගිනිසපු ලැලි | ... | 600 යි |
| 5. | 7′ × 8″ × 1″ ගිනිසපු ලැලි | ... | 2,500 යි |
| 6. | 6′ × 10″ × 1″ ගිනිසපු ලැලි | ... | 400 යි |
| 7. | 8′ × 6″ × ½″ ලුණුමිදෙල්ල ලැලි | ... | 3,000 යි |
| 8. | 7′ × 6″ × ½″ ලුණුමිදෙල්ල ලැලි | ... | 3,000 යි |

2. පිළිගනු ලැබූ ටැන්ඩර්කරු විසින් ඔහුගේ අයදුම පිළිගත් බව ඔහුට දැනුම් දුන් දින සිට මාසයක් ඇතුළත 25% (සියයට විසිපහ) දැව එක එක ප්‍රමාණයෙන් සැපයිය යුතු අතර, ඉතිරි කොටස මාස 3ක් ඇතුළතදී සැපයිය යුතුයි.

3. පිළිගත් ටෙන්ඩර්කරුට ගිවිසුමකට එළඹීමට සිදුවන අතරම ටෙන්ඩර් කරන ලදුව පිළිගනු ලැබුවාවූ වැඩ කොටස්වල මුළු වටිනාකමින් සියයට 5ක මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ නමින් තැන්පත් කිරීමට සිදුවේ. මෙම මුදල ආපසු ගෙවනු ලබන්නේ කොන්ත්‍රාත්තුව සාර්ථක ලෙස ඉටු කළ පසුය. පිළිගත් ටෙන්ඩර්කරුට කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට නොහැකි වුවහොත් ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක කර, රජය මගින් තබා ඇති වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නම් ලේඛනයෙහි එම ටෙන්ඩර් කරුගේ නමද ඇතුළත් කරනවා ඇත.

4. සෑම මිළ ගණන් කැඳවීම් පත්‍රයක්ම සීල් තබන ලද කවරයකින් යුක්ත විය යුතු අතර, එහි වම් පැත්තේ උඩ කෙළවරෙහි "දැව සඳහා මිළ ගණන් කැඳවීම්" යන්න සඳහන් කර නියමිත වේලාවට ප්‍රථම පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ලැබෙන සේ එවිය යුතුයි.

5. කිසිම වගවිභාගයක් නොමැතිව එවන ලද ඕනෑම මිළ කැඳවීමක් ප්‍රතික්ෂේප කිරීමේ හෝ එම කැඳවීමකින් කොටසක් පිළිගැනීමේ හෝ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ සතුය.

එන්. සබානාදන්,
කෘෂිකර්ම ඉංජිනේරු (සැපයීම්),
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
වැඩපල හා යන්ත්‍රාගාරය,
නාවල පාර, නාරාහේන්පිට,
1969 දෙසැම්බර් මස 19 වැනි දින.

12–748—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කර්මාන්ත වර්ගයේ මහන මැෂින් 3ක් සැපයීම

වර්ෂ 1970 ජනවාරි මස 15 දින ප. ව. 2.30 දක්වා පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ ප්‍රාදේශිය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් කර්මාන්ත ශාලීය මහන මැෂින් 3ක් සැපයීම සහ ගෙනවිත් භාරදීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ. කර්මාන්තශාලා ඝනයට අයත් සැහැල්ලු මධ්‍යම සහ මධ්‍යම තද රෙදි වර්ග හා කැන්වස් ආදියද මැසිය හැකි විනාඩියකට මැහුම් 5,000ක් දක්වාද, ඉදිරියට හා පස්සටද මැසිය හැකි යන්ත්‍රයක් විය යුතුය.

මිළ කැඳවීමේ දර්ශන පත්‍රිකා දෙපිටපතකින් ආවරණය කර සිල් තැබූ ලිපි කවරයක වම් පස උඩ කෙළවරේ "කර්මාන්තශාලා මහන මැෂින් සැපයීමේ මිළ ගණන්" යයි සඳහන් විය යුතු අතර, ඉහත දක්වෙන ටෙන්ඩර් කැඳවීමේ දිනයේ වේලාවට හෝ පෙර ප්‍රාදේශිය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ලැබීමට සැලැස්විය යුතුය.

මිළ ගණන් දැනට ගබඩා කර ඇති යන්ත්‍ර සඳහාද, එම යන්ත්‍ර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නාරාහේන්පිට නාවල පාරේ පිහිටි යන්ත්‍රාගාරයට හා වැඩපලට සැපයීම උදෙසා යන වියදමද ඇතුළත් විය යුතුයි. දැනට ගබඩාවේ නොමැති නම් මෙකී යන්ත්‍ර පිට රටින් ගෙන්වා දීමට හැකි ඉතාම ඉක්මන් දිනය සඳහන් කළ යුතුයි.

මැෂින් සැපයීමට ඉදිරිපත් වන ඉල්ලුම්කරුවෙක්ම එකී මැෂින් සැපයීම සඳහා ටෙන්ඩර් භාර ගන්නා දිනයෙන් පසුවද, එම මැෂින් සැපයීමට සති 3ක් ගත වන තුරු බලාපොරොත්තු සහිතව තබා ගත යුතුයි.

කිසිම වග විභාගයක් නොමැතිව, එවන ලද ඕනෑම මිළ කැඳවීමක් ප්‍රතික්ෂෙප කිරීම හෝ එම මිළ කැඳවීමකින් කොටසක් පිළිගැනීමේ හෝ බලය රජය සතුය.

වැඩිමනත් අවශ්‍ය සෑම විස්තරයක්ම පේරාදෙනියේ ගන්නොරුවේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු වැඩපලේ කෘෂිකර්ම ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිය.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
ප්‍රධාන ඉංජිනේරු.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
ඉංජිනේරු අංශය,
ගන්නොරුව, පේරාදෙනිය,
1969 දෙසැම්බර් 2 දින.

12–808—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

13. නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියෙකු විසින් 1970 ජනවාරි මස 5 දින පෙ. ව. 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැනගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
නුවරඑළිය දිස්ත්‍රික්කය.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා
සහකාර කොමසාරිස් තැන ගේ කාර්යාලය,
1969 දෙසැම්බර් මස 9 වන දින දීය.

12-759—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### කොළ වශයෙන් යුත් නිව්ස්ප්‍රින්ට් සඳහා මිළ ගණන්

මෙම කාර්යාලයේ, පළාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

| ගොවි කාරක සභා ප්‍රදේශය | | කර්මාන්තයේ නම |
|---|---|---|
| 1. පල්ලෙකන්ද | ... | පෝදුරු කන්ද අමුණ ප්‍රතිසංස්කරණය. |
| 2. නිකගොඩ කුඹුර | ... | නිකගොඩයාය බැම්ම තැනීම. |
| 3. ඇලපාත | ... | ඇලපාත වැව ප්‍රතිසංස්කරණය. |

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969 දෙසැම්බර් මස 27 දින දවල් 12 දක්වා රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 10ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර් කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි වියයුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයක් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩර කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ "රත්නපුර දිස්ත්‍රික්කයේ සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර, 1969 දෙසැම්බර් මස 28 දින දවල් 12ට පෙර රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නොඑසේනම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර් කරුට ඒ බව රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරිතැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දශ දිනක් ඇතුළත දී එම ටෙන්ඩර්කරු විසින් රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුළත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5% ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂෙප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමග නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ, රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන්ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන්ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක් දැයි හොඳින් වටහා ගතයුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

12. තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින රත්නපුර 'දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු වියයුතු මුද්දර කොන්ත්‍රාත් කරු විසින් සැපයිය යුතුය.

13. රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 දෙසැම්බර් මස 29 දින පෙ. ව. 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

පී. එච්. චන්ද්‍රදාස,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
රත්නපුර දිස්ත්‍රික්කය.

රත්නපුර දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලය,
1969 දෙසැම්බර් මස 10 දින දීය.

12-757—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පහලගිරිබාව රෝහලේ සහ පොලිස් ස්ථාන ගොඩනැගිලිවල විදුලි ස්ථාපනය

ඉහත සඳහන් සේවය සඳහා 1970.1.2 වන දින පෙරවරු 11 දක්වා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. 69.12.31 වෙනි දින දවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්මයක අනු පිටපතක් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතැනගේ අංක 1 දරණ ගිණුමට හෝ බැහැර කච්චේරියක රු. 25 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ෆෝර්ම ලබාගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. රිසිට් පත් තැන්පත් මුදල ආපසු ඉල්ලන විට ඉදිරිපත් කළ යුතුයි. ඒවා ටෙන්ඩරයට ඇමිණිය යුතු නොවේ.

4. ටෙන්ඩර් ෆෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල්, ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. ටෙන්ඩර් බහාලූ ලියුම් කවරයේ කෙළවරේ "පහලගිරිබාව රෝහලේ සහ පොලිස් ස්ථාන ගොඩනැගිලිවල විදුලි ස්ථාපනය සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට, කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ලියුම් කවරයේ වම්පස පහළ කෙළවරේ සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි තැපෑලෙන් හෝ ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් ප්‍රධාන ගණකාධිකාරී තැන වෙත භාරදීම හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

6. ටෙන්ඩර් සපිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාල නොවිය යුත්තේය. ඒවා සලකා බැලීමට ඇති හෙයින් ටෙන්ඩර් විවෘත කළ දින සිට දින 60 ක් යන තෙක් ඒවා ආපසු ගත නොහැක්කේය.

7. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය පිළිගත් දින සිට මසක් ඇතුලත වැඩය නිම කළ යුතුය.

8. සාර්ථක වූ ටෙන්ඩර්කරු වැඩය පටන් ගැනීමට හෝ ඇපයක් ඉදිරිපත් කිරීමට හෝ දන්වූ කල්හි පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ අසමත් වුවහොත් තැන්පත් මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ටෙන්ඩර්කරුගේ නම ද රජයේ කොන්දේසි කඩ කළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නේය.

9. කොළඹ එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 70.1.2 වන දින පෙ. ව. 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

10. ටෙන්ඩර්කරුවන් විසින් මෙවැනි වැඩ සඳහා ඔවුන්ගේ පළපුරුදුකම් හා දක්ෂතාවය ටෙන්ඩර් ෆෝර්ම ඉල්ලීමේදී ඔප්පු කළ යුතුය.

11. මෙම කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුය. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

12. ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමේ බලය හා ටෙන්ඩරයේ යම් කොටසක් පමණක් භාරගැනීමේ බලය රජය සතු වේ.

13. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධිකාරී ඉංජිනේරුතැනගෙන් විමසන්න.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

සීට්/3/72
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
එච්ලන් චතුරශ්‍රය, කොළඹ, 69.12.12.

12–744—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### මිල ගණන් කැඳවීම් අංකය එල්.කිව්/ඩී.ඊ.වී. 900/1.

මෙහි පහත විස්තර දක්වා ඇති, අයුරු පැරකොට් ගැලොම් 1,500ක් සැපයීම සඳහා පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 ජනවාරි 25 දින සවස 2.30 වනතෙක් මිළ ගණන් භාරගනු ලැබේ. පිලිගත් ටෙන්ඩර්කරු විසින් මේවා කොළඹ 5, නාරාහේන්පිට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ යන්ත්‍රාගාරයට භාර දිය යුතු අතර ඒවා ගැළම් 5 භාජන (Cans) වලින් විය යුතුය.

විශේෂ විස්තරය :

පැරකොට් ගැලොම් 1,500 ක් සැපයීම සඳහා
(විශේෂ විස්තර සඳහා මෙම දැන්වීමේ ඉංග්‍රීසි අනුවාදය බලන්න)

2. සෑම මිල ගණන් පතක්ම අනු පිටපතක් සහිතව සීල් තැබූ කවරයක බහා එම කවරයේ වම් පස උඩ කෙළවරේ 'පැරකොට් ගැලුම් 1,500 ක් සැපයීම සඳහා මිළ ගණන් කැඳවුම් අංකය එල්.කිව්/ඩීඊවී 900/1' යනුවෙන් සඳහන් කර, පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත මිල ගණන් වැසීමට නියමිත වේලාවට පෙර ලැබෙන්නට සැලැස්විය යුතුය.

3. මිල ගණන් දැක්විය යුත්තේ—

1. ගබඩාවෙන් ලබා ගැණීමට සහ
2. ආනයන කර ලබා දීමට (තීරුබද්දෙන් නිදහස්, ණයවර ලිපි ටැන්ඩර්කරු විසින් විවෘත කිරීමට)

(අ) විදේශීය විනිමය මිල ...............
(ආ) දේශීය මිල ...............

සම්පූර්ණ මිල

4. පිළිගත් ටෙන්ඩර්කරු විසින්, ගබඩාවෙන් ලබා ගැනීමට හා ආනයනය කර ලබා දීමට ගතවන කාලය වෙන වෙනම සඳහන් කල යුතුය.

5. පිළිගත් ටෙන්ඩර්කරු විසින් ආනයන කරනු ලබයි නම්, පිටරට වලින් ලංකාණ්ඩුවට දෙනු ලබන ආධාර පහසුකම් යටතේ මේවා සැපයීමට එකඟ විය යුතුය.

6. කිසිම වග විභාගයක් නැතිව එවනු ලබන ඕනෑම මිල කැඳවීමක් ප්‍රතික්ෂෙප කිරීමේ හෝ එම මිල කැඳවීමකින් කොටසක් පිළිගැනීමේ හෝ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ සතුය.

එල්. ආර්. එල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

12-719—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : ඉලි/95.

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

මොණරාගල දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1970 ජනවාරි මස 16 වන සිකුරාදා පස්වරු 2.30 දක්වා කොළඹ තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙනඩ්ර් පත්‍ර භාරගනු ලැබේ :—

1. කොටියාගල ජනපදයේ පාර අලුත්වැඩියා කිරීම.
2. ඇතිමොලේ ජනපදයේ බී. ඕ. පී. පාරේ ගල් අතුරා තාර දැමීම.
3. හුලංදාව ජනපදයේ දකුණු ඉවුරේ පාරේ පාලම් සහ බෝක්කු තැනීම.
4. ලුනුගල යෝධවැව ව්‍යාපාරයේ කුඹුරුවලට පිවිසෙන පාර තැනීම.
5. ලියන්ගොල්ල-මාගන්දනඹය පාරේ 1 වන සහ 2 වන සැතපුම් අලුත්වැඩියා කිරීම.

2. රුපියල් 25,000 ක් හෝ ඊට වැඩි ගණනකට හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියා පදිංචි වී සිටින අයට ඉහත අංක 4 සඳහාද, රුපියල් 50,000 හෝ ඊට වැඩි ගණනකට මෙකී දෙපාර්තමේන්තුවල ලියා පදිංචිවී සිටින අයට අංක 1 සහ 5 දරන වැඩ සඳහා ද රුපියල් 100,000 හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචිවී සිටින අයට අංක 2 සහ 3 දරන වැඩ සඳහාද 1970 ජනවාරි මස 12 වෙනි දින දවල් 12 වන තෙක් මොණරාගල දිසාපති කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර අපේක්ෂකයා විසින් මොණරාගල කච්චේරියේ හෝ වෙනත් කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ ඉහත අංක 4 දරන වැඩය වෙනුවෙන් රුපියල් 25 ක මුදලක් ද, ඉහත අංක 1 සහ 5 දරන වැඩ සඳහා රුපියල් 50 ක මුදලක් සහ ඉහත අංක 2 සහ 3 දරන වැඩ සඳහා රුපියල් 100 ක මුදලක් ද තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් මොණරාගල දිසාපති වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චෙක් පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ.

4. අනුමත කරනලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුලත් සංගම් සහ විවිධ සේවාසංගම්වලට අයිති සමිතිවලටද ඉහත සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණන කට හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ලියා පදිංචිවී තිබෙන්නේ නම් මේ වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ හැකිවේ. ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීමෙන් අනුමත කරනලද සමිති නිදහස්ය. එහෙත් ඉහත සඳහන් මුදල් ප්‍රමාණයන්ට ලියා පදිංචිවී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් ඒවාට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

5. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කොට අනු පිටපතක්ද සමග ලේඛණ ගත තැපෑලෙන් එවිය යුතුය. සීල් තබන ලද ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ උඩ වම් කෙලවරේ ටෙන්ඩර් කරුගේ නමද, ලිපිනයද, වැඩෙහි නමද ලියා එවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් නොඑවන්නේ නම් ගාලු මුවදොර, පරණ මහා ලේකම් කාර්යාලයේ, අංක 357 දරන කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

6. 1970 ජනවාරි මස 16 වන සිකුරාදා පස්වරු 2.30 ට ඉහත කී අංක 357 දරන කාමරයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ පැමින සිටිය හැක.

7. ටෙන්ඩර් කරුවන් මෙම කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට එකඟ විය යුතුය.

8. වැඩි විස්තර මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපතිගෙන් ලබාගත හැක.

ඕ. සී. ජයවර්ධන,
මොණරාගල දිසාපති වෙනුවට.

1969 දෙසැම්බර 6 වන දින,
මොණරාගල දිසාපති කාර්යාලයේ දීය.

12-730—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : ඉලි/95.

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

මොණරාගල දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1970 ජනවාරි මස 16 වන සිකුරාදා පස්වරු 2.30 දක්වා මොණරාගල දිසාපති විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

1. ගල්ගමුව ගමේ පොදු ලිඳක් තැනීම
2. තක්කල 15 ගේ කණුව අසල පොදු ලිඳක් තැනීම
3. කලගහකිවුල ගමේ පොදු ලිඳක් තැනීම
4. හම්බේගමුවේ අලුත්වැව ගමේ පොදු ලිඳක් තැනීම
5. පෙතියන්ආර ගමේ පොදු ලිඳක් තැනීම
6. කටුගහගල්ගේ ගමේ පොදු ලිඳක් තැනීම.

2. රුපියල් 15,000 හෝ ඊට වැඩි ගණනකට හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියා පදිංචි වී සිටින අයට 1970 ජනවාරි 12 වන දින දවල් 12 වන තෙක් මොණරාගල දිසාපති කාර්යාලයේදී ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර්පත්‍ර අපේක්ෂකයා විසින් මොණරාගල කච්චේරියේ හෝ වෙනත් කච්චේරියක හෝ කොළඹ, මහා භාණ්ඩාගාරයේ හෝ එක් එක් වැඩය වෙනුවෙන් රුපියල් 25 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් මොණරාගල දිසාපති වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

4. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද, ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයන්ට හෝ ඊට වැඩි ගණන කට හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ලියා පදිංචිවී තිබෙන්නේ නම්, මෙකී වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ හැකිවේ. ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීමෙන් අනුමත කරණු ලැබූ සමිති නිදහස්ය. එහෙත්, ඉහත සඳහන් මුදල් ප්‍රමාණයන්ට ලියා පදිංචිවී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් ඒවාට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

5. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කොට අනු පිටපතක්ද සමග ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. සීල් තබන ලද ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ උඩ වම් කෙලවරේ ටෙන්ඩර්කරුගේ නමද, ලිපිනය ද, වැඩෙහි නමද ලියා තිබිය යුතුය. ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් නොඑවන්නේ නම් මොණරාගල කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

6. 1970 ජනවාරි මස 16 වන දින පස්වරු 2.30 ට මොණරාගල දිස්ත්‍රික් ඉඩම් නිලධාරිගේ කාමරයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරණ අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ පැමිණ සිටිය හැකිය.

7. ටෙන්ඩර්කරුවන් මෙම කොන්ත්‍රාත්තු යටතේ වැඩ කරවා ගැණීමට ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට එකඟ විය යුතුය.

8. වැඩි විස්තර මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති තැන ගෙන් ලබාගත හැකිය.

ඕ. සී. ජයවර්ධන,
මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1969 දෙසැම්බර් 6 වන දින,
මොණරාගල දිසාපති කාර්යාලයේ දීය.

12-731—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### රජයේ ගොවිපලවල අයිආර් 8 ගොයම් කැපීම, ප්‍රවාහනය කිරීම හා ගොඩගැසීම සඳහා ටෙන්ඩර්පත් කැඳවීමයි

ඉහත සඳහන් දේ සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර 1970 ජනවාරි මස 9 වැනි දින පෙ.ව. 10.00 දක්වා යාපනයේ කෘෂිකර්ම නිලධාරි (ගො.පා.හා.නි.) විසින් භාරගනු ලැබේ.

පහත සඳහන් ගොවිපල් වල අයිආර් 8 ගොයම් කැපීම, ප්‍රවාහනය කිරීම හා ගොඩගැසීම, ගොයම් කපා නිමකළ යුතු කාලසීමාව පහත සඳහන් කර ඇත :—

| | ගොයම් කැපීමේ දිනය | වර්ගය | අක්කර ගොයම් කැපීම | ගොයම් කපා නිමකළ යුතු අන්තිම දිනය |
|---|---|---|---|---|
| පරන්තන් ගොවිපල ... ... ... | 15.2.1970 ... | අයිආර් 8 ... | 14 (කොටුව—1) ... | 20.2.1970 |
| | 20.2.1970 ... | අයිආර් 8 ... | 4 (කොටුව—2) ... | 22.2.1970 |
| | 22.2.1970 ... | අයිආර් 8 ... | 3 (කොටුව—3) ... | 23.2.1970 |
| මුරුන්කන් ගොවිපල ... ... ... | 14.2.1970 ... | අයිආර් 8 ... | 14 (කොටුව—1) ... | 17.2.1970 |
| | 17.2.1970 ... | අයිආර් 8 ... | 1 (කොටුව—2) ... | 18.2.1970 |
| කිලිනොච්චි ගොවිපල ... ... ... | 18.2.1970 ... | අයිආර් 8 ... | 10 ... | 22.2.1970 |

ගොවිපල කළමනාකරු හෝ ඔහුගේ නියෝජිතයා විසින් නියම කරනු ලබන ස්ථානවල ගොයම් කොළ ගොඩගැසිය යුතුයි. වී ඇටවලට හානි හෝ අලාභ සිදුවීමට කිසිම අවස්ථාවකවත් ඉඩ නොතැබිය යුතුයි. ගොයම් කපා ගත් පසු කුඹුරෙහි ඉතිරි වන ඉපනැල්ලෙහි උස අඟල් 3 කට නොවැඩි විය යුතුයි.

නියමිත වකවානුව තුළ ගොයම් කැපීම නිමකළ යුතු අතර, නියමිත දිනය ඉක්මවා පමාවන එක් එක් දිනය උදෙසා දඩයක් ගොයම්වලට වූ අලාභයට සමානව ගෙවීමට කොන්ත්‍රාත්කරුට සිදුවේ. (ගොයම් අලාභය ගණන් ගනු ලබන්නේ ගොයම් කැපීමේ අන්තිම දිනට පසුව ගොයම් නො කපා තිබෙන සෑම අක්කරයකටම, අක්කරයකට දවසකට බුසල් 3 ක් බැගින්ය.) සියළුම කටයුතු ගොවිපලේ කළමනාකරු සෑහීමට පත්වන පරිදි නිම කළ යුතුයි. දිනකට අඩුම වශයෙන් අක්කර 4 ක ගොයම් කැපිය යුතුයි. කපන ලද ගොයම් වැස්සෙන් බාධාවක් නොපැමිණියහොත් කපාගත් දින සිට දින දෙකක් තුළ ගොඩ ගැසිය යුතුයි. වැස්සෙන් බාධා ඇතිවුවහොත් ගොයම් කොළ කොතැනක ගොඩ ගැසිය යුතුදැයි ගොවිපල කළමනාකරු තීරණය කරනවා ඇත. කොන්ත්‍රාත් කරුගේ පැහැර හැරීමෙන් හෝ නොසැලකිල්ලෙන් හෝ වී වලට හානියක් සිදුවේ නම් එම හානියේ වටිනාකම ඔහුගෙන් අයකරනු ලැබේ.

මේ සඳහා මිළ ගණන් එක් එක් වර්ගය වෙනුවෙන් අක්කරයක් පදනම මත යුතුවේ. තෝරාගනු ලබන ටෙන්ඩර්කරුවට අක්කර ප්‍රමාණය මුළු වශයෙන් හෝ කොටසක් වශයෙන් හෝ පිළිගැනීමට සිදුවේ. ගොවිපලේ කළමනාකරුගේ නැත්නම් ඔහුගේ නියෝජිතයාගේ උපදෙස්වලට අනුකූලව ඔවුන් විසින් එක් එක් බිම් කොටස හෝ ලියැද්ද සඳහා නියම කරනු ලබන දිනය තුළ වැඩය නිම කළ යුතුයි.

2. ඉහත සඳහන් එක් එක් ස්ථානයේ එකී සේවාවන් සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතු අතර එකී එක් එක් ටෙන්ඩර් පත්‍රය උදෙසා රුපියල් 10 බැගින් ටෙන්ඩර් ගාස්තු තැන්පත් කළ යුතු වේ.

3. යාපනයේ කෘෂිකර්ම කාර්යාලයේ කෘෂිකර්ම නිළධාරි (ගො. පා. හා. නි.) ගෙන් ලබාගත් ආකෘති පත්‍ර වල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර දෙපිටපතකින් අත්සන් තබා මුද්‍රා තබන ලද කවරවල බහා එවිය යුතුයි. කවරයේ ඉහල වම් කෙලවරේ (ස්ථානයේ නම සහ සේවාව සඳහන් කරන්න) සඳහා ටෙන්ඩර් පත්‍රයයි, යනුවෙන් සඳහන් කොට යාපනයේ කෘෂිකර්ම කාර්යාලයේ කෘෂිකර්ම නිළධාරි (ගො. පා. හා. නි.) වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නොඑවන්නේ නම් සීල් තබන ලද කවරවල බහා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයා විසින් යාපනයේ කෘෂිකර්ම නිළධාරි කාර්යාලයේ (ගො. පා. හා. නි.) ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුයි. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කළ පසු ලියාපදිංචි කළ තැපෑලෙන් ටෙන්ඩර් පත්‍රිකා එවන ලද ටෙන්ඩර් කරුවන් වෙත එම ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බව දන්වා එවනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා භාරගන්නා අවසාන දින වශයෙන් සඳහන් දින සිට දින හතරක් ඇතුලත ටෙන්ඩර් පත්‍රය ලැබුණු බවට එවැනි ලිපියක් කිසියම් ටෙන්ඩර් කරුවෙකුට නොලැබුණි නම්, ඔහු විසින් යාපනයේ කෘෂිකර්ම නිළධාරි (ගො. පා. හා. නි.) වෙත ඒ බව නොපමාව දැන්විය යුතුය.

4. ටෙන්ඩරයකට රුපියල් 10 බැගින් මුදල් තැම්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනට පෙර දින දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරණු ලැබේ. මෙම තැම්පත් මුදල් කැමති කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූලස්ථානයේ හෝ තැම්පත් කළ හැකි ය. ගිවිසුම් පත්‍රය අත්සන් කළ පසු මේ තැම්පත් මුදල ආපසු ගෙවනු ලැබේ. ටෙන්ඩර් පත්‍රය පිළිගන්නා ලද බව දන්වූ දින සිට දින දහයක් ඇතුලත ගිවිසුම් පත්‍රයට අත්සන් තැබීමට පිළිගත් ටෙන්ඩර්කරු අපොහොසත් වුවහොත්, ඔහුගේ ටෙන්ඩර් තැම්පත් මුදල රාජසන්තක වනවාත් හැර ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට ඇතුලත් කිරීමටද හේතුවේ. එහෙත් එයින් රජයට ඔහුගෙන් අයවිය යුතු වෙනත් මුදලක් ඇතොත් එම අයකර ගැනීම් වලට බාධාවක් ඇති නොවේ. ගොවිපල කළමනාකරු විසින් නියම කරණ ලද දිනයක වැඩ ආරම්භ කර, අදාල දිනයට වැඩය නිමකර දිය යුතුයි. එසේ නොකරන්නා වූ ටෙන්ඩර් කරුවන්ට ගිවිසුම් පත්‍රයෙහි සඳහන් වන අලාභය ගෙවීමටද සිදුවේ.

5. ටෙන්ඩර්කරුගේ අභිමතය පරිදි අවශ්‍ය නම් ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරණ විට පැමිණ සිටීමට ඔවුන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා භාරගන්නා අවසාන දින වශයෙන් ඉහතින් දක්වා ඇති දින එකී වේලාවට යාපනයේ කෘෂිකර්ම නිළධාරි (ගො. පා. හා. නි.) තැනගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරණු ලැබේ.

6. පිළිගත් පෝර්මයෙහි (දෙපිටපතකින් යුතුව) ඉදිරිපත් නොකරණ ලද හෝ එහි සඳහන් කොන්දේසිවලට සම්පූර්ණයෙන්ම එකඟ නොවන්නාවූ කිසිම ටෙන්ඩර් පත්‍රයක් පිළිගනු නොලැබේ. ටෙන්ඩර් ගාස්තු ප්‍රමාණ හා මිල ගණන්, තීන්තෙන් පැහැදිළි ලෙස සටහන් කළ යුතු අතර, සියළුම වෙනස් කිරීම් වලට ටෙන්ඩර් කරුගේ අත්සන යොදා සහතික කළයුතු වේ.

7. ටෙන්ඩර්කරුවන් විසින් තමන්ගේ නම් සහ ලිපිනයන් සම්පූර්ණ ලෙස පැහැදිළි අකුරින් සටහන්කර තිබිය යුතුය.

8. පිළිගත් ටෙන්ඩර්කරුට ගිවිසුමකට එළඹීමට සිදුවන අතරම ටෙන්ඩර් කරණ ලදුව පිළිගනු ලැබුවාවූ වැඩ කොටස්වල මුළු වටිනාකමින් 5%ක මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ නමින් තැම්පත් කිරීමට සිදුවේ. මෙම මුදල ආපසු ගෙවනු ලබන්නේ කොන්ත්‍රාත්තුව සාර්ථක ලෙස ඉටුකළ පසුය. පිළිගත් ටෙන්ඩර්කරුට කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට නොහැකි වුවහොත් ඔහුගේ තැම්පත් මුදල රාජසන්තක කර, රජය මගින් තබා ඇති වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයෙහි එම ටෙන්ඩර්කරුගේ නමද ඇතුළත් කරනවා ඇත.

9. ගිවිසුම් පත්‍රයට අදාල වන මුද්දර සඳහා තම අතින් වියදම් කිරීමට පිළිගත් ටෙන්ඩර්කරුට සිදුවේ.

10. අසතුටුදායක වැඩකටයුතු නිසා හෝ කොන්ත්‍රාත්තුවේ සඳහන් නියමයන් ඉටු නොකිරීම නිසා හෝ කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමේ අයිතියද කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතු වන්නේය. එවැනි අවස්ථාවකදී කොන්ත්‍රාත්කරුගේ වියදමින් එම වැඩ සම්පූර්ණ කර ගැනීම සඳහා වෙනත් විධි විධාන යොදා ගැනීමේ අයිතියද කෘෂිකර්ම අධ්‍යක්ෂකවරයා සතු වන්නේය.

11. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ, ටෙන්ඩරයක හෝ ටෙන්ඩර්වල කොටසක් පමණක් පිළිගැනීමේ අයිතිය රජය සතුවේ.

12. ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දින සිට සති තුනක් තුළ භාරගැනීම සඳහා තම ටෙන්ඩර් පත්‍ර විවෘතව තැබීමට ටෙන්ඩර්කරුවන්ට සිදුවේ.

13. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙන අතර ඔවුහු පමණක් එසේ නියුක්ත කරණු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකිතරම් දුරට බඳවා ගනු ලබන්නේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අයගෙනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිළධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වරයාගේ එකඟත්වය ඇතිව නිශ්චිතව ලියවිල්ලකින් එකී නිළධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතරම එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සළකනු ලැබේ. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා " ලාංකික " යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු බව අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූ ද, කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින්මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසි වලට අනුකූලවූ ද, වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

කොන්ත්‍රාත්කරු කෙරෙහි එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පතපොත, චැක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂාකර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිළධාරියෙකුට ඒවා පරීක්ෂාකර බැලීමට ඉඩදීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුනහොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයකට තැපෑලෙන් යැව්වහොත් හෝ ඔහු අතටම භාර දුන්නා සේ සළකනු ලැබේ.

15. කොන්ත්‍රාත්කරුවෙකු විසින් සේවයේ යොදවන කම්කරුවෙකු විසින් වර්ෂ 1934 අංක 19 වෙනි කම්කරු වන්දි ආඥපනතෙහි (117 වෙනි අධිකාරය යටතේ) ඉල්වනු ලබන වන්දියකින් රජය නිදහස් කිරීමට කොන්ත්‍රාත්කරුට සිදුවේ.

16. කිසියම් සේවකයෙකු සේවයේ යෙදීමට අහිතකර යයි රජය සලකනු ලබන විටක හා කිසියම් සේවකයෙකු කොන්ත්‍රාත්කරු විසින් සේවයට ගැනීමට විරුද්ධ වීමේ අයිතිය රජය සතු වේ.

17. තනි වශයෙන් හෝ වෙනත් අයකුගේ නමක් සමඟ රජයේ කොන්ත්‍රාත්තු පැහැර හරින ලද කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයෙහි නම් සඳහන් කිසිවෙකු සමඟ හෝ තමාට සෑහේ යයි හැඟී යන කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විරුද්ධ වන හෝ කිසිවෙකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

18. එකී එකී ගොවිපලවල කළමනාකරුවන්ගෙන් මේ සම්බන්ධ වැඩි විස්තර ලබාගත හැක.

පී. ටී. ජිනේන්ද්‍රදාස,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ,
(කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල්).

1969 දෙසැම්බර් මස 5 වැනි දින,
පේරාදෙණියේ දී ය.

12-718—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### වී වේලන සිමෙන්ති බිමක් තැනීම සඳහා ටෙන්ඩර්

රජයේ සහල් මෝල්වල වී වේලන සිමෙන්ති බිම් සකස් කිරීම සඳහා පහත සඳහන් ස්ථානයන් සඳහා ටෙන්ඩර් පත් 1970 ජනවාරි 2 සිකුරාදා ප.ව. 2.30 දක්වා කොළඹ 7 ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත (එඩිංබරෝ චන්ද්‍රවංකය) අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

| | දිස්ත්‍රික්කය | | ස්ථානය | | සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1. | අනුරාධපුර | ... | පදවිය ර. ස. මෝල | ... | 1 |
| 2. | මාතලේ | ... | කන්දලම ර. ස. මෝල | ... | 1 |
| 3. | පොළොන්නරුව | ... | බකමූණ ර. ස. මෝල | ... | 1 |
| 4. | මොණරාගල | ... | මොණරාගල ර. ස. මෝල | ... | 1 |
| 5. | මහනුවර | ... | පල්ලේවත්ත ර. ස. මෝල | ... | 1 |

2. ඒ සඳහා රුපියල් 50 ක් එක් ස්ථානයක් වෙනුවෙන් තැන්පත් කර ඒ සඳහා ලබාගන්නා ලද කුවිතාන්සි ඉදිරිපත් කර කොළඹ 7 ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත (එඩිංබරෝ චන්ද්‍රවංකයේ) අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබාගන්නා ලද ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කලයුතුයි. කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 60 දරණ ස්ථානයේ ගණකාධිකාරීට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක මුදල් තැන්පත් කලහැක. එක් ටෙන්ඩර්කරුවෙකුට ඉහත සඳහන් එක වැඩකට හෝ වැඩි ගණනකට ටෙන්ඩර් ඉදිරිපත් කලහැක.

3. රු. 10,000 ක් හෝ ඊට වැඩි ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩ සඳහා රජයේ බලයලත් කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ''කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත'' ඉදිරිපත් කිරීමෙන් 1970 ජනවාරි 2 වෙනි දින දවල් 12.00 වනතෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. තැපැලෙන් ද ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. තැපැලෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලා සිටින ටෙන්ඩර්කරුවන් විසින් ඒවා ලබාගෙන අවසාන දිනට ප්‍රථම ටෙන්ඩර් පත්‍ර එවීමට හැකිවන පරිදි කල්වේලා ඇතිව එසේ කලයුතුයි.

4. වැඩි විස්තර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත (එඩිංබරෝ චන්ද්‍රවංකයේ) අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබාගත හැක.

වී. ටී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1969. 12. 19 වැනිදා.
කොළඹ 7 ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
(එඩිංබරෝ චන්ද්‍රවංකයේ) අංක 42 දරණ ස්ථානයේ,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ දී ය.

12–766—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය—තැ. පෙ. 418, කොළඹ 1) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

| සේවයන් | | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|---|
| 1. මෙරට සෑදූ විදුලි බුබුළු සැපයීම | ... | 1970.1.20 |
| 2. මෙරට සෑදූ පින්තාරු තීන්ත (ඉමල්ෂන්) සැපයීම | ... | 1970.1.20 |
| 3. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යතුරු පුවරු වලින් යුත් යතුරු ලියන සැපයීම | ... | 1970.1.20 |

විදුලි බුබුළු හා පින්තාරු තීන්ත සැපයීම සම්බන්ධයෙන්, ඒ ඒ ටෙන්ඩර්කරුවන් විසින්, කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ, අංක 363 දරණ "විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ලංකා ආයතනයෙන්" තමන්ගේ සැම්පල් පරීක්ෂා කරවා ගෙන ඒ සඳහා ලැබෙන සහතික පත් ස්වකීය ටෙන්ඩර් පත්‍ර සමග ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර් කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1969. 12. 19 දින,
කොළඹ දී ය.

12–739—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## කාර්මික ජනපද සංයුක්ත මණ්ඩලය

මහනුවර, පල්ලේකැලේ කාර්මික ජනපද භූමියේ පිහිටි ගොඩනැගිල්ලක් කඩා ඉවත් කිරීම හා මිළදී ගැනීම සඳහා 1970.1.10 වැනි දින පෙ. ව. 10 වන තෙක් ඉල්ලුම්පත් භාරගනු ලැබේ.

ආපසු ගෙවන හා ආපසු නොගෙවන පිළිවෙළින් රු. 100 ක හා රු. 5 ක ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීමෙන් කොළඹ 7, විජේරාම මාවතේ අංක 30 දරන ස්ථානයේ පිහිටි මෙම සංයුක්ත මණ්ඩලයේ කාර්යාලයෙන් ටෙන්ඩර් ෆෝරම ලබාගත හැක.

පල්ලේකැලේ කාර්මික ජනපදයේ අධිකාරි තැනගේ අවසරය ඇතිව සතියේ දිනවල පෙ. ව. 9 සිට ප. ව. 4 දක්වා කාලය අතර, ගොඩනැගිල්ල පරීක්ෂා කිරීමට හැක.

කළමනාකාර තැන.

12–1049—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

රිල් වශයෙන් යුණි ක්‍රාෆ්ට් කඩදාසි දිගටොන් 1,700 ක් (දිගටොන් 1=රු. 2,240) වලාච්චේනෙහි නැගෙනහිර කඩදාසි කම්හලට සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවේ.

1970 පෙබරවාරි 12 වැනි දිනට පස්වරු 2 ට ටෙන්ඩර් බාරගැන්ම අවසන් කෙරේ.

මූලිකයන්ගේ/සැපයුම්කරුවන්ගේ නම් හා ලිපිනයන් අඩංගුකර අයැදි විට ටෙන්ඩර් ආකෘතිපත් හා අතිකුත් විස්තර ලබාගත හැක.

තී. බ. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරි,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

356, යූනියන් පෙදෙස, කොළඹ 2,
1969.12.15.

12–858/2—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

## නැගෙණහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

**කොළ වශයෙන් යුත් පාට නිව්ස්ප්‍රින්ට් සඳහා මිළ ගණන් කැඳවීම්**

22½"× 35" ප්‍රමාණයෙන් ග්‍රෑම් 50—52 යුත් මෙහි පහත දක්වෙන කොළ වශයෙන් යුත් පාට නිව්ස්ප්‍රින්ට් ප්‍රමාණයන් කොළඹට සැපයීම සඳහා ලංකා රුපියල් වලින් සඳහන් කරන ලද මිළ ගණන් (මි. හා. වා.) මූලිකයන් වෙතින් කැඳවේ.

| | | |
|---|---|---|
| ඕල්ඩ් ගෝල්ඩ් පාට | දිගටොන් | 10 |
| කොළ පාට | " | 10 |
| නිල් පාට | " | 10 |
| රතු පාට | " | 10 |

(පරිවර්තිත අගය පවුම් 1＝රු. 14.2857 අමෙරිකානු ඩොලර් 1＝රු. 5.95)

ඊම් 10—12 දක්වා අඩංගුකර ලී පතුරු වලින් මිටි බැඳ, 1970 පෙබරවාරි මාසයේදී මෙකී කඩදාසි සියල්ල එක්වරට නැව්ගත කළ යුතුය.

මිළ ගණන් බාර ගැන්ම 1970 ජනවාරි 5 වැනි දින පස්වරු 2.00 ට අවසාන කෙරේ.

ලියා දක්විය යුතු මිළ ගණන් "පාට නිව්ස්ප්‍රින්ට් සැපයීම සඳහා වූ ටෙන්ඩරය" යනුවෙන් කවරයෙහි සඳහන් කර, සීල් තබා, ලංකාවේ කොළඹ 2, යූනියන් පෙදෙසේ අංක 356 නැගෙණහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය, සභාපති යන ලිපිනයට එවිය යුතුය.

කේබල් මගින් දක්වෙන මිළ ගණන් "එපෙම්කෝප්" කොළඹ යන ලිපිනයට එවිය යුතුය.

අවසාන දින දී හෝ ඊට පෙර, සැම්පල් පත් පිටපත් දෙකකින් යුතුව මෙම කාර්යාලයට ලැබිය යුතුය.

ති. බ. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරී,
නැගෙණහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

කොළඹ 2,
යූනියන් පෙදෙසේ,
අංක 356,
1969 දෙසැම්බර් 4 දින.

12–858/3—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

**කොළ වශයෙන් යුත් නිව්ස්ප්‍රින්ට් සඳහා මිළ ගණන්**

22½"×35" ප්‍රමාණයේ ග්‍රෑම් 50-52 යුත් කොළ වශයෙන් යුත් සුදු නිව්ස්ප්‍රින්ට් දිග ටොන් 1,000 ක් කොළඹට සැපයීම සඳහා, ලංකා රුපියල් වලින් සඳහන් කරන ලද මිළ ගණන් (මි. හා. වා.) මූලිකයන් වෙතින් කැඳවේ.

ඊම් 10-12 දක්වා අඩංගුකර ලී පතුරුවලින් මිටි බැඳ 1970 ජූනි මාසයේ සිට ටොන් 200 බැගින් නැව්ගත කල යුතුය.

(පරිවර්තිත අගය : පවුම් 1＝රු. 14.2857, ඇමෙරිකානු ඩොලර් 1.00 ＝රු. 5.95) 1970 මාර්තු 10 වෙනි දින පස්වරු 2.00 ට ටෙන්ඩර් බාර ගැන්ම අවසන් කෙරේ.

ලියා දක්වෙන මිළ ගණන් "සුදු නිව්ස්ප්‍රින්ට් සැපයීම සඳහා ටෙන්ඩරය" යනුවෙන් කවරයෙහි සඳහන් කර, සීල් තබා, ලංකාවේ කොළඹ 2, යූනියන් පෙදෙසේ, අංක 356, නැගෙණහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ සභාපතිගේ ලිපිනයට එවිය යුතුය.

කේබල් මගින් දක්වෙන මිළ ගණන් "එපෙම්කෝප්" කොළඹ යන ලිපිනයට එවිය යුතුය.

අවසාන දිනදී හෝ ඊට පෙර සැම්පල් පත් පිටපත් දෙකකින් යුතුව මෙම කාර්යාලයට ලැබිය යුතුය.

ති. බ. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරී,
නැගෙණහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

කොළඹ 2,
යූනියන් පෙදෙසේ,
අංක 356,
1969 දෙසැම්බර් 4 දින.

12–858/4—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

### කළුතර දිස්ත්‍රික්කය

මෙම කාර්යාලයේ, පලාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන් ගෙන් කළුතර දිස්ත්‍රික්කයේ පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

**පානදුර ගම් වගා නිලධාරි කොට්ඨාශය**

1. මොරවින්න මෝඩ ඇල පැති බැම්ම තැනීම—කලුදැවල

**බණ්ඩාරගම ගම් වගා නිලධාරි කොට්ඨාශය**

2. ගුංගමුව ඇලේ 3 වැනි අමුණට පැතිබැම්ම බැඳීම—ගුංගමුව
3. වැන්ඩෝරාවෙල්යාය දෙපා ඇල ශුද්ධ කිරිම—මිල්ලනිය

**හොරණ ගම් වගා නිලධාරි කොට්ඨාශය**

4. බණ්ඩාර ගෙදර විල ජල ප්‍රමාණකය තැනීම—ඉංගිරිය
5. ඉරවල්ල කුඹුර අමුණ තැනීම—පලන්නොරුව
6. කලුඇල අමුණ තැනීම—අරකාවිල
7. මගුරුවිල ජල ප්‍රමාණකය තැනීම—කොටිගන්ගොඩ
8. ගල්පොත්තවිල පිට ඇල හා පැති බැම්ම තැනීම—බැල්ලපිටිය

**කළුතර ගම් වගා නිලධාරි කොට්ඨාශය**

9. මඩිගාවෙල අමුණ තැනීම—මුංහේන

**මතුගම ගම් වගා නිලධාරි කොට්ඨාශය**

10. මල්පඳුර ඇල ශුද්ධ කිරිම—II අවස්ථාව—මීගම

**අගලවත්ත දකුණ ගම් වගා නිලධාරි කොට්ඨාශය**

11. හල්බැඳිදෙල අරමුණ තැනීම—මොරපිටිය
12. මහකුඹුර අමුණ ප්‍රතිසංස්කරණය—කලුපහණ
13. නාකන්දල ඇල ජල ප්‍රමාණකය තැනීම—පැලවත්ත බටහිර
14. ලියකන්ද අමුණ තැනීම—කලුපහණ

**අගලවත්ත උතුර ගම් වගා නිලධාරි කොට්ඨාශය**

15. මුත්තස්වල කුඹුර අමුණ තැනීම—වරකාගොඩ

2. සැම ටෙන්ඩර් පත්‍රයක් ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ කලුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1970 ජනවාරි මස 2 දින දවල් 12 දක්වා කලුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 10ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළයුතුය.

3. සැම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර් කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි වියයුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සැමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොද සහතික කළයුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොද, සීල් තබන ලද ලියුම් කවරවල බහා, කලුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ ''....................සුළු වාරි කර්මාන්තය කිරිම සඳහා ටෙන්ඩර් පත්‍රය'' යනුවෙන් සඳහන් කළයුතුය. ටෙන්ඩර් පත්‍ර, 1970 ජනවාරි මස 3 දින දවල් 12ට පෙර කලුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති ''ටෙන්ඩර් පෙට්ටියට'' දැමියයුතුය.

5. තෝරාගත් ටෙන්ඩර් කරුට ඒ බව කලුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරිතැන විසින් හෝ ලියවිල්ලකින් දනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දශ දිනක් ඇතුලත දී එම ටෙන්ඩර් කරු විසින් කලුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදයක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 10%ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාමලේඛනයට ඇතුළත් කිරිමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනිමේ හෝ බලය රජයට ඇත.

8. කලුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරනලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමග නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ, කලුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමඟ හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට කලුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුළදී කලුතර දිස් ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන්ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහාගතයුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. ''ලාංකික'' යනුවෙන් අදහස් වන්නේ පරම්පරා-වෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12. තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින කලුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමඟ ගිවිසුමකට ඇතුළත් වියයුතුය. ''ගොවිජන සේවා සහකාර කොමසාරිස්'' යනුවෙන් හැඳින් වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරී තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු වියයුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. කලුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1970 ජනවාරි මස 4 දින පෙ.ව. 9.30ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළහැක.

14. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

පීටර් ද සිල්වා,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
කලුතර දිස්ත්‍රික්කය.

කලුතර දිස්ත්‍රික්කයේ,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනගේ කාර්යාලය,
1969 දෙසැම්බර් මස 10 දින දීය.

12–740—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

## සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කාර්යාලයේ, පලාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අධ්‍යක්ෂක කාර්යාලයේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් අංක 1 සිට 11 දක්වා ඇති වැඩ සඳහා රුපියල් තිස් පන්දහක (රු. 35,000) හෝ ඊට වැඩි මුදලක් කොන්ත්‍රාත් කිරීම සඳහා ලියා පදිංචි වූවන් සඳහා වෙන්කර ඇත.

සුළු වාරි කර්මාන්තය/පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

| | වැඩයේ නම | වැඩයේ ස්වභාවය | පිහිටි ස්ථානය |
|---|---|---|---|
| 1. | තෝරුවැව | දියුණු කිරීම | මරදන්කඩවල |
| 2. | ඉහල පුලියන්කුලම | එම | එම |
| 3. | කැලේ පුලියන්කුලම | එම | එම |
| 4. | රද මීගස්සෙගම | එම | එම |
| 5. | මරිකාරගම | එම | එම |
| 6. | සෙට්ටිකුලම | එම | එම |
| 7. | පඩිකාරමඩුව | එම | හබරන |
| 8. | බූලානවැව | එම | එම |
| 9. | මැදවැව | එම | කැකිරාව |
| 10. | තල්ගස්වැව | එම | නොච්චියාගම |
| 11. | කදුරුගස්පිටිය | එම | අලගොල්ලෑව |
| 12. | නවක්කුලම | එම | හබරන |
| 13. | ඉලුක්බෝගම | එම | කැකිරාව |
| 14. | කොරසගොල්ලෑවැව | සොරොව්ව අලුත් වැඩියා කිරීම | එම |
| 15. | සාස්ත්‍රවෙල්ලියවැව | අමුණ | එම |
| 16. | හබකුඩා වැව | දියුණු කිරීම | නෑගම |
| 17. | හිනුක්වැගම | එම | මරදන්කඩවල |
| 18. | උණගස්වැව | එම | ඇතාකඩ |
| 19. | දිවුල්ගස්වැව | එම | එම |
| 20. | ගල්ලැල්ලෙගම | එම | එම |
| 21. | යාලේගම | එම | තලාව |

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1970 ජනවාරි මස 4 දින දවල් 12 දක්වා අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 50 ක් (රුපියල් පණහක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළයුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි වියයුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සැමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළයුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ '' .........සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය'' යනුවෙන් සඳහන් කළයුතුය. ටෙන්ඩර් පත්‍ර, 1970 ජනවාරි මස 9 දින දවල් 12 ට පෙර අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති ''ටෙන්ඩර් පෙට්ටියට'' දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර් කරුට ඒ බව අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරි තැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දශ දිනක් ඇතුලත දී එම ටෙන්ඩර්කරු විසින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5%ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාමලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂෙප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමඟ නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමඟ හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට අනුරාධපුරය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන්ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගතයුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමඟ ගිවිසුමකට ඇතුළත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින් වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු වියයුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1970 ජනවාරි මස 9 දින ප.ව. 3.00 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඩී. ඇම්. ආරියරත්න,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්.
අනුරාධපුර දිස්ත්‍රික්කය.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලය,
1969 දෙසැම්බර් මස 7 දින දිය.

12–796—69.12.19 අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජනසේවා දෙපාර්තමේන්තුව

### මාතර දිස්ත්‍රික්කයේ සුළු වාරිමාර්ග කර්මාන්ත

මෙම කාර්යාලයේ, පළාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන්, විවිධ සේවා සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමිති වලින් මාතර දිස්ත්‍රික්කයේ පහත සඳහන් සුළු වාරිමාර්ග කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

#### ගම්වගා නිලධාරි කොට්ඨාශය—වැලිගම

1. එදිරිසිංහ මුලන අමුණ තැනීම : තෙලිජ්ජවිල ගොවි කාරක සභා ප්‍රදේශය.
2. අමුණු ලැලි සැපයීම : වාහල කනංකේ ගොවි කාරක සභා ප්‍රදේශය.
3. කම්බුළුව අමුණ අළුත් වැඩියා කිරීම : තෙලිජ්ජවිල ගොවි කාරක සභා ප්‍රදේශය.
4. අමුණු ලැලි සැපයීම : මාලිම්බඩ නැගෙනහිර ගොවි කාරක සභා ප්‍රදේශය.
5. පරගහවලේ සිට දෙද්දුගොඩ වඩු මුල්ලගොඩ අද්දර බෝක්කුවට ඇල හැරීම : මාලිම්බඩ බටහිර ගොවි කාරක සභා ප්‍රදේශය.
6. මිල්ලහේන දෙල අමුණ තැනීම : නිමලව ගල්ලල ගොවි කාරක සභා ප්‍රදේශය.

#### ගම්වගා නිලධාරි කොට්ඨාශය—මාතර II

7. ඉරිකොඳුවෙල්යායේ සිට වේරදුවෙල්යාය දක්වා ඇල ප්‍රතිසංස්කරණය කිරීම : මාලගොඩ ගොවි කාරක සභා ප්‍රදේශය.
8. කේනමන්විල සිට මහ පාරට වේල්ල, ඇල, ප්‍රතිසංස්කරණය කිරීම : දෙනිපිටිය ගොවි කාරක සභා ප්‍රදේශය.

#### ගම්වගා නිලධාරි කොට්ඨාශය—මාතර I

9. වේරදුව වෙල්යායේ අංක 3 ඇල ශුද්ධ කිරීම : මැද්දවත්ත ගොවි කාරක සභා ප්‍රදේශය.
10. ඉහල වැව පිට ඇල පැති බැම්ම ඉදී කිරීම : පාතෙගම ගොවි කාරක සභා ප්‍රදේශය.
11. කුරුඳුවත්ත අමුනේ සිට දංවැව දක්වා ඇල සහ පැති බැම්ම තැනීම : පරවාහැර ගොවි කාරක සභා ප්‍රදේශය.
12. බිබුල අළුත්වැඩියා කොට වේල්ල තැනීම : හුන්න දෙනිය ගොවි කාරක සභා ප්‍රදේශය.

#### ගම්වගා නිලධාරි කොට්ඨාශය—අකුරැස්ස

13. ඔකන්ද ඇල වේල්ල බැඳීම : මලිදුව 1 දෙල මාවත ගොවි කාරක සභා ප්‍රදේශය.

#### ගම්වගා නිලධාරි කොට්ඨාශය—කිහගොඩ

14. ඔලිය කුඹුර අමුණ සහ ඇල තැනීම : බටුවිට ගොවි කාරක සභා ප්‍රදේශය.

#### ගම්වගා නිලධාරි කොට්ඨාශය—තිබ්බොටුවාව

15. වෙරළුගස් මුල්ලේ සිට පහුන්න විල දක්වා අළුතෙන් පිටවානක් කැපීම : විල්පිට ගොවිකාරක සභා ප්‍රදේශය.
16. අටලාහ අමුණ අළුත්වැඩියා කිරීම : ඌරුවත්ත කෙහෙල්වල ගොවි කාරක සභා ප්‍රදේශය.
17. කිරිදිගහ දෙනියේ සිට නුගේවිල දක්වා පිට ඇල තැනීම : යහමුළු පළාත ගොවි කාරක සභා ප්‍රදේශය.

#### ගම්වගා නිලධාරි කොට්ඨාශය—ඌරුබොක්ක

18. තලවත්ත ඇල : කැටවල ගොවි කාරක සභා ප්‍රදේශය.
19. කොස්කඳ වේල්ල අමුණ : පට්ටිගල උඩුහුපිටිය ගොවි කාරක සභා ප්‍රදේශය.
20. හොරකන්දෙනිය ඇල : පට්ටිගල උඩුහුපිටිය ගොවි කාරක සභා ප්‍රදේශය.
21. අහුල්ලියද්ද දෙල : පට්ටිගල උඩුහුපිටිය ගොවි කාරක සභා ප්‍රදේශය.

#### ගම්වගා නිලධාරි කොට්ඨාශය—කඹුරුපිටිය

22. රතඹලේ කුඹුර අමුණ ප්‍රතිසංස්කරණය : හෙට්ටියාවල ගොවි කාරක සභා ප්‍රදේශය.
23. ඇමද මුල්ල කුඹුර අමුණ ප්‍රතිසංස්කරණය : හෙට්ටියාවල ගොවි කාරක සභා ප්‍රදේශය.
24. වැලිගොඩ කුඹුර අමුණ ප්‍රතිසංස්කරණය : හෙට්ටියාවල ගොවි කාරක සභා ප්‍රදේශය.

#### ගම්වගා නිලධාරි කොට්ඨාශය—දෙයියන්දර

25. බෙල්පමුල්ල මහ අමුණ සෑදීම : දෙයියන්දර ගොවි කාරක සභා ප්‍රදේශය.
26. අළුපොතයායේ මාතර කුඹුරේ සිට කිරම ආර දක්වා ඇල එගොඩ දෙනියේ සිට කිරම ආර දක්වා විශාල කිරීම : දිදදෙනිපොත ගොවි කාරක සභා ප්‍රදේශය.
27. මුල්ලෙගම දෙනිය දෙල වැඩිදියුණු කිරීම : දිදදෙනිපොත ගොවි කාරක සභා ප්‍රදේශය.

#### ගම්වගා නිලධාරි කොට්ඨාශය—මොරවක

28. යටිහොරලෙ මහදෙනිය පැති බැම්ම හා ඇලේ ගල් කැඩීම : වරල්ල ගොවි කාරක සභා ප්‍රදේශය.
29. එළමල් දෙනිය ඇලේ ගල්කඩා අස් කිරීම : කොටගල ගොවි කාරක සභා ප්‍රදේශය.

2. සෑම ටෙන්ඩර පත්‍රයක් ම පිටපත් දෙකකින් විය යුතු ය. ඒවා ඉදිරිපත් කළ හැක්කේ මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන ගෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර වලය. එක එක කර්මාන්තය සඳහා පිටපත් දෙකකින් යුතු ටෙන්ඩර් පත්‍රය බැගින් ඉදිරිපත් කළ යුතු ය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නො කරනු ලබන හෝ මේ කොන්දේසි වලට සම්පූර්ණයෙන් ම එකඟ නොවන කිසි ම ටෙන්ඩරයක් සළකා බලනු නො ලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1970.1.2 වැනි දින දවල් 12.30 දක්වා මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය. කච්චේරියේ රුපියල් දහයක් (රු. 10ක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සිය ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක් ම ටෙන්ඩර් කරු විසින් ම අත්සන් කර තිබිය යුතු ය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන් ම වචනවලින් ද දැක්විය යුතු ය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලව නිවැරදි විය යුතු අතර, දක්වන ලද ගණන්වල සංශෝධනයක් කර තිබේ නම්, ඒ හැම එකක් ම ටෙන්ඩර්කරු ගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතු ය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට දින යොදා සීල් තබන ලද ලියුම් කවර වල බහා, මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන ගේ ලිපිනයට එවිය යුතු ය. ටෙන්ඩර් බහා එවන ලියුම් කවරයේ, උඩ වම් කෙළවරේ "............... සුළු වාරිමාර්ග කර්මාන්ත කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතු ය. ටෙන්ඩර් පත්‍ර 1970.1.7 දින දවල් 12 ට හෝ ඊට පෙර මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නො එසේ නම්, ඒ සඳහා මෙම කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතු ය.

5. තෝරා ගත් ටෙන්ඩර් කරුට ඒ බව මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ ටෙන්ඩර් භාර ගන්නා වූ නිලධාරි තැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම් දීම නිකුත් කළ දින සිට දින දහයක් ඇතුළත දී ටෙන්ඩර් කරු විසින් මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමඟ ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුළත් විය යුතු ය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩ නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට දහයක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතු ය. ගිවිසුම අත්සන් කළ පසු සියලුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුළත් වන ලෙස තෝරා ගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුව හොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජ සන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛණයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසි ම හේතුවක් නො දන්වා ඕනෑ ම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට හෝ නො පැවරිය යුතු ය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් ගේ නාම ලේඛණයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකු ගේ නමත් සමග නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතූන් උඩ මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරකු සමග හෝ ගිවිසුමකට නො බැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑ ම දිනයක කාර්යාලීය වේලාවන් තුළ දී සැලැසුම් පරීක්ෂා කර බැලීමට මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුලත් කළ යුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නො කිරීම නිසා, ටෙන්ඩර් පත්‍රිකාවල ඇති වන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නො කියනු ඇත. යෝජිත ස්ථානයත් සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩ විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුළ දී මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලා පොරොත්තු වන අය අවශ්‍ය සේවය කුමක් දැයි හොඳින් වටහා ගත යුතු ය.

11. තෝරා ගත් ටෙන්ඩර් කරු විසින් සේවයේ යෙදවිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. '' ලාංකික '' යනුවෙන් අදහස් වනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ආණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ගිවිසුමකට ඇතුලත් විය යුතු ය. '' ගොවිජන සේවා සහකාර කොමසාරිස් '' යනුවෙන් හැඳින්වෙනුයේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුර දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියෙකු විසින් 1970.1.8 වැනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැනගැනීම සඳහා ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන් ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් හෝ නො කරනු ඇත. ඕනෑ ම ටෙන්ඩර් කරුවෙකුට මුලු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රයේ අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියලුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගත වන තුරු වළංගුව තිබිය යුතු ය.

කේ. ඒ. පෙරේරා,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
මාතර දිස්ත්‍රික්කය.

මාතර දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලය,
1969 දෙසැම්බර් මස 4 වැනි දින දී ය.

12–807—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### නියමිත යෝජනා ක්‍රමය හා වි කෙටීම

කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත අංක 42 ස්ථානයෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, දැනට වියුනිසියා ගබඩාවේ හා වේයන්ගොඩ ස. මි. ක්‍ර ගබඩාවෙහි ඇති හොණ්ඩර 3,500 ක් පමණ 3 ශ්‍රේණියේ මිරිස් තොගයක් මිළදී ගෙනයාම සඳහා කැඳවනු ලබන ටෙන්ඩර් 1969 දෙසැම්බර් 21 වැනි ඉරිදා ප. ව. 2.30 වනතෙක් බාරගනු ලැබේ.

දිවයිනේ කච්චේරියකට හෝ කොළඹ 7, හෝර්ටන් පෙදෙස අංක 60 දරණ ස්ථානයෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරි තැනට රු. 200 ක තැන්පත් මුදලක් ගෙවා ලබාගත් නාලදකුවිතාන්සියක් ඉදිරිපත් කර, අංක 42, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත කාර්යාලයෙහි ස. මි. ක්‍ර. හා වී. කෙ. අංශයෙන් නිකුත් කරනු ලබන ටෙන්ඩර්පත් ලබාගෙන අනු පිටපතක් ද සහිතව පුරවා එවිය යුතුයි. 1969 දෙසැම්බර් 21 වැනි ඉරිදා දවල් 12 වනතෙක් ටෙන්ඩර්පත් නිකුත්කරනු ලැබේ.

මිරිස් සාම්පල් වියුනිසියා ගබඩාවේදී හෝ වේයන්ගොඩ නි. මි. යෝ. ක්‍ර. ගබඩාවේදී පරීක්ෂාකර බැලිය හැක. වැඩි විස්තර පහත සඳහන් කාර්යාලයෙන් හෝ වියුනිසියා ගබඩාවේ ගණකාධිකාරි තැනගෙන් විමසා දැනගත හැකිවේ.

වි. නි. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1969 දෙසැම්බර් 5 වැනිදා,
කොළඹ 7, තැ. පෙ. අංක 537,
ගොවිජනසේවා දෙපාර්තමේන්තුවේදීය.

12–810—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## ලංකා විදුලි බල මණ්ඩලය

### 1970.2.1 සිට 1971.1.31 දක්වා කාලය තුළ කොළඹ නගරය ඇතුළත යපි බහන් වැලලීම

ලංකා විදුලි බල මණ්ඩලයේ ප්‍රධාන කළමනාකාර තැන වෙත ඉහත සඳහන් කාර්යය කර බාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්‍ෂ 1970 ක්වූ ජනවාරි මස 23 වන සිකුරාදා පූ. භා. 10 දක්වා ලංකා විදුලි බල මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 540, කොළඹ) විසින් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධ ලියකියවිලි කොළඹ, ශ්‍රී චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහිදි කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5 ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, ලංකා විදුලි බල මණ්ඩලයේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5 හේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබා ගත් ටෙන්ඩර් පෝර්මවලයි. වර්‍ෂ 1970 ක්වූ ජනවාරි මස 19 වන දින ප. ව. 2 වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්‍ෂ 1970 ක්වූ ජනවාරි මස 23 වන සිකුරාදා පූ. භා. 10 ට කොළඹ, ශ්‍රී චිත්තම්පලම් ගාඩිනර් මාවතේ ලංකා විදුලි බල මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩල සභාපති තැනගේ කාර්යාලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

පී. ඩබ්ලිව්. මැන්දිස්,
ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන
කළමනාකාර තැන.

තැ. පෙ. 540,
කොළඹ,
1969 ක්වූ දෙසැම්බර් 19 වෙනි දින දීය.

12–856—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

## විභාග දෙපාර්තමේන්තුව

### ඉවතලන කඩදාසි මිළ දී ගැනීමට සහ ඉවත් කර ගැනීම සඳහා මිළ ගණන් කැඳවීම

1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා විභාග දෙපාර්තමේන්තුවේ එකතුවන පහත විස්තර සඳහන් ඉවතලන කඩදාසි මිළදී ගැනීමට සහ ඉවත් කර ගැනීමට මිළ ගණන් 1970 ජනවාරි 3 වැනි දින පස්වරු 2.30 දක්වා මෙයින් කැඳවනු ලැබේ :—

(1) පරණ උත්තර පත්‍ර, පරණ ප්‍රශ්න පත්‍ර සහ අවලංගුවූ ආකෘති පත්‍ර.

(2) ඉවතලන වෙනත් කඩදාසි (පාවිච්චි කළ නොහැකි දුඹුරු කඩදාසි, ලොකු කවර, කුණු කූඩාවල එකතුවන කඩදාසි යනාදිය)

පරණ උත්තර පත්‍රණ පරණ ප්‍රශ්න පත්‍ර සහ අවලංගු වූ ආකෘති පත්‍ර ගෙන යාමට පෙර ඒවා තමාගේම වියදමින් ම කඩදාසි කපන යන්ත්‍ර යකින් රහස්‍ය භාවය ආරක්ෂා වන අන්දමින් කැපිය යුතුය.

ඉදිරිපත් කරන මිළ ගණන් වල පරණ උත්තර පත්‍ර, පරණ ප්‍රශ්න පත්‍ර සහ අවලංගු වූ ආකෘති පත්‍ර හොණ්ඩරයකට ගෙවන මුදලත් අනිකුත් ඉවත ලන කඩදාසි හොණ්ඩරයකට ගෙවන මුදලත් වෙන් වෙන් වශයෙන් දන්විය යුතුයි.

එක් එක් ඉල්ලුම් පත්‍රයක් වෙනුවෙන් විභාග දෙපාර්තමේන්තුවේ රුපියල් 25 ක මුදලක් තැන්පත් කර එම රිසිට් පතේ අංකය සහ දිනයද මිළ ගණන් පත්‍රයේම සුදුසු තැනක සඳහන් කළ යුතුයි.

සාවකීය ඉල්ලුම් පත්‍රය භාරගත් බවට ලිඛිත දන්වීමක් ලද තුන් දිනක් ඇතුළත කිසියම් ඉල්ලුම් කරුවෙකු විසින් එය ප්‍රතික්ෂේප කරනු ලැබුවොත් ඔහු විසින් තැන්පත් කර ඇති මුදල අහිමි වනු ඇත.

පිළිනොගත් ඉල්ලුම්කරුවන්ගේ තැන්පත් මුදල් යථා කාලයේදී ආපසු ගෙවනු ලැබේ.

මිළ ගණන් බහාලනු ලබන ලියුම් කවරවල වම් පැත්තේ උඩ කෙළවරේ "ඉවතලන කඩදාසි මිළදී ගැනීම සඳහා මිළ ගණන්" යන්න සඳහන් කළ යුතුය. සීල් තබන ලද ලියුම් කවර කොළඹ 2, මැලේ වීදියේ, විභාග කොමසාරිස් තැන වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

මිළ ගණන් එවන ලද අයවලුන්ට ඒවා විවෘත කරන ඉහත කී වේලාවලදී ඉදිරියේ සිටිමට ඉඩ දෙනු ලැබේ.

මෙම කඩදාසි වල ආදර්ශයන් සතියේ දිනවල පෙරවරු 9 සිට පස්වරු 4 දක්වාත් පෙර පෝය දිනවල පෙරවරු 9 සිට පෙරවරු 11.30 දක්වාත් කොළඹ 2, විභාග දෙපාර්තමේන්තුවේදී පරීක්ෂා කර බැලීමට පුළුවන.

මිළ ගණන් භාරගත් බව දෙපාර්තමේන්තුවෙන් දැනුම් දීමෙන් පසු වරින් වර එකතුවන කඩදාසි වටිනාකම අනුව මුදල් ගෙවා නො පමාව ගෙන යා යුතුය.

භාණ්ඩ අංක (1) සාර්ථකවූ ඉල්ලුම්කරු රු. 1,000 ක මුදලක් ඇප වශයෙන් විභාග දෙපාර්තමේන්තුවේ තැන්පත් කළ යුතුය.

කේ. ඊ. ඩබ්ලිව්. සුමනසූරිය,
විභාග කොමසාරිස්.

1969 දෙසැම්බර් 13 වැනි දින,
කොළඹ 2, විභාග දෙපාර්තමේන්තුවේදී ය.

12–841—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය

කොළඹ, තැ. පෙ. අංක 1434 රේ ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පඹගින්න මධ්‍යම බෙහෙත් හලේ සහ ඇපොතිකරි නිවාසයේ ජලසම්පාදන සහ පල්දෝරු ක්‍රමයක් ඉදි කිරීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් 1970 ජනවාරි මස 13 වන අඟහරුවාදා පෙරවරු 10 වන තෙක් භාර ගනු ලැබේ.

2. කොළඹ 7, පිහිටි මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි ෆෝරම් වල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරි පත් කළ යුතු ය. ටෙන්ඩර් පත්‍රිකා ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන විසින් 1970 ජනවාරි මස 2 වන සිකුරාදා පස්වරු 4 වන තෙක් නිකුත් කරනු ලබන්නේ ජල සම්පාදන/පල්දෝරු ක්‍රම ඉදි කිරීම සඳහා මහජන ඉංජිනේරු අංශයේ "ඊ" කොටස යටතේ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවන්ට පමණි. ටෙන්ඩර් පත්‍රිකා ලබා ගැනීමට පෙර ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන ගේ නමට අය වන ලෙස කොළඹ, ලංකා බැංකුවේ හෝ කොළඹින් පිටත නම් කච්චේරියක හෝ රුපියල් සියයට 50 ක මුදලක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතු ය.

3. ටෙන්ඩර් පත් ලබාගැනීම වෙනුවෙන් මුදල් තැන්පත් කිරීමෙන් නිදහස් කොට ඇති පහත සඳහන් සංගම් වලට ද ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කොට ඇති ග්‍රාම සංවර්ධන සමිති.

(ඇ) සමුපකාර සංගම් රෙජිස්ට්‍රාර් තැන විසින් ලියාපදිංචි කොට ඇති සමුපකාර සංගම්.

4. ටෙන්ඩර් පත් කොළඹ, 7, ටොරින්ටන් චතුරශ්‍රයේ ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු කායාර්ලයේ ටෙන්ඩර් මණ්ඩල කායාර්ලයේ තබා ඇති පෙට්ටියේ තැන්පත් කළ යුතු ය. නැතහොත් ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතු ය. ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් හෝ විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් ඉහත සඳහන් ස්ථානයේ ටෙන්ඩර් පත් පිළිගැනීමේ බලය ලබා ඇති නිලධරයෙකුට භාර දිය හැකි ය. සේවයේ විස්තර ද, ටෙන්ඩර් කරුවන්ගේ නම සහ ලිපිනය ද, කවරයේ සඳහන් කළ යුතු ය. ටෙන්ඩරය භාර ගත් බවට ඉහත සඳහන් නිලධාරි තැන විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

5. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේ දී නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී සෑම ඉල්ලුම් කරුවෙකුට ම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත. ටෙන්ඩර්කරුවන් ගේ නම් සහ මිළ ගණන් පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි දී කියවනු ලැබේ. ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන්ගේ අනුමැතිය අනුව කිසියම් ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට ටෙන්ඩර් කරුවකුට අවශ්‍ය වුව හොත් එකී ටෙන්ඩරයේ පිටපත පරීක්ෂා කර බැලීම සඳහා අවසර දෙනු ලැබේ.

6. මෙම වැඩයට උවමනා සිමෙන්ති ප්‍රමාණය මිළ දී ගැනීමට අවශ්‍ය අවසර පත්තරය ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලයෙන් හෝ සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් හෝ ලබා ගැනීම සඳහා නියමිත නිර්දේශය සාර්ථක ටෙන්ඩර්කරු වෙත නිකුත් කරනු ලැබේ.

7. මෙම වැඩය සඳහා අවශ්‍ය, මෙ රටින් ලබා ගත නො හැකි බඩු බාහිරාදිය ආනයනය කිරීම සඳහා බල පත්‍ර ලබා ගැනීම ද නිර්දේශ කරනු ලැබේ.

8. වැඩය පිළිබඳ තව දුරටත් විස්තර කොළඹ 7, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

එස්. ඊ. ජේ. මේදර්,
ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන.

1969 දෙසැම්බර් මස 6 වන දා,
කොළඹ 7, තැ. පෙ. 1434 දී.

12–723—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව — මොණරාගල

### සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර්

මෙම කාර්යාලයේ, පළාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් හා විවිධ සේවා සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචිවී ඇති අනිකුත් සමුපකාර සමිතිවලින් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

### සුළු වාරිමාර්ග කර්මාන්ත—මොණරාගල දිස්ත්‍රික්කය

**1. ග. ව. නි. කොට්ඨාශය—බඩල්කුඹුර**

1. බලගහ ගෙදර යායේ පෝරාව
2. කීනගහ කුඹුර ඇල දියුණු කිරීම
3. කොටමුදුන ඇල දියුණු කිරීම
4. මැදඅරාව අමුණ

**2. ග. ව. නි. කොට්ඨාශය—වැල්ලවාය**

5. මල්අත්තාවෙල ඇල
6. වැවල රෙගුලේටරය
7. මීගස් වැව
8. කොමලී ගම වැව
9. කුඩාඔය ගල්වැව ඇල
10. තෙරළුව වැව

**3. ග. ව. නි. කොට්ඨාශය—බුත්තල**

11. ගොඩකුඹුර රෙගුලේටරය
12. අළුත්වෙලලන්ද ඇල
13. පිඹුරලන්ද ඇල

**4. ග. ව. නි. කොට්ඨාශය—මැදගම**

14. තලගහවෙලේ පෝරාව

**5. ග. ව. නි. කොට්ඨාශය—දොඹගොල්ල**

15. මීගහ අරාව වැව

**6. ග. ව. නි. කොට්ඨාශය—බිබිල**

16. වටවන ගල්පෝරාව
17. කෑලදෙන අමුණ

**7. ග. ව. නි. කොට්ඨාශය—[illegible]ඔය**

18. අස්වැද්දුමේ අමුණ
19. දෙහිගහවෙල අමුණ

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්තවිය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසිවලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1970 ජනවාරි මස 2 දින දවල් 12 දක්වා මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිල ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දැක්විය යුතුය. මිල ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි වියයුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩර කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ "මොණරාගල දිස්ත්‍රික්කයේ ........................සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර 1970 ජනවාරි මස 4 දින දවල් 12ට පෙර මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නොඑසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරි තැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දස දිනක් ඇතුලත දී එම ටෙන්ඩර්කරු විසින් මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5% ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට ඇතුලත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමග නම ඇතුලත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ, මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවේ ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයන්, සැලසුම් ආදියත් පරීක්ෂාකර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගතයුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

12. තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින, මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත්විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු වියයුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1970 ජනවාරි මස 4 දින ප.ව. 2 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැනගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවනතුරු වලංගුව තැබිය යුතුය.

ඩබ්. පී. ඩබ්. වීරවර්ධන,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
මොණරාගල දිස්ත්‍රික්කය.

මොණරාගල දිස්ත්‍රික්කයේ,
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලය,
1969 දෙසැම්බර් මස 9 දින දීය.

12–824—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කාර්‍යාලයේ පළාතේ කච්චේරියේ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ඇති කොන්ත්‍රාත්කරුවන් ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

### වැඩ ලැයිස්තුව

| | | | | |
|---|---|---|---|---|
| 1. තලවුව වැව | ... | පැන්නුම බැඳීම | ... | වැ.වි.හ.ප. |
| 2. තලවුඅංග වැව | ... | දියුණු කිරීම | ... | එම |
| 3. පනාගමුව වැව | ... | එම | ... | එම |
| 4. අළුත්වැව ... | ... | එම | ... | එම |
| 5. හැවැන්දන කුඹුර | ... | පැන්නුම බැඳීම් | ... | එම |
| 6. රත්මල්ගොඩ අමුණ | ... | අළුත්වැඩියාව | ... | එම |
| 7. අඹගහමුල අමුණ | ... | එම | ... | එම |
| 8. මාතලේපොල අමුණ | ... | එම | ... | එම |
| 9. කන්දති කුඹුර | ... | එම | ... | එම |
| 10. උඩකුඹුරේ අමුණ | ... | අමුණ බැඳීම | ... | එම |
| 11. පල්ලියේවත්ත වැව | ... | හොරොව්ව අළුත් වැඩියාව | | එම |
| 12. කටුකනු අමුණ | ... | අමුණ බැඳීම | ... | ද.දෙ.හ.ප. |
| 13. නාඩාවාරි අමුණ | ... | එම | ... | එම |
| 14. යාල්ලියද්දේ අමුණ | ... | එම | ... | එම |
| 15. බෝගහඇල අමුණ | ... | අළුත්වැඩියාව | ... | එම |
| 16. ගම්මනේ කුඹුර | ... | වාරි පහසුකම් | ... | එම |
| 17. කොළඹලාමුල්ල අමුණ | ... | අමුණ බැඳීම | ... | එම |
| 18. ගුරු වැව ... | ... | දියුණු කිරීම | ... | ක.හ.ප. |
| 19. අමුණුපිටියේ වැව | ... | එම | ... | එම |
| 20. වීරකොඩියාන බැම්ම | ... | බැම්ම බැඳීම | ... | එම |
| 21. වීරකොඩියාන වැව | ... | දියුණු කිරීම | ... | එම |
| 22. ගෝන ඇල | ... | බැම්ම බැඳීම | ... | එම |
| 23. නාගහ බැම්ම | ... | එම | ... | එම |
| 24. කොටුවැව | ... | අමුණ බැඳීම | ... | එම |
| 25. මාවෙල බැම්ම | ... | බැම්ම බැඳීම | ... | එම |
| 26. හුංගාවෙල බැම්ම | ... | එම | ... | එම |
| 27. මහවාන බැම්ම | ... | එම | ... | එම |
| 28. ඉරබඩගම ඇල | ... | රෙගුලේටරය සෑදීම | | එම |
| 29. ගමවෙලේ ඇල සුද්ධ කිරීම | | ඇල සුද්ධ කිරීම | | එම |
| 30. හතරමුනේ බැම්ම | ... | බැම්ම බැඳීම | ... | එම |
| 31. විහේන බැම්ම | ... | එම | ... | එම |
| 32. පොතුපිටිය වැව | ... | දියුණු කිරීම | ... | දෙ.මැ.හ.ප. |
| 33. මැදගම වැව | ... | එම | ... | එම |
| 34. මයිලගහ අමුණ | ... | අළුත්වැඩියාව | ... | එම |
| 35. තෙලහැර මහවැව | ... | දියුණු කිරීම | ... | එම |
| 36. ගලටබැදි වැව | ... | එම | ... | එම |
| 37. බෙලිවැව මහවැව | ... | එම | ... | එම |
| 38. කිතගම වැව | ... | එම | ... | එම |
| 39. ආරච්චිගමු වැව | ... | එම | ... | එම |
| 40. කනාගේ ඇලේ කනුකැටේ බැම්ම | | බැම්ම බැඳීම | ... | එම |
| 41. බෝගොඩ මහවැව | ... | දියුණු කිරීම | ... | එම |
| 42. අමුණුකුඩුවේ අමුණ | ... | අමුණ බැඳීම | ... | එම |
| 43. බොරලුවේ අමුණ | ... | එම | ... | එම |
| 44. දිග්ගලගෙදර මහවැව | ... | ප්‍රතිසංස්කරණය | ... | එම |
| 45. බුලන වැව | ... | එම | ... | එම |
| 46. දඹැලියද්ද මහවැව | ... | එම | ... | එම |
| 47. වහන්තරේ මහවැව | ... | එම | ... | එම |
| 48. පොහොරවත්ත වැව | ... | එම | ... | හි.හ.ප. |
| 49. බඩල්වැව | ... | එම | ... | එම |
| 50. පහලවෙල අමුණ | ... | හුලුසුව සෑදීම | ... | එම |
| 51. මාළිය වැව | ... | ප්‍රතිසංස්කරණය | ... | එම |
| 52. පොකුකොල වැව | ... | එම | ... | එම |
| 53. දිවුල්ගනේ වැව | ... | එම | ... | වි.හ.ප. |
| 54. මහකන්නෝරුව වැව | ... | ප්‍රතිසංස්කරණය | ... | වි. හ. ප. |
| 55. කුඩාකන්නෝරුව වැව | ... | එම | ... | එම |
| 56. කප්පරවල්ලිය වැව | ... | දියුණු කිරීම | ... | එම |
| 57. වඳුරස්ස මහවැව | ... | එම | ... | එම |
| 58. සමගිය වැව | ... | එම | ... | එම |
| 59. මොරගොල්ල මහවැව | ... | එම | ... | එම |
| 60. පහලගම වැව | ... | අළුත්වැඩියා කිරීම | ... | එම |
| 61. කපුලන්දේ වැව | ... | එම | ... | එම |
| 62. දෙමටගහ වැව | ... | එම | ... | එම |

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ ඒ කොන්දෙසිවලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1970 ජනවාරි 3 වන දින දවල් 12 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්‍යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 10ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචනවලින්ද දක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි විය යුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සැමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ "......සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර 1970 ජනවාරි 4 වන දින පෙ.ව. 10 ට පෙර කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නොඑසේ නම්, ඒ සඳහා මේ කාර්‍යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාර ගන්නාවූ නිලධාරි තැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම් දීම නිකුත් කළ දින සිට, දශ දිනක් ඇතුළතදී එම ටෙන්ඩර්කරු විසින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුළත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5%ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුළත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුවද, එසේ කිරීමට ඔහු අසමත් වුවහොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනමැ ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමග නම ඇතුළත්වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතූන් උඩ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්‍යාලීය වේලාවන් තුළදී සැලසුම් පරීක්ෂා කර බැලීමට කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළ යුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයන්, සැලසුම් ආදියත් පරීක්ෂාකර බැලීමෙන්ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්‍යාලීය වේලාවන් තුළදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන්ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහාගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන්වූ අයයි,

12. තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින කු/ගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියෙකු විසින් 1970 ජනවාරි මස 4 දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැනගැනීම සඳහා ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඩී. එෆ්. බාලචන්ද්‍ර,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
කුරුණෑගල දිස්ත්‍රික්කය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලය,
1969 දෙසැම්බර් මස 9 වැනි දින.

12–835—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

යොමුව : පීඇස් ඩී2/45/69.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ස්වයංක්‍රිය ජීවානුහරණ සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ස්වයංක්‍රිය ජීවාණුහරණ සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

(i) විදේශීය රටවල නමගිය නිපදවන්නෝ,

(ii) ලණ්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්,

(iv) ඔස්ට්‍රියාව, පෝලන්තය, චෙකොස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස. සෝ. රු. ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, තැ. පෙ. 584 හිමි කොළඹ, රැජින වීදියේ සෙලින්කෝ මන්දිරයේ පස්වෙනි මාලයේ දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970 පෙබරවාරි 20 දින පෙරවරු 10 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ—

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛණගත කොට ඇති වෙළඳ සමාගම්වලින්,

(ii) 1 වැනි ඡේදයේ (iv) වැනි උප ඡේදයේ සඳහන් රාජ්‍යයන්ට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමති විදේශීය සමාගම්වලට අවශ්‍ය ටෙන්ඩර් කොන්දේසි, උපලේඛන හා වෙනත් විස්තර ඉතාලිය, ඕස්ට්‍රේලියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍යය, පකිස්ථානය, ජපානය, ඉන්දියාව, බටහිර ජර්මනිය, ප්‍රංශය, කැනඩාව, නෙදර්ලන්තය, බැල්ජියම, ඩෙන්මාර්ක්, ස්විස්ටර්ලන්තය ආදී වෙසෙන ලංකා රජයේ නියෝජිතයින්ගෙන් ලබාගන්නා ලෙස ඒජන්ට්වරු සහ නියෝජිතයින් විදේශීය සමාගම්වලට උපදෙස් දිය යුතුයි.

5. ඉහත 2 වැනි ඡේදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර් කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයින්ට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

6. මේ සම්බන්ධ විස්තර, කොළඹ 10 ඩීන්ස් පාරේ අංක 355 ‹ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබාගත හැක.

ඇන්. කේ. පී. විජයසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවෙ

කොළඹ, 1969.12.10.

12–749—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

යොමුව : පීඇස්ඩී 2/53/69

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### සෝඩියම් අමිනෝ සැලිසිලේට් යනාදිය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් සෝඩියම් අමිනෝ සැලිසිලේට් යනාදිය සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

(i) අංක 14,843 දරණ 1969.2.28 වැනි දිනැති "රජයේ ගැසට් පත්‍රයේ" පළකොට ඇති නාමාවලියෙහි සඳහන් මා විසින් ලේඛනගත කළ වෙළඳ සමාගම්,

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්,

(iv) ඔස්ට්‍රියාව, පෝලන්තය, සෙකොස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස.සෝ.රු.ස., යුගොස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බුල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ, තැ.පෙ. 584, මහලේකම් කාර්යාලයේ, 'බී' කොටසේ දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970.2.24 දින පෙරවරු 10 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ,

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛණගත කොට ඇති වෙළඳ සමාගම්වලටත්,

(ii) 1 වැනි ඡෙදයේ iv වැනි උප ඡෙදයේ සඳහන් රාජ්‍යයනට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ඉහත 2 වැනි ඡෙදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩදෙනු ලැබේ.

5. මේ සම්බන්ධ වැඩි විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබාගත හැක.

ඇන්. කේ. පී. විජයසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

කොළඹ, 1969.12.10.

### SCHEDULE REFERRED TO

| *Item No.* | *Description* | *Estimated requirements* | *Packing required* |
|---|---|---|---|
| 1 | Sodium Amino Salicylate B.P. 1963 enteric coated and not sugar coated each tablet containing 0.5 grammes of Sodium Amino Salicylate | 50,000,000 Tablets | In lever lid tins of 1,000 tablets |
| 2 | Pyrazine—2—Carboxymide 0.5 grammes | 400.000 Tablets | In bottles of 500 tablets |
| 3 | Combination of Isoniazid and Thiacetazone each tablet containing Isoniazid 75mgm and Thiacetazone 37.5mgm | 2,000,000 Tablets | In bottles of 1,000 tablets |
| 4 | Cycloserine B.P. each capsule containing 250mgm Cycloserine B.P. | 25,000 Capsules | In bottles of 500 capsules |
| 5 | Kanamycin Sulphate each vial containing 1 gramme | 3,000 Vials | In boxes of 100 vials |

12—750—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය

කොළඹ, තැ. පෙ. අංක 1434 යේ සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, වැලිමඩ රජයේ රෝහලේ ජල සම්පාදන ක්‍රමය සඳහා විදුලි බලයෙන් ක්‍රියාකරන පොම්ප සැපයීම සහ සවි කිරීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් 1970 ජනවාරි මස 13 වන අඟහරුවාදා පෙරවරු 10 වන තෙක් භාර ගනු ලැබේ.

2. කොළඹ 7, පිහිටි මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන ගේ කාර්යාලයෙන් ලබා ගත හැකි ෆෝරම් වල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍රිකා ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන විසින් 1970 ජනවාරි මස 2 වන සිකුරාදා පස්වරු 4 වන තෙක් නිකුත් කරනු ලබන්නේ ජල සම්පාදන ඉදිකිරීම සඳහා මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ "ඊ" කොටස යටතේ ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවන්ට පමණී. ටෙන්ඩර් පත්‍රිකා ලබා ගැනීමට පෙර ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන ගේ නමට අය වන ලෙස, කොළඹ, ලංකා බැංකුවේ හෝ කොළඹින් පිටත නම් කච්චේරි යක හෝ රුපියල් 50 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවි තාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් පත් ලබා ගැනීම වෙනුවෙන් මුදල් තැන්පත් කිරී මෙන් නිදහස් කොට ඇති පහත සඳහන් සංගම් වලට ද ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කොට ඇති ග්‍රාම සංවර්ධන සමිති.

(ඇ) සමුපකාර සංගම් රෙජිස්ත්‍රාර් තැන විසින් ලියා පදිංචි කොට ඇති සමුපකාර සංගම්.

4. ටෙන්ඩර් පත් කොළඹ 7 ටොරින්ටන් චතුරශ්‍රයේ සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ, ටෙන්ඩර් මණ්ඩල කාර්යාලයේ තබා ඇති පෙට්ටියේ තැන්පත් කළ යුතුය. නැතහොත් ලියා පදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුය. ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් හෝ විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් ඉහත සඳහන් ස්ථානයේ ටෙන්ඩර් පත් පිළිගැනීමේ බලය ලබා ඇති නිලධරයෙකුට භාර දිය හැකිය. පෙට්ටියේ විස්තරද, ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ලිපිනය ද, කවර යේ සඳහන් කළ යුතුය. ටෙන්ඩරය භාර ගත් බවට ඉහත සඳහන් නිලධාරි තැන විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

5. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේ දී නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී සෑම ඉල්ලුම් කරුවෙකුටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත. ටෙන්ඩර් කරුවන් ගේ නම් සහ මිල ගණන් පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියෙහිදී කියවනු ලැබේ. ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාගේ අනුමැතිය අනුව කිසියම් ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට ටෙන්ඩර් කරුවකුට අවශ්‍ය වුවහොත් එකී ටෙන්ඩරයේ පිටපත පරීක්ෂා කර බැලීම සඳහා අවසර දෙනු ලැබේ.

6. මෙම වැඩයට උවමනා සිමෙන්ති ප්‍රමාණය මිල දී ගැනීමට අවශ්‍ය අවසර පත්තරය ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලයෙන් හෝ සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් හෝ ලබා ගැනීම සඳහා නියමිත නිර්දේශය සාර්ථක ටෙන්ඩර්කරු වෙත නිකුත් කරනු ලැබේ.

7. මෙම වැඩය සඳහා අවශ්‍ය මෙරටින් ලබා ගත නොහැකි බඩු බාහිරාදිය ආනයනය කිරීම සඳහා බල පත්‍ර ලබා ගැනීම ද නිර්දේශ කරනු ලැබේ.

8. වැඩය පිළිබඳ තව දුරටත් විස්තර කොළඹ 7, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන වෙනුවට.

1969 දෙසැම්බර් මස 9 වනදා,
කොළඹ 7, තැ. පෙ. 1434 දී.

12-738—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## කයිතඩි රජයේ මහළු නිවාසය

1970 පෙබරවාරි මස 1 වන දින සිට 1970 සැප්තැම්බර් මස 30 වන දින දක්වා කයිතඩි රජයේ මහළු නිවාසයට මිනී පෙට්ටි සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ. මේ ගැන වැඩි විස්තර කයිතඩි රජයේ මහළු නිවාසයේ අධිකාරීතැනගෙන් ලබාගත හැක.

2. ටෙන්ඩරය ඇතුලත් ලියුම් කවරයෙහි වම් පස උඩ කෙළවරෙහි "1969/70 වර්ෂයේදී කයිතඩි රජයේ මහළු නිවාසයට මිනීපෙට්ටි සැපයීමේ කොන්ත්‍රාත්තුව සඳහා ටෙන්ඩරය" යනු ලියා සීල් තබා රෙජිස්ටර් තැපැල් මාර්ගයෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

ටෙන්ඩර් පත් භාරගන්නේ 1969. 12. 31 දා දහවල් 12 වන තෙක් ය.

ටෙන්ඩර්කරුවන්ට කැමති නම්, ටෙන්ඩර් පත් මෙම කායාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දමත හැක.

3. ටෙන්ඩර්, කයිතඩි රජයේ මහළු නිවාසයේ අධිකාරීගෙන් ලබා ගන්නා ෆෝර්මවල ලියා, ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ෆෝර්ම ලබා ගන්නට පැමිණිවිට, අවශ්‍ය නම් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි ටෙන්ඩර්කරුවන්ට තේරුම් කර දෙනු ඇත.

4. ටෙන්ඩර් පත්‍රිකාවන් නිකුත් කිරීමට පෙර රු. 10 ක මුදලක් අධිකාරි වෙත තැන්පත් කොට එම කුවිතාන්සිය කයිතඩි රජයේ මහළු නිවාසයේ අධිකාරී වෙත තමන්ම පැමිණ භාරදිය යුතුය. මේ මුදල් පිළිගත් ටෙන්ඩරය හිමි අය විසින් තැන්පත් කළයුතු ඇප මුදලේ කොටසක් වශයෙන් සලකනු ඇත. පොරොන්දුව ද බැඳි වැඩ අරඹන්නට මත්තෙන්, පිළිගත් ටෙන්ඩරය හිමි අය විසින් තැන්පත් කළ යුතු ඇප මුදලේ ඉතිරි කොටස වශයෙන් තව රුපියල් 15 ක මුදලක්ද, තැන්පත් කළ යුතුවේ. ප්‍රතික්ෂේප කරනු ලැබූ ටෙන්ඩර්කරුවන්ගේ ඇප මුදල් ආපසු ගෙවනු ලැබේ.

5. ටෙන්ඩර්කරුවන් විසින් නියමිත ටෙන්ඩර පත්‍ර සෑම අයුරින්ම සම්පූර්ණව පිළියෙළ කිරීමට වගබලා ගත යුතුවේ. නියමිත අන්දමට පිළියෙල කර නොමැති ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කිරීමට සමාජ සේවා අධ්‍යක්ෂතැනට බලය තිබේ.

6. යම් ටෙන්ඩර්කරුවකුගේ ටෙන්ඩරය භාරගත් බවට ඔහුට දැනුම් දීමෙන් පසු ඔහු විසින් කොන්ත්‍රාත්තුවට බැඳීම ප්‍රතික්ෂේප කළහොත් නොහොත් එය පැහැර හැරියහොත්, එසේත් නැතහොත්, අවශ්‍ය අවස්ථාවේදී ඇප මුදල නොබැන්දොත්, ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කරනු ලැබේ.

7. යම් ටෙන්ඩරයක් නොහොත් සියළුම ටෙන්ඩර් කිසිම විරුද්ධ කමකට ඉඩ නොමැතිව ප්‍රතික්ෂේප කරන්නටත්, අවුරුද්දකට නොවැඩි ඕනෑම කාලසීමාවකට යම් ටෙන්ඩරයක් පිළිගන්නටත් ආණ්ඩුවට බලය තබාගනු ලැබේ.

සී. තිරුකුණනාදන්,
සමාජ සේවා අධ්‍යක්ෂ වෙනුවට.

සමාජ සේවා දෙපාර්තමේන්තුව,
බාලදක්ෂ මාවත,
ගාලු මුවදොර, කොළඹ,
1969. 12. 19 වැනි දින.

12-736—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

### මහනුවර ගොඩනැගිලි කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම

මහනුවර ගොඩනැගිලි කටයුතු සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය හා උපකරණ රාශියක් වුවමනා වී තිබේ. මොරටුව-රත්මලානේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු තැන වෙත ලියාපදිංචි වන සැපයුම්කරුවන්ගෙන් පමණක් ඒ ඒ අවස්ථාවන්හිදී ලබා ගන්නා ලද මිල ගණන් අනුව අවශ්‍ය ගොඩනැගිලි උපකරණ සහ ද්‍රව්‍ය සපයා ගනු ලැබේ.

ගොඩනැගිලි උපකරණ සහ ද්‍රව්‍ය සැපයීම සඳහා ලියාපදිංචි වීමට කැමති අය විසින් 1970.1.5 දින දහවල් 12 ට පෙර මොරටුව-රත්මලානේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු තැන වෙත, සවකීය නම් හා ලිපිනයත් ඉදිරිපත් කළ යුතුයි. ලියුම් කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ "මහනුවර ගොඩනැගිලි කටයුතු සඳහා අවශ්‍ය උපකරණ සහ ද්‍රව්‍ය සැපයීම" යනුවෙන් සඳහන් කළ යුතුයි. ද්‍රව්‍ය සහ උපකරණ සැපයීමට ලියා පදිංචි වීම සඳහා ඉදිරිපත් කෙරෙන ඉල්ලුම්පත්‍ර සමඟ පහත සඳහන් විස්තරද සැපයිය යුතුය :—

(අ) ඉල්ලුම්කරුට සැපයිය හැකි කුමන ගොඩනැගිලි උපකරණ සහ ද්‍රව්‍ය දැයි දක්වෙන ලැයිස්තුවක්,

(ආ) ලොරි, ටිපර් සහ ට්‍රැක්ටර් වැනි තමන් සතු වාහනවල ලියාපදිංචි කිරීමේ අංක දක්වෙන ලැයිස්තුවක් (එක් එක් වාහනය මේ අවුරුද්ද සඳහා ලියාපදිංචිකොට සහ රක්‍ෂණය කොට තිබේදැයි සඳහන් කළ යුතුය),

(ඇ) මෙවැනි සැපයීම් වැඩ කොට ලත් පළපුරුද්ද සනාථ කිරීමේ ලිඛිත සාධක.

අවශ්‍ය වී තිබෙන උපකරණ පහත සඳහන් වේ:—

1. අඟල් $\frac{3}{4}$ කළුගල්
2. අඟල් 1 කළුගල්
3. අඟල් $1\frac{1}{2}$ කළුගල්
4. අඟල් 2 කළුගල්
5. ගඩොල්
6. ගංගාවැලි
7. අළුහුණු සහ පුච්චාපු හුණු
8. 6″—9″ දක්වා සක්ක ගල්
9. රවුම් ලී කණු
10. පලංචි සඳහා උණ බම්බු.

එච්. සී. ඩී. ද සිල්වා,
ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු (ගොඩනැගිලි).

ගොඩනැගිලි ඒකකය,
තැ. පෙ. 6,
මොරටුව.

12–769—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

රත්මලාන දුම්රිය කර්මාන්තශාලාවේ ඇති පාවිච්චියෙන් ඉවත් කරන ලද බොයිලේරු 12ක් මිළයට ගෙන ඉවත් කර ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර දුම්රිය මූලස්ථාන ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් (ලිපිනය: දුම්රිය සාමාන්‍යාධිකාරි කායාීලය, තැ. පෙ. 355, කොළඹ 10) 1970 ජනවාරි මස 19 වැනිදා පෙ. ව. 11 වන තෙක් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කිරීමට පෙර, අවශ්‍ය වුවහොත් ටෙන්ඩර්කරුවන් විසින් ඉහත සඳහන් සේවා භාරගැනීමට සහ සතුටුදායක ලෙස ඉටුකිරීමට තමාගේ මුදල් තත්ත්වයේ ප්‍රමාණවත් බව ඔප්පු කිරීමට අදාලවන ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

3. කොළඹ 10 හා දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්ම කොලවල ටෙන්ඩරය ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුය.

4. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 1,000 ක් කොළඹ 10 හි දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි කාර්යාලයෙහිදී හෝ කොළඹින් පිට නම්, ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1970 ජනවාරි මස 18 වැනිදා දහවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

5. 1970 ජනවාරි 19 වැනිදා පෙ. ව. 11.05 ට දුම්රිය සාමාන්‍යාධිකාරි කායාීලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

6. වැඩිමනත් විස්තර අවශ්‍ය නම්, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකිය.

ඇම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.

කොළඹ,
1969. 12. 10 වැනි දින.

12–767—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1970 ජනවාරි 20 වෙනි අඟහරුවාදා පස්වරු 2.30 දක්වා හලාවත දිස්ත්‍රික්කයේ, සින්නකුරුප්පුපොනේට වොන් $\frac{1}{2}$ සිට 1 දක්වා බරැති කලුගල් 4,000 ක් සහ අඟල් 9″-12″ සක්ක ගල් කියුබ් 200 ක් සපයා භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1970 ජනවාරි 20 වෙනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

ටෙන්ඩර්කරුවන් කලුගල් පුපුරවීමට හා ඒවා ප්‍රවාහනය කිරීමට අවශ්‍ය යන්ත්‍ර සහ උපකරණ හා වාහන ආදිය තමන් සතුව ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමට හැකි විය යුතු අතර දැනටමත් විශාල කොන්ත්‍රාත්තු යටතේ කුට්ටිගල් සපයා තම හැකියාවන් තහවුරු කර සිටිය යුතුය.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාරගැනීම සඳහා පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාරදී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය. නැත හොත් ටෙන්ඩර්කරුවන්ට තමන්ගේ ටෙන්ඩර්, දෙපාර්තමේන්තු ටෙන්ඩර් පෙට්ටියෙහි පුද්ගලිකව තැන්පත් කළ හැක.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛණ කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේදී පරීක්ෂාකළ හැක. රු. 100 ක මුදලක් වරාය කොමිෂන් සභා කායාීලයේ තැන්පත්කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසිවලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් පෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1970 ජනවාරි මස 18 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත්කරනු ලැබේ.

ඇල්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

කොළඹ වරාය කොමිෂන් සභා කායාීලයේදීය,
කොළඹ 1.
1969.12.19.

12–746—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

1970 වර්‍ෂය තුළදී යාපනයෙහි පිහිටි " ඒ ", " බී ", " සී " සහ " ඩී " වර්ගවල (ටෙන්ඩර් වෙන වෙනම එවිය යුතුයි) රජයේ ගොඩනැගිලිවලට නඩත්තු කිරීම සහ සුළු වැඩි දියුණු කිරීම සඳහා එවන ටෙන්ඩර් පත් යාපනයේ, වෙරළ පාරේ, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ, උතුරු කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයෙහිවූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970 ජනවාරි 21 දින පෙරවරු 10.30 වනතෙක් භාරගනු ලැබේ.

2. යාපනයේ දිස්ත්‍රික්ක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොල ලබාගෙන ටෙන්ඩර් පත් ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුය. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැක.

3. 1970 ජනවාරි මස 9 වැනි දින පස්වරු 4.30 වනතෙක් රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ/ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රු. 60,000 නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට වර්ග " ඒ " පමණක් සහ රු. 75,000, වර්ග " බී " පමණක් සහ රු. 67,000, වර්ග " සී " පමණක් සහ රු. 30,000 වර්ග " ඩී " පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට, ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 (" ඒ ", " බී " සහ " සී " වර්ගයන් සඳහා) රු. 50 (" ඩී " වර්ගය සඳහා) තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර්පත් සඳහා ප්‍රමාදවී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත්කරණ නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබා ගත යුතුය.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කල යුතුයි.

5. ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තු වන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර නිකුත් කරන නිලධාරි තැන ගෙන් ලබා ගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැකිය.

කේ. මාණික්කම්,
අධිකාරි ඉංජිනේරු, උ. කො. (ගොඩනැගිලි).

අධිකාරි ඉංජිනේරු කාර්යාලය, උ. කො.,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
යාපනය, 1969 දෙසැම්බර් මස 9 දින දීය.

12–755—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

1970 වර්ෂය තුළ මීගමු දිස්ත්‍රික්කයේ "ඒ" ශ්‍රේණියට අයත් රජයේ ගොඩනැගිලි නඩත්තු කිරීම හා සුලු වැඩිදියුණු කිරීම් යනාදිය සඳහා වූ ටෙන්ඩර් පත්, කොළඹ 1, "ට්‍රාන්ස්වර්ක්ස්" මන්දිරයෙහි ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1970 ජනවාරි මස 18 වැනි ඉරුදින පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. මීගමුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික්ක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්‍රවල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළයුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්ම ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පිළිවන.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ/ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,50,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පිළිබඳ තැන්පත් මුදල වන රු. 200 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1970 ජනවාරි මස 2 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසුවනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම්කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමා වීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළයුතු වේ.

5. ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළයුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළයුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ඩබ්ලිව්. ඇන්. ජී. මොට්සන්,
ගොඩනැගිලි අධ්‍යක්ෂ වෙනුවට.

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය,
"ට්‍රාන්ස්වර්ක්ස්" මන්දිරය,
තැ. පෙ. අංකය 504,
කොළඹ 1, 1969. 12. 12.

12–751—69.12.19 දින් අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

කලුතර දිස්ත්‍රික්කයේ "ඒ" ඒකකයේ රජයේ ගොඩනැගිලිවල නඩත්තු කිරීම් සහ වැඩිදියුණු කිරීම් සහ එකතු කිරීම් සඳහා වූ ටෙන්ඩර්පත් කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ පිහිටි ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ බටහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයේ වූ ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් 1970 ජනවාරි මස 18 දින පූර්වභාග 11 වන තෙක් භාරගනු ලැබේ.

2. කලුතර දිස්ත්‍රික් ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්‍රවල ටෙන්ඩර්පත් පිළියෙළ කොට අනුපිටපත්ද සහිතව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු අතර, අවශ්‍ය විස්තර ඔහුගෙන් ලබා ගත හැක. සැලැස්මද ඔහුගේ කාර්යාලයෙන් බලාගත හැකිය.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ 1969.10.1 දිනට පසු ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ වැඩ සඳහා රුපියල් හතලිස් අටදහසකට (රු. 48,000) නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1970 ජනවාරි මස 6 වැනි දින ප. ව. 1 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර්පත් එවීමට සුදුසුවනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාදවී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු නොගෙවන ප්‍රමාදවීමේ ගාස්තුවක්, නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබා ගත යුතුය.

4. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරුගේ, කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

5. ටෙන්ඩර්පත් ලබා ගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳවූ සියලු විස්තර අඩංගු කළ ආකෘති පත්‍ර නිකුත් කරන නිලධාරි තැනගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ 1, "ට්‍රාන්ස්වර්ක්ස්" මන්දිරයේ පිහිටි ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම දිසාපති කාර්යාලයක හෝ තැන්පත් කළ හැක.

ඇන්. පී. රාජන්,
බටහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු (ගොඩනැගිලි).

1969. 12. 9 වන දින,
කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ
ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ
බ.කො.අ.ඉ. (ගො) කාර්යාලයේ දීය.

12–742/1—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

කලුතර දිස්ත්‍රික්කයේ "බී" ඒකකයේ රජයේ ගොඩනැගිලිවල නඩත්තු කිරීම් සහ සුළු වැඩිදියුණු කිරීම් සහ එකතු කිරීම් සඳහා වූ ටෙන්ඩර්පත් කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ පිහිටි ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ බටහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයේ වූ ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් 1970 ජනවාරි මස 18 දින පූර්වභාග 11 වන තෙක් භාරගනු ලැබේ.

2. කලුකර දිස්ත්‍රික් ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්‍රවල ටෙන්ඩර්පත් පිළියෙළ කොට අනුපිටපත්ද සහිතව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු අතර, අවශ්‍ය විස්තර ඔහුගෙන් ලබා ගත හැක. සැලැස්මද ඔහුගේ කාර්යාලයෙන් බලාගත හැකිය.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ 1969.10.1 දිනට පසු ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ වැඩ සඳහා රුපියල් තිස් තුන් දහසකට (33,000) නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1970 ජනවාරි මස 6 වැනි දින ප. ව. 1 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර්පත් එවීමට සුදුසුවනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාදවී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු නොගෙවන ප්‍රමාදවීමේ ගාස්තුවක්, නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබා ගත යුතුය.

4. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරුගේ, කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

5. ටෙන්ඩර්පත් ලබා ගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳවූ සියලු විස්තර අඩංගු කළ ආකෘති පත්‍ර නිකුත් කරන නිලධාරි තැනගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ 1, "ට්‍රාන්ස්වර්ක්ස්" මන්දිරයේ පිහිටි ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම දිසාපති කාර්යාලයක හෝ තැන්පත් කළ හැක.

ඇන්. පී. රාජන්,
බටහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු (ගොඩනැගිලි).

1969. 12. 9 වන දින,
කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ
ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ,
බ.කො.අ.ඉ. (ගො) කාර්යාලයේ දීය.

12–742/2—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

කලුතර දිස්ත්‍රික්කයේ "සී" ඒකකයේ රජයේ ගොඩනැගිලිවල නඩත්තු කිරීම් සහ සුළු වැඩිදියුණු කිරීම් සහ එකතු කිරීම් සඳහා වූ ටෙන්ඩරපත් කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ පිහිටි ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ බටහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයේ වූ ප්‍රාදේශිය ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් 1970 ජනවාරි මස 18 දින පූර්වභාග 11 වන තෙක් භාරගනු ලැබේ.

2. කලුතර දිස්ත්‍රික් ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්‍ර වල ටෙන්ඩර්පත් පිළියෙල කොට අනුපිටපත් ද සහිතව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු අතර, අවශ්‍ය විස්තර ඔහුගෙන් ලබා ගත හැක. සැලැස්මද ඔහුගේ කාර්යාලයෙන් බලාගත හැකිය.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ 1969.10.1 දිනට පසු ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ වැඩ සඳහා රුපියල් විසි හතර දහසකට (24,000) නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරු වරයා වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1970 ජනවාරි මස 6 වැනි දින ප. ව. 1 ට පෙර ඉදිරිපත් කළ විට ඒම් සඳහා ටෙන්ඩර්පත් එවීමට සුදුසුවනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාදවී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු නොගෙවන ප්‍රමාදවීමේ ගාස්තුවක්, නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබා ගත යුතුය.

4. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරුගේ, කොන්ත්‍රාත් කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

5. ටෙන්ඩර්පත් ලබා ගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳවූ සියලු විස්තර අඩංගු කළ ආකෘති පත්‍ර නිකුත් කරන නිලධාරි තැනගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ 1, "ට්‍රාන්ස්වර්ක්ස්" මන්දිරයේ පිහිටි ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ දී හෝ කොළඹින් පිටත ඕනෑම දිසාපති කාර්යාලයක හෝ තැන්පත් කළ හැක.

ඇන්. පී. රාජන්,
බටහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු (ගොඩනැගිලි).

1969. 12. 9 වන දින,
කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ
ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ,
බ.කො.අ.ඉ. (ගො) කාර්යාලයේ දීය.

12-7 2/3—69.12.19 දින අංක 14,885 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

කලුතර දිස්ත්‍රික්කයේ "ඩී" ඒකකයේ රජයේ ගොඩනැගිලි නඩත්තු කිරීම් සහ සුළු වැඩිදියුණු කිරීම් සහ එකතු කිරීම් සඳහා වූ ටෙන්ඩරපත් කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ පිහිටි ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ බටහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයේ වූ ප්‍රාදේශිය ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් 1970 ජනවාරි මස 18 දින පූර්වභාග 11 වන තෙක් භාරගනු ලැබේ.

2. කලුතර දිස්ත්‍රික් ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්‍ර වල ටෙන්ඩර්පත් පිළියෙල කොට අනුපිටපත් ද සහිතව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු අතර, අවශ්‍ය විස්තර ඔහුගෙන් ලබා ගත හැක. සැලැස්මද ඔහුගේ කාර්යාලයෙන් බලාගත හැකිය.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ 1969.10.1 දිනට පසු ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ වැඩ සඳහා රුපියල් විසි එක් දහසකට (රු. 21,000) නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරු වරයා වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1970 ජනවාරි මස 6 වැනි දින ප. ව. 1 ට පෙර ඉදිරිපත් කළ විට ඒම් සඳහා ටෙන්ඩර්පත් එවීමට සුදුසුවනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාදවී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු නොගෙවන ප්‍රමාදවීමේ ගාස්තුවක්, නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබා ගත යුතුය.

4. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරුගේ, කොන්ත්‍රාත් කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

